# 2021

# වාර්ෂික වාර්තාව

# ஆண்டறிக்கை

# ANNUAL REPORT




UCIARS

කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

கொழும்புப் பல்கலைக்கழக கமத்தொழில் தொழில்நுட்பவியல் மற்றும் கிராமிய விஞ்ஞானங்களுக்கான நிறுவனம்

University of Colombo Institute for Agro-Technology and Rural Sciences

# වාර්ෂික වාර්තාව

# 2021

## <u>අපගේ දැක්ම</u>

ශ්‍රී ලංකාවේ ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කරමින් ව්‍යවසායකත්ව කෘෂිකර්මය පෝෂණය කිරීම සඳහා කැප වූ ඉතා සුවිශේෂී විශිෂ්ඨ ආයතනයක් බවට පත් වීම

## අපගේ මෙහෙවර

අතිශයින්ම ඵලදායී වන පර්යේෂණ
තොරතුරු ජනනය කිරීම සහ
නිර්මාණශීලී ව්‍යවසායකත්වයක්
සඳහා වන උපායමාර්ගික,
සහභාගීත්ව සහ සාධනීය සමාජයක්
උදෙසා මනාව හැඩගැස්වූ සහ
ස්ථිරසාර වූ විශිෂ්ඨ අධ්‍යාපනික
ක්‍රමවේදයක් තිරසාර ස්වභාවික
සම්පත් කළමනාකරණයක් තුලින්
නිර්මාණය කිරීම.

## වැඩ බලන අධ්‍යක්ෂවරියගේ පණිවිඩය:



මෙම ආයතනය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2000 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කොට හම්බන්තොට වැලිගත්ත ප්‍රදේශයේ මාගම්පුර කෘෂි තාක්ෂණ හා ප්‍රජා සේවා මධ්‍යස්ථානය ලෙස ප්‍රථමයෙන් ස්ථාපනය කර ඇත. මෙම මධ්‍යස්ථානය 1998 වසර තරම් ඈතක දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර විශ්ව විද්‍යාල පර්යේෂකයන් මෙම කාලය පුරා ප්‍රජාව සමග සම්බන්ධව, ඔවුන්ට තාක්ෂණය සහ දැනුම ලබා දීම සහ කලාපයේ කෘෂිකර්මය හා කෘෂි කර්මාන්තයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා සහයෝගයෙන් කටයුතු කර ඇත.

මෙම මධ්‍යස්ථානය 2008 දී කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) ලෙස නම් කරන ලද අතර ශ්‍රී ලංකාවේ පුරෝගාමී ආයතනයක් ලෙස කෘෂිකාර්මික හා කෘෂි පාදක කර්මාන්තවල නියැලෙන්නන් මෙන්ම උසස් පෙළ සමත් වූ සිසුන් සඳහා කෘෂිකර්මාන්තය පදනම් කරගත් උපාධිය (කෘෂි තාක්ෂණවේදී උපාධිය) පිරිනැමීම සඳහා උසස් කරන ලදී. සියලුම පාඩම් අන්තර්ගතයන් මාර්ගගත ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ පවතින අතර දේශන සඳහා මිශ්‍ර ඉගෙනුම් ප්‍රවේශයන් යෙදීමෙන් ප්‍රායෝගික හා ක්ෂේත්‍ර චාරිකා සංරචක සඳහා ශිෂ්‍ය දායකත්වය සැලකිය යුතු ලෙස වැඩි වී තිබේ. අපගේ අධ්‍යයන වැඩසටහන් සැලසුම් කර ඇත්තේ ගැටළු විසඳීම, විශ්ලේෂණාත්මක කුසලතා මෙන්ම ලිවීමේ හා සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම සඳහා සිසුන් පුහුණු කිරීම සඳහා ය. එබැවින් ශ්‍රී ලංකාවේ අනෙකුත් රාජ්‍ය විශ්ව විද්‍යාල වලින් බිහිකරනු ලබන කෘෂිකාර්මික උපාධිධාරීන් හා සසඳන විට අපගේ සිසුන්ට වඩා හොඳ ප්‍රායෝගික දැනුමක් හා නිපුණතාවයක් ඇත.

ගොවිපල ඵලදායීතාව ඉහළ නැංවීමේ අරමුණින් කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය (UCIARS) මඟින් උසස් තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය ගොවි ප්‍රජාව වෙත සපය යි (එනම් උසස් තත්ත්වයේ පටක රෝපණය කළ කෙසෙල් පැල, දෙමුහුන් තුඹ කරිවිල පැල ආදිය). UCIARS හි තවත් වැදගත් සන්ධිස්ථානයක් වන්නේ ගොවි ප්‍රජාවේ ආදායම වැඩි දියුණු කිරීම මගින් දරිද්‍රතාවය තුරන් කිරීමේ රජයේ ප්‍රයත්නය ශක්තිමත් කිරීම සඳහා කෙසෙල්, අඹ සහ බිම්මල් වගාව ප්‍රවර්ධනය කිරීමේ තාක්ෂණික දායකත්වයයි. මෙම ආයතනයට අක්කර 40 ක බෝග හා පශු සම්පත් ආකෘති කිහිපයක් සහිත ගොවි බිම් ඇති අතර එමගින් සිසුන්ගේ ක්ෂේත්‍ර ප්‍රායෝගික හා සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ පර්යේෂණ සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දේ.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) අධ්‍යක්ෂ ලෙස ‘පළමුව ගුණාත්මකභාවය' යන ආදර්ශ පාඨය අනුගමනය කරමින් අප තැබූ සෑම පියවරකදී ම හිටපු අධ්‍යක්ෂ මහාචාර්ය එස්. සුදර්සන් මහතා (උපදේශක/අර්ධ කාලීන), අපගේ උපකුලපතිවරයා, කළමනාකරණ මණ්ඩලය සහ දැඩි කැපවීමෙන් වැඩ කළ කාර්යමණ්ඩලය විසින් ලබා දුන් විශිෂ්ඨ සහයෝගය සහ මාර්ගෝපදේශනය සිහිපත් කරමින් මගේ හෘදයාංගම කෘතඥතාව පුද කර සිටිමි. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ (UCIARS) අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා නන් අයුරින් සහයෝගය දැක්වූ සියළු දෙනා වෙත ද මගේ ස්තුතිය පිරිනම මි.

ආචාර්ය එන්.පී.විදානපතිරණ
වැඩ බලන අධ්‍යක්ෂ
කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

# පටුන


පිටු අංක

1. සමාලෝචනය

1.1 හැඳින්වීම 01
1.2 කළමනාකරණ මණ්ඩලය 02
1.3 ශාස්ත්‍රීය මණ්ඩලය 03
1.4 විගණන කමිටුව 03
1.5 සංවිධාන ව්‍යුහය 05

2. සමස්ත කාර්යසාධනය 06
2.1 අධ්‍යයන වැඩසටහනේ කාර්යසාධනය 08
2.2 පැළ තවාන්/ විද්‍යාගාර කාර්යසාධනය 17

3. පර්යේෂණ සහ නවෝත්පාදන 23

4. පුහුණු, වැඩමුළු සහ කාර්ය මණ්ඩල සංවර්ධනය 29

5. නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති 32

6. මූල්‍ය
6.1 මූල්‍ය ප්‍රගතිය 34

පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර
ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර
ව්‍යාපෘති වියදම් පිළිබඳ (දේශීය/විදේශීය අරමුදල් සපයන) විස්තර
මූල්‍ය ප්‍රගතිය (ඉපැයූ ආදායම) පිළිබඳ විස්තර
2021 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

6.2 ලෝක බැංකුව අරමුදල් සපයන ව්‍යාපෘති

7. තිරසර සංවර්ධනය මත පදනම් වූ අනාගත අපේක්ෂිත වාර්තාව 37

8. 2021 මූල්‍ය ප්‍රකාශන 40

**කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ අරමුණු සහ ඉලක්ක**

| අරමුණු | | ඉලක්කයන් | උපක්‍රමයන් |
|---|---|---|---|
| **අරමුණ 1** | **අත්‍යවශ්‍ය ගුණාංගයන්ගෙන් හෙබි උපාධිදාරීන් බිහි කිරීම ඉහළ නැංවීම** | • දැනට පවත්නා උපාධි පාඨමාලාව සහ නව උපාධි පාඨමාලා සඳහා බඳවා ගන්නා ප්‍රමාණය වාර්ෂිකව 10% කින් වැඩි කිරීම. | • පවතින උපාධිය සඳහා ද්විත්ව ඇතුළත් වීමේ ක්‍රමවේදය හඳුන්වා දීම |
| | | • තොරතුරු තාක්ෂණය (IT), ඉංග්‍රිසි, මෘදු කුසලතා (soft skills) සංවර්ධනය සඳහා වැඩි අවකාශයක් සහිතව (10%) විෂය මාලාව සංවර්ධනය කිරීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම. | • මෘදු කුසලතා වැඩි දියුණු කිරීමට සහාය වන විෂයයන් සමඟ විෂය මාලාව වැඩිදියුණු කිරීම |
| | | • ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම සහ ප්‍රතිඵල මූලික අධ්‍යාපනය සහ ඇගයීම ශක්තිමත් කිරීම. | • තාක්ෂණය හරහා විෂය මාලාව සහ දේශන බෙදාහැරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම |
| | | • ශිෂ්‍යයින් සහ උපාධිදාරීන් විසින් බිහි කරන කෘෂි ව්‍යාපාර ප්‍රමාණය වැඩි කිරීම. | • ව්‍යවසායකත්වය සහ කෘෂි ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ සිසුන්ගේ දැනුම වැඩි දියුණු කිරීම |
| | | • අධ්‍යයන සම්පත් සහ පුහුණු පහසුකම් වැඩි කිරීම. | • සිසුන්ගේ කුසලතා සහ ප්‍රායෝගික දැනුම වැඩිදියුණු කිරීම |
| **අරමුණ 2** | **වැඩි දියුණු කළ ව්‍යාපාරිකමය හවුල් සම්බන්ධතා සහ අන්තර්ජාතික සහයෝගීතාවය** | • පුහුණුව සහ පර්යේෂණ සහයෝගීතාව සඳහා කර්මාන්තය සමඟ අන්‍යෝන්‍ය වශයෙන් ශක්තිමත් සම්බන්ධතා ඇති කිරීම. | • විවිධ ආයතන අතර සම්බන්ධතා වැඩි දියුණු කිරීම |
| | | • කර්මාන්තයේ “චලනයන් සහ සොලවන්නන් (movers and shakers)” සහ ප්‍රාජේක්ෂ්‍ය ව්‍යවසායකයින් (promising entrepreneurs), ආරාධිත කාර්ය මණ්ඩලය ලෙස පත් කිරීම. | • නවෝත්පාදන පිළිබඳ නව තාක්ෂණයන් සහ දැනුම ලබා ගැනීම |
| | | • රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය (PPP) පිහිටුවීම | • ඒ සඳහා (PPP) පහසුකම් සහ අවස්ථා ලබා දීම |
| **අරමුණ 3** | **වැඩි දියුණු කළ ශාස්ත්‍රීය පැතිකඩ (academic profile) සහ පර්යේෂණ හා ව්‍යාප්තියේ බලපෑම** | • වර්ෂ 2024 වන විට කාර්ය මණ්ඩලයෙන් 80% සඳහා පශ්චාත් උපාධි පුහුණුව ලබා දීම. | • පහසුකම් වැඩි දියුණු කිරීම සහ පශ්චාත් උපාධි අධ්‍යයන සඳහා උනන්දුවක් ඇති |
| | | • වර්ෂ 2022 වන විට නව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා, 50% දක්වා ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම. | • ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්වීම් ප්‍රතිශතය වැඩි කිරීම |
| | | • කලාපීය කේන්ද්‍රීයකරණයක් සහිත ඉහළ බලපෑම් පර්යේෂණ සිදු කිරීම සහ සුවිගත කරන ලද (indexed journals) සඟරා වල එකී සොයා ගැනීම් ප්‍රකාශයට පත් කිරීම. | • උසස් පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා පහසුකම් පුළුල් කිරීම සහ ජාල ගොඩනැගීම |

| | | | |
|---|---|---|---|
| | | • පර්යේෂණ සොයා ගැනීම් වාණිජකරණය කිරීම සහ තාක්ෂණ හුවමාරුව සඳහා පහසුකම් සැපයීම. | • නව තාක්ෂණය පිළිබඳ විශේෂිත දැනුම වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීතා සහ සම්බන්ධ වැඩසටහන් ආරම්භ කිරීම |
| | | • තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හරහා ප්‍රජාවට නව තාක්ෂණ හා තොරතුරු සේවා සැපයීම. | • ප්‍රජාව සමඟ යහපත් සන්නිවේදන සබඳතාවයන් ගොඩනැංවීමට හැකි වන පරිදි තාක්ෂණය වැඩිදියුණු කිරීම |
| **අරමුණ 4** | **වැඩි දියුණු කළ යටිතල පහසුකම් හා පහසුකම්** | • අධ්‍යයන යටිතල පහසුකම් වාර්ෂිකව 20% කින් වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම. | • නව තාක්ෂණය හරහා අධ්‍යයන පහසුකම් වැඩිදියුණු කිරීම<br>• කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම |
| | | • වාර්ෂිකව පර්යේෂණ පහසුකම් 20% කින් වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම. | • පහසුකම් වැඩි දියුණු කිරීම සහ පර්යේෂණ කටයුතු සඳහා උනන්දුවක් ඇති |
| | | • **2024** වන විට නවාතැන් පහසුකම් **50%** කින් වැඩි කිරීම. | • නවාතැන් පහසුකම් පුළුල් කිරීම |
| | | • හරිත අවකාශය/ හරිත තාක්ෂණය | • හරිත පරිසරය වැඩිදියුණු කිරීම |
| **අරමුණ 5** | **වැඩිදියුණු කළ පාලනය සහ මූල්‍ය කළමනාකරණය සහ විනය** | • අධ්‍යයන, පරිපාලන හා තාක්ෂණික කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය වර්ධනය | • අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිපුණතා සහ ඵලදායී කළමනාකරණ පද්ධතිය ශක්තිමත් කිරීම<br>• සේවා උසස්වීම් සඳහා |
| | | • 2025 වර්ෂය වන විට පූර්ණ පරිගණකගත ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වා දීම | • සම්පූර්ණ පරිගණකගත ඒකාබද්ධ කළමණාකරණ තොරතුරු පද්ධතිය සමඟ සියලුම අංශ සම්බන්ධ කිරීම |
| | | • වාර්ෂිකව 10% කින් විගණන විමසුම් අඩු කිරීම සහ වගවීම වැඩි කිරීම. | • පරිපාලන රෙගුලාසි, මූල්‍ය රෙගුලාසි, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සහ ප්‍රාග්ධන කටයුතු පිළිබඳ සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම. |
| | | • සකසුරුවම්කම, කාර්යක්ෂමතාව සහ සඵලදායීතාවය වැඩි දියුණු කිරීම (**3Es)** | • සම්පත් (භෞතික, මානව සහ මූල්‍ය) බෙදාගැනීම, බාහිරින් ලබා ගැනීම සහ තාර්කිකකරණය . |
| | | • පුහුණුව, උපදෙස්, උපදේශන, තොරතුරු සේවා, පේටන්ට් බලපත්‍ර, බලපත්‍ර, ප්‍රභූ රෝපණ ද්‍රව්‍ය විකිණීම සහ ගොවිපල හරහා ශුද්ධ ආදායම වැඩි කිරීම | • ආදායම් උත්පාදන කටයුතු හරහා ශුද්ධ ආදායම වැඩි කිරීම |

## 1. සමාලෝචනය

### 1.1 හැඳින්වීම

මෙම ආයතනය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2000 වර්ෂයේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ කොට හම්බන්තොට වැලිගත්ත ප්‍රදේශයේ මාගම්පුර කෘෂි තාක්ෂණ හා ප්‍රජා සේවා මධ්‍යස්ථානය ලෙස ප්‍රථමයෙන් ස්ථාපනය කර ඇත. මෙම මධ්‍යස්ථානය 1998 වසර තරම් ඈතක දිගු ඉතිහාසයකට හිමිකම් කියන අතර විශ්ව විද්‍යාල පර්යේෂකයන් මෙම කාලය පුරා ප්‍රජාව සමග සම්බන්ධව, ඔවුන්ට තාක්ෂණය සහ දැනුම ලබා දීම සහ කලාපයේ කෘෂි කර්මය හා කෘෂි කර්මාන්තයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා සහයෝගයෙන් කටයුතු කර ඇත. මෙම ආයතනයේ නිර්මාතෘ වන්නේ කොළඹ විශ්ව විද්‍යාලයේ හිටපු උපකුලපතිනි සහ හිටපු විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිනී වන මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මැතිණිය යි.

1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ 24 'අ' වගන්තිය සහ 2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන **නියමාවලිය** යටතේ කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ස්ථාපිත කරන ලදී. මෙම **නියමාවලිය** 2008 අගෝස්තු මස 23 වැනි දින සිට බලාත්මක වන්නේය.

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය, කෘෂි තාක්ෂණික උපාධිය පාඨමාලාව පිරිනමනු ලබයි. කොළඹ විශ්ව විද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන මෙම පාඨමාලාව ගොවි ප්‍රජාව තුළ අධ්‍යයන පරිසරයක් නිර්මාණය කිරීමේ ප්‍රධාන බාධා වන වයස, ඉඩ ප්‍රස්ථාව, කාලය සහ අධ්‍යයන **පරිසරය යන සාධක** මහ හරවමින් සාර්ථකව දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය යටතේ ඉහත කී අධ්‍යාපන අවස්ථාවන් ලබා දීමට කටයුතු කර ඇත. මෙම ආයතනය කෘෂි තාක්ෂණය හා ග්‍රාමීය විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලබාදීම තුළින්, වර්තමානයේ කෘෂි තාක්ෂණය සහ කෘෂි කර්මාන්තය පිළිබඳ ව ප්‍රජාව අතර ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම සිදුකර ඇත. එය ගොවි ප්‍රජාවගේ උසස් අධ්‍යාපනයට දොරටු විවෘත කිරීමේ සිහිනය සැබෑ කරමින් ඔවුන්ගේ නිවසටම දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේදය ඔස්සේ අධ්‍යාපනය ගෙන යමින් පුද්ගල වෙනස්කම් සිදු කිරීමට හා සමාජීය අවශ්‍යතා ඉටු කිරීමට සමත් වන්නේය. නමුත් ඔවුන්ගේ උසස් අධ්‍යාපනයට ඇති කැමැත්ත හෝ බලාපොරොත්තුව ඔවුන්ගේ පෞද්ගලික, ආර්ථික හෝ පවුල් පසුබිම හේතුවෙන් ගිලිහී යන අවස්ථාවන් දක්නට ඇත. මෙම ආයතනය ක්‍රියාත්මක කරන පාඨමාලා තෝරා ගැනීමට හා ඒවාට ප්‍රවේශ වීමේ නම්‍යශීලීත්වය නිසා දුප්පත් ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ වැඩිදුර අධ්‍යාපනය ලබන්නන්ට, නවීන තොරතුරු සන්නිවේදන තාක්ෂණය භාවිත කරමින් ඔවුන්ගේ අධ්‍යාපන යථාර්තය හා වෘත්තීය සමාජ අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා සුදුසු තෝතැන්නක් බවට පත්කර ඇත.

එපමණක් නොව මෙම ආයතනය විවිධ වැඩසටහන්වලට අමතරව ඉතාමත් සාධාරණ මිලකට දේශීය ගොවි ප්‍රජාවට පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදන ලබා දීමට කටයුතු කරමින් ආයතනයේ ආදායම් උත්පාදනය කිරීමට ද සමත් වී ඇත. මෙම ආයතනය දිවයින පුරා විසිරී සිටින ග්‍රාමීය ගොවි ජනතාවට පටක රෝපණ කෙසෙල් **පැළ නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය** සමබන්ධයෙන් දැනුවත් කිරීම සඳහා වැඩමුළු සහ සම්මන්ත්‍රණ විශාල ප්‍රමාණයක් පවත්වා ඇත. එසේම ග්‍රාමීය විද්‍යාවන්ට සම්බන්ධ නව තාක්ෂණය ගැන ගොවි ජනතාව දැනුවත් කිරීම සඳහා එම සම්පත් භාවිත කරමින් විවිධ ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා සහභාගී වී ඇත.

## 1.2 කළමනාකරණ මණ්ඩලය

2008 අංක 02 දරණ කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 05 වන වගන්තිය ප්‍රකාරව කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය තම කළමනාකරණ මණ්ඩලය පිහිටුවා ඇති අතර උක්ත නියමාවලියේ 10 වගන්තිය ප්‍රකාරව එකී කළමනාකරණ මණ්ඩලය, ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය වන අතර එය පහත සාමාජිකයින්ගෙන් සමන්විත වේ.

**වගු අංක 01: 2021 වර්ෂයේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය**

| | | |
|---|---|---|
| **නිල බලයෙන් පත්වූ සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)** | | |
| 1 | අධ්‍යක්ෂ- සභාපති | මහාචාර්ය එස්.සුදර්සන්<br>අධ්‍යක්ෂ (2021.08.07 දක්වා )<br><br>ආචාර්ය එන්.පී.විදානපතිරණ මහත්මිය<br>වැඩ බලන අධ්‍යක්ෂ (2021.08.08 සිට) |
| 2 | නියෝජ්‍ය අධ්‍යක්ෂ | නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක් අනුමත කර නොමැත |
| 3 | උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් හෝ විෂයභාර ලේකම් හෝ එකී අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන විෂය සම්බන්ධයෙන් නම් කරන ලද සාමාජිකයෙකු | ටී.කේ.ඩබ්.ටී.පී.ප්‍රේමරත්න මහත්මිය<br>සහකාර අධ්‍යක්ෂ (ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය),<br>අධ්‍යාපන අමාත්‍යාංශය |
| 4 | කෘෂිකර්ම විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යාංශ ලේකම් හෝ එකී අමාත්‍යාංශය විසින් නම් කරන ලද සාමාජිකයෙකු | ආචාර්‍ය එස්.එච්.එස්.ඒ. දි සිල්වා<br>අතිරේක ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 5 | විද්‍යා පීඨයේ පීඨාධිපති/ කොළඹ විශ්ව | මහාචාර්ය සී.යූ.ජේ. සොන්නාදර |
| **අනිකුත් සාමාජිකයින් (නියමාවලියේ දක්වා ඇති පරිදි)** | | |
| 1 | කෘෂි ව්‍යාපාර කර්මාන්ත හා කෘෂි තාක්ෂණය නියෝජනය කිරීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන සාමාජිකයින් දෙදෙනෙක් | මහාචාර්ය එම්.පී.එස්. මාගමගේ<br>කෘෂි පීඨය, සබරගමුව විශ්ව විද්‍යාලය<br>සභාපති, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය |
| | | නිරන්ජන් කෝලිත ද සිල්වා මහතා<br>නීතීඥ |
| 2 | පාලක සභාවේ සාමාජිකයින් අතරින් පත් කරගන්නා සාමාජිකයින් දෙදෙනෙක් | මහාචාර්ය එස්. කරුණාරත්න |
| | | මහින්ද මඩිහහේවා මහතා |
| 3 | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් හෝ ඔහු විසින් නම් කරන ලද සාමාජිකයෙකු | එච්.පී. සුමනසේකර මහතා |
| 4 | ශාස්ත්‍රීය මණ්ඩලයේ සාමාජිකයන් අතරින් පත්කර ගන්නා සාමාජිකයෙකු | ආචාර්ය එස්.එච්.එස්.ඒ. දි සිල්වා |
| **ලේකම්** | | |
| | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය |

අධ්‍යයන හා පරිපාලන කටයුතු සමාලෝචනය කිරීම සඳහා ආයතනයේ කළමනාකාරීත්ව මණ්ඩලය වර්ෂය තුළ නිතිපතා රැස්විය. 2021 වර්ෂය තුළ කළමනාකරණ මණ්ඩලය දොලොස් (12) වතාවක් රැස්වී ඇත.

## 1.3 ශාස්ත්‍රීය මණ්ඩලය

ආයතනයේ අධ්‍යයන කටයුතු පිළිබඳව සොයා බැලීම සඳහා සහ කළමනාකරණ මණ්ඩලයට නිර්දේශ කිරීම සඳහා 2021 දී ආයතනය සඳහා ශාස්ත්‍රීය මණ්ඩලයක් පිහිටුවන ලදී. කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2008 අංක 02 දරණ නියමාවලියේ 13 (1) වගන්තියට අනුව, ශාස්ත්‍රීය මණ්ඩලයේ සාමාජික සංයුතිය පහත පරිදි වේ;

**වගු අංක 02 : 2021 වර්ෂයේ ශාස්ත්‍රීය මණ්ඩලයේ සංයුතිය**

| | | |
|---|---|---|
| 1 | අධ්‍යක්ෂ - සභාපති | මහාචාර්ය එස්.සුදර්සන්<br>අධ්‍යක්ෂ (2021.08.07 දක්වා )<br><br>ආචාර්ය එන්.පී.විදානපතිරණ මහත්මිය<br>වැඩ බලන අධ්‍යක්ෂ (2021.08.08 සිට) |
| 2 | අධ්‍යයන දෙපාර්තමේන්තු වල ප්‍රධානීන් | ආචාර්ය එන්.පී.විදානපතිරණ මහත්මිය<br>කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශයේ අංශ පධාන |
| 3 | කෘෂිකර්ම හා වාරිමාර්ග අමාත්‍යාංශ වල අදාළ ලේකම්වරුන් විසින් නම් කරන ලද එකී අමාත්‍යාංශ නියෝජනය කරන නිලධාරීන් දෙදෙනකු | ආචාර්ය එස්.එච්.එස්.ඒ. දි සිල්වා<br>අතිරේක ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>ඉංජි. පී.ඒ.ඒ.පී.කේ. පන්නල මහත්මිය<br>අතිරේක ලේකම්, වාරිමාර්ග අමාත්‍යාංශය<br>ජල සම්පත් සැලසුම් කිරීම හා සංවර්ධනය |
| 4 | එක් එක් අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් නම් කරන ලද සාමාජිකයෙකු | ආචාර්ය එස්.එස්.වීරසිංහ මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය |
| 5 | එක් එක් අධ්‍යයන පාඨමාලාවේ සම්බන්ධීකාරකවරුන් | - |
| 6 | එක් එක් අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු, මහාචාර්යවරු සහ ආශ්‍රිත මහාචාර්යවරු | - |
| 7 | ඉගැන්වීමේ නියැලී සිටින ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලය අතරින් තේරී පත් වූ සාමාජිකයින් දෙදෙනෙකු, ඉහත (6) තුළට අයත් නොවන සාමාජිකයන් | එල්.එම්. රිෆ්නාස් මහතා, කථිකාචාර්ය (පරිවාස)<br>කේ.ජී.කැටිපෙආරච්චි, කථිකාචාර්ය (පරිවාස) |
| **ලේකම්** | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | | එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය |

අධ්‍යයන කටයුතු සමාලෝචනය කිරීම සඳහා ආයතනයේ ශාස්ත්‍රීය මණ්ඩලය පිහිටුවීමෙන් පසු වර්ෂය තුළ නිතිපතා රැස් විය. ශාස්ත්‍රීය මණ්ඩලය 2021 වර්ෂය තුළ අට (8) වාරයක් රැස්වී ඇත.

## 1.4 විගණන කමිටුව

ආයතනයේ විගණන කමිටුව යනු අභ්‍යන්තර විගණන වාර්තා සහ බාහිර (රජයේ) විගණන වාර්තාවල කරුණු සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයට සහාය වන අනු කමිටුවකි. විගණන කමිටුවේ සභාපතිත්වය දරනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලයේ නම් කරන ලද සාමාජිකයෙකු විසිනි. අධ්‍යක්ෂ, කෘෂි තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, සහකාර මූල්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ සහකාර

ලේඛකාධිකාරී කමිටුවේ ආරාධිතයන් වන අතර රැස්වීමේ කැඳවුම්කරු වන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන ශාඛාවේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයාය. විගණන කමිටුවේ රැස්වීම් සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්ට සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අභ්‍යන්තර විගණකවරයාට ආරාධනා කෙරේ.

ආයතනයේ විගණන කමිටුව සෑම වර්ෂයකම කාර්තුමය වශයෙන් රැස් වේ.2021 වර්ෂය තුල විගණන කමිටුව හතර (04) වරක් රැස් වී ඇත.

2021 වර්ෂය තුල විගණන කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

**වගු අංක 03: 2021 වර්ෂය තුල විගණන කමිටුවේ සංයුතිය**

| | | |
|---|---|---|
| 1 | සභාපති/කළමණාකරණ මණ්ඩලයේ නාමික | එන්.කේ.ද සිල්වා මහතා, නීතීඥ |
| 2 | කළමනාකරණ මණ්ඩලයේ නාමික අනෙකුත් සාමාජිකයින් | ආචාර්ය එස්.එච්.එස්.ඒ. දි සිල්වා<br>අතිරේක ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>මහාචාර්ය ඩී.යූ.ජේ. සොන්නාදර<br>විද්‍යා පීඨයේ පීඨාධිපති/ කොළඹ විශ්ව විද්‍යාලය |
| 3 | භාණ්ඩාගාර නියෝජිත | ප්‍රධාන ගණකාධිකාරී, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/<br>හම්බන්තොට |
| 4 | විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිත | කේ.වී.ටී.එන්.සිංහසෝම මහත්මිය<br>විගණන අධිකාරී, රජයේ විගණන අංශය, කොළඹ විශ්වවිද්‍යාලය |
| 5 | විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිත | ජානක බෝගමුව මහතා<br>අභ්‍යන්තර විගණක/විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |
| 7 | කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ නියෝජිතයන් | මහාචාර්ය එස්.සුදර්සන්<br>අධ්‍යක්ෂ (2021.08.07 දක්වා)<br><br>ආචාර්ය එන්.පී.විදානපතිරණ මහත්මිය<br>වැඩ බලන අධ්‍යක්ෂ (2021.08.08 සිට)<br>අංශ ප්‍රධාන/කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය<br><br>ඒ.ඩී.පී.ද සොයිසා මහත්මිය/කේ.සුනිල්<br>සහකාර මූල්‍යාධිකාරී/UCIARS<br><br>එස්.ඒ.එස්. ප්‍රියදර්ශනී මහත්මිය<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |
| 8 | **විගණන කමිටුවේ ලේකම්** | කේ.ඊ්.ඩබ්ලිව් ජයසිරී මහතා/එස්.පී.ජී.නිහාල්<br>ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක, කොළඹ විශ්වවිද්‍යාලය |

**1.5 සංවිධාන ව්‍යූහය**




ප්‍රවාහ සටහන් 1 - සංවිධාන ව්‍යූහය

2. **සමස්ථ කාර්යසාධනය**

ආයතනයේ ප්‍රමුඛ කාර්යභාරය වනුයේ කෘෂි තාක්ෂණික අධ්‍යයන පාඨමාලාව ක්‍රියාත්මක කිරීම, පටක රෝපණ කෙසෙල් පැළ, කෝමාරිකා පැළ, කහ පැළ නිෂ්පාදනය සහ අනෙකුත් ගොවිපොළ නිෂ්පාදන වල නිරත වීමයි.

2021 වර්ෂය තුළ දී ආයතනයේ කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය හරහා අධ්‍යයන ක්‍රියාකාරකම් ද පැළ තවාන් හා විද්‍යාගාර භාවිතයෙන් පටක රෝපිත පැළ නිෂ්පාදනය ද සිදුකරන ලදී.

67 දෙනකුගෙන් යුතු කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව ආයතනය සිය ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට කටයුතු කරන ලදී. කාර්ය මණ්ඩලයෙන් 3% ක් පරිපාලන, 13.4% ක් අධ්‍යයන/අධ්‍යයන සහායක (ස්ථිර), 13.4% ක් අධ්‍යයන (පැවරුම්/තාවකාලික) සහ 70.1% ක් අනධ්‍යයන (ස්ථිර/පැවරුම්) කාර්යමණ්ඩලයෙන් සමන්විත වේ (වගු අංක 04 සහ රූප සටහන අංක 01). 2021.12.31 දිනට ආයතනයේ අනුමත තනතුරු සහ දැනට පවතින තනතුරු සංඛ්‍යාව පිළිබඳව වගු අංක 05 විස්තර කරයි.

**වගු අංක 04 : 2021 වර්ෂයේ ආයතනයේ කායීය මණ්ඩලය**

| **කායීය මණ්ඩල වර්ගීකරණය** | **සේවක සංඛ්‍යාව** |
|---|---|
| පරිපාලන | 2 |
| අධ්‍යයන/අධ්‍යයන සහායක (ස්ථිර) | 9 |
| අධ්‍යයන (පැවරුම්/තාවකාලික) | 9 |
| අනධ්‍යයන | 47 |
| **මුළු කාර්ය මණ්ඩලය** | **67** |




**රූප සටහන 01 : 2021 වර්ෂයේ ආයතනයේ කායීය මණ්ඩලය**

වගු අංක **05 : 202.12.31** දිනට ආයතනයේ අනුමත තනතුරු සහ දැනට පවතින තනතුරු සංඛ්‍යාව

| තනතුරු නාමය | | සේවා ගණය | ශ්‍රේණිය | වැටුප් කේතය | සේවා මට්ටම | ක.සේ.දෙපා.අනුමත තනතුරු සංඛ්‍යාව | | | දැනට පවතින තනතුරු සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | ස්ථිර | කොන්ත්‍රාත් | අතිරේක | ස්ථිර | කොන්ත්‍රාත් | අතිරේක | පැවරුම් |
| 1 | අධ්‍යක්ෂ | අධ්‍යයන | | U-AC 5 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | | | 1 | | | |
| 2 | මහාචාර්ය | අධ්‍යයන | | U-AC 5 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 8 | | | 0 | | | |
| 3 | ආශ්‍රිත මහාචාර්ය | අධ්‍යයන | | U-AC 4 | ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | 0 | | | |
| 4 | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/කථිකාචාර්ය/කථිකාචාර්ය (පරිවාස) | අධ්‍යයන | | U-AC 3 | ජ්‍යෙෂ්ඨ මට්ටම | | | | 8 | | | |
| 5 | විද්‍යාත්මක සහකාර | අධ්‍යයන සහායක | | U-AS 1 | තෙවන මට්ටම | 1 | | | 1 | | | |
| 6 | තාවකාලික ශිල්ප ප්‍රදර්ශක | කොන්ත්‍රාත් | | U-AC 1 (ස්ථාවර) | තෙවන මට්ටම | | 4 | | | 4 | | |
| 7 | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | UA & FS | II/I | U-EX 2 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | | | 1 | | | |
| 8 | සහකාර මූල්‍යාධිකාරී | UA & FS | II/I | U-EX 1 | තෙවන මට්ටම | 1 | | | 1 | | | |
| 9 | ගොවිපොළ කළමනාකරු | Dept. | II/I | U-EX 1 | තෙවන මට්ටම | 1 | | | 0 | | | |
| 10 | උප නේවාසිකාගාර පරිපාලක | Dept. | III/II/I | U-MN 3 | දෙවන මට්ටම | 1 | | | 1 | | | |
| 11 | තාක්ෂණික නිලධාරී (තොරතුරු තාක්ෂණය) | UTS | III/II/I | U-MT 1 | දෙවන මට්ටම | 1 | | | 0 | | | |
| 12 | තාක්ෂණික නිලධාරී | UTS | III/II/I | U-MT 1 | දෙවන මට්ටම | 2 | | | 0 | | | |
| 13 | ක්ෂේත්‍ර පරිපාලක | | III/II/I | U-MT 1 | දෙවන මට්ටම | 1 | | | 1 | | | |
| 14 | කළමනාකරණ සහකාර | UMAS | III/II/I | U-MN 1 | දෙවන මට්ටම | 8 | | | 5 | | | |
| 15 | කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) | UMAS | III/II/I | U-MN 1 | දෙවන මට්ටම | 2 | | | 1 | | | |
| 16 | කළමනාකරණ සහකාර (පොත් තැබීම්) | UMAS | III/II/I | U-MN 1 | දෙවන මට්ටම | 1 | | | 0 | | | |
| 18 | රියදුරු | UDS | III/II/I/Spl | U-PL 3 | ප්‍රාථමික මට්ටම | 2 | | | 2 | | | |
| 19 | විදුලි කාර්මික | Dept. | III/II/I/Spl | U-PL 3 | ප්‍රාථමික මට්ටම | 1 | | | 0 | | | |
| 20 | විද්‍යාත්මක සහකාර | Dept. | III/II/I/Spl | U-PL 2 | ප්‍රාථමික මට්ටම | 26 | | | 21 | | | |
| 21 | ට්‍රැක්ටර් ක්‍රියාකරු | Dept. | III/II/I/Spl | U-PL 2 | ප්‍රාථමික මට්ටම | 1 | | | 0 | | | |
| 22 | පැළ තවාන්කරු | Dept. | III/II/I/Spl | U-PL 1 | ප්‍රාථමික මට්ටම | 2 | | | 0 | | | |
| 23 | වැඩ සහායක | UWAS | III/II/I/Spl | U-PL 1 | ප්‍රාථමික මට්ටම | 19 | | | 15 | | | |

| ** | පැවරුම් පදනම මත දැනට සිටින සේවකයින් (අනුමත තනතුරු නොමැතිව) | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පාඨමාලා සම්බන්ධීකාරක | | | | | | | | | | | 5 |
| | පරිගණක ක්‍රියාකරු සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාර කාර්මික | | | | | | | | | | | 1 |
| එකතුව | | | | | | **80** | **4** | **0** | **57** | **4** | **0** | **6** |

වගු අංක **06 : 2021.12.31** දිනට ආයතනයේ පරිපාලන කාර්ය මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය එන්.පී.විදානපතිරණ | වැඩ බලන අධ්‍යක්ෂ (2021.08.08 සිට) |
| 2 | එස්.ඒ.එස් . ප්‍රියදර්ශනී මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී |
| 3 | ඒ.ඩී.පී.ද සොයිසා | සහකාර මූල්‍යාධිකාරී |

වගු අංක **07 : 2021.12.31** දිනට ආයතනයේ පරිපාලන/මූල්‍ය අංශ වල අනධ්‍යයන කාර්ය මණ්ඩලය (පරිපාලන/මූල්‍ය සහායක)

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | කේ.ජී.එම්.සමරවික්‍රම | උප ශාලාධිපති (පූර්ණ කාලීන) |
| 2 | ඩබ්.කේ.කේ රාජිකා නිලංගනී මහත්මිය | කළමනාකරණ සහකාර ශ්‍රේණිය lll |
| 3 | ආර්.වී.පී.එන්.පී. කුමාර මහතා | කළමනාකරණ සහකාර ශ්‍රේණිය lll |
| 4 | ආර්.ඒ.එම්.දිල්හාරි | විද්‍යාගාර සහයක ශ්‍රේණිය lll |
| 5 | යූ.එම්.ඒ.ඒ.එම්. ද සිල්වා මහත්මිය | කළමනාකරණ සහකාර ශ්‍රේණිය lll |
| 6 | ජේ.ඒ.යූ.එස්. ජයවර්ධන මහතා | කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) |
| 7 | එම්.ජී.ජේ.පී.එස්. සඳරුවන් මහතා | වැඩ සහායක ශ්‍රේණිය lll |
| 8 | කේ.ඩී.සී. ආරියසේන මහත්මිය | පරිගණක යෙදවුම් සහකාර |
| 9 | ඩබ්.එච්.යූ. කෙෞෂල්‍යා | විද්‍යාගාර සහයක ශ්‍රේණිය lll |
| 10 | පී.බී.දර්ශන මහතා | වැඩ සහායක ශ්‍රේණිය lll |
| 11 | කේ.එස්.ආර්.සම්පත් මහතා | වැඩ සහායක ශ්‍රේණිය lll |
| 12 | ඩබ්.එම්.චමින්ද මහතා | වැඩ සහායක ශ්‍රේණිය lll |
| 13 | බී.ජී.එස්.කුමාර මහතා | විද්‍යාගාර සහයක ශ්‍රේණිය lll |
| 14 | එස්.වී.උපාලි මහතා | රියදුරු ශ්‍රේණිය ll |
| 15 | ඩබ්.ඩබ්.කේ.ප්‍රියංකර මහතා | රියදුරු ශ්‍රේණිය ll |

## 2.1 අධ්‍යයන වැඩසටහනේ කාර්යසාධනය

2008 වසරේ දී කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය මගින් අධ්‍යයන පාඨමාලා හඳුන්වා දුන් අතර එමගින් දැනට කෘෂි කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයන් හට කෘෂි තාක්ෂණය හා ග්‍රාමීය විද්‍යාවන් යනාදී ක්ෂේත්‍රයන් ඔස්සේ උසස් අධ්‍යාපනය ලබාදීමටත් ඔවුන් අතර මෙම අධ්‍යයන පාඨමාලා ප්‍රචලිත කිරීමට හා සංවර්ධනය කිරීමටත් අවස්ථාව ලැබී ඇත. කිසිවිටෙකත් උසස් අධ්‍යාපන මංපෙත් විවර නොවූ ගොවි ප්‍රජාව වෙත අධ්‍යාපනය, "මිශ්‍ර ක්‍රමවේදයක්" හරහා ලබාදීම මගින් පුද්ගල සහ සමාජයීය වශයෙන් ඔවුන්ගේ වෙනසක් සිදු කිරීමට හැකි වන්නේය. උසස් අධ්‍යාපනය ලබා ගැනීමට /හැදෑරීමට අවස්ථා සහ

විභවයන් ඔවුන් සතු වුව ද ඔවුන්ගේ පෞද්ගලික හෝ පවුල් පසුබිම මත හෝ ආර්ථිකමය වශයෙන් පැන නැගුණ ගැටළු හේතුවෙන් එම අවස්ථා අහිමි වූ පිරිසක් මෙම අධ්‍යයන කටයුතුවල නිරත වේ. අධ්‍යයන පාඨමාලාවට ඇතුළත් වීම සඳහා වන ඇතුළත්වීමේ සුදුසුකම්වල සහ පාඨමාලා තෝරාගැනීමේදී දක්වන නම්‍යශීලීභාවය හදාරන්නන් හට ඉමහත් පහසුවක් වන අතර ආයතනය මගින් කරනු ලබන මගපෙන්වීම; නවීන තොරතුරු තාක්ෂණය හරහා ග්‍රාමීය ගොවි ප්‍රජාව හට ලබාදෙන මෙම උසස් අධ්‍යාපනයේ ඉහළ ගුණාත්මයට මෙන්ම අධ්‍යයන පාඨමාලා ඉතා පහසුවෙන් හැදෑරීමට හැකිවන පරිදි ඒවායෙහි ක්‍රමානුකූල බව පවත්වාගනිමින් ඊට අවකාශය සැළසීම ද ඔවුන්ගේ අධ්‍යයන, වෘත්තීමය සහ සමාජයීය අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීමට ඉමහත් රුකුලකි.

කෘෂිකාර්මික ව්‍යවසායකයින් සඳහා මෙය නවමු අධ්‍යාපනික අවස්ථාවක් වන අතර, ශ්‍රී ලංකාව තුළ දේශීය භාෂා මාධ්‍යයෙන් ග්‍රාමීය ගොවි ප්‍රජාවගේ දැනුම ඉහළ නැංවීම සඳහා ඔවුන්ට උදා වූ පළමු අවස්ථාව ද වේ. ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව වැඩි වශයෙන් ග්‍රාමීය ප්‍රදේශයන් තුළ ඒකරාශි වී සිටින අතර, කෘෂිකර්මය සඳහා ඔවුන් ලබා දෙන දායකත්වය ඉතා ඉහළය. එහෙත් ග්‍රාමීය ගොවි ප්‍රජාවට සිය අධ්‍යාපනික, පුද්ගල සහ වෘත්තීමය සංවර්ධනය සඳහා ලැබෙන පහසුකම් ඉතා අඩුය. මේ නිසා, පළමු වරට, කොළඹ විශ්ව විද්‍යාලයට අනුබද්ධ වැලිගත්ත කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් (UCIARS) දැනට කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රැඳී සිටින ගොවීන් සඳහා කෘෂි තාක්ෂණික උපාධිය පිරිනමා තිබේ. මෙම වැඩසටහනේ සුවිශේෂී ලක්ෂණය වන්නේ ශ්‍රී ලංකාවට නැවුම් අත්දැකීමක් වන මාර්ග ගත හා විද්‍යුත් දුරස්ථ ඉගෙනුම් ක්‍රමය ඔස්සේ (online and distance e-learning method) මෙම අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක කිරීමයි.

**අධ්‍යයන පාඨමාලාවේ අරමුණු**

1. මිශ්‍ර ඉගැන්වීම් ක්‍රම වේදයක් ඔස්සේ (විශේෂිත වූ) යාවජීව අධ්‍යාපනය, නම්‍යශීලීබව සහ ශිෂ්‍ය කේන්ද්‍ර ඉගෙනුම් ක්‍රමවේදය යනාදී මූලධර්ම මත පිහිටමින් ගොවි ප්‍රජාවට පුළුල් ප්‍රවේශයක් ලබාදෙමින් උසස් අධ්‍යාපනය (ප්‍රජාතාන්ත්‍රීකරණය කිරීම) සෑම පුරවැසියකුටම ලබාදීමේ අයිතිවාසිකම සනාථ කිරීම.

2. ගොවි ප්‍රජාව/කෘෂි කර්මාන්තයේ නියැලෙන්නන් දැනුම මත පදනම් වූ කෘෂි කර්මාන්තයේ යෙදවීම තුළින් කෘෂි නිෂ්පාදනවල ගුණාත්මය සහ ප්‍රමාණාත්මය වැඩි කිරීම.

**වැඩසටහනේ සුවිශේෂී ලක්ෂණ**

- කිසිදිනෙක උසස් අධ්‍යාපන සිහිනය සැබෑ නොවූ ගොවි ජනතාව වෙත අන්තර්ජාලය ඔස්සේ අධ්‍යාපනය ලබාදීම මගින් පුද්ගල සහ සමාජයීය වශයෙන් ඔවුන්ගේ වෙනසක් ඇති කිරීම.
- කෘෂි කර්මාන්තයේ නියැලෙන අතරතුර උසස් අධ්‍යාපනය හැදෑරීමේ අවස්ථාව/වරම් ගොවි ප්‍රජාවට හිමි වීම.
- නව කෘෂි තාක්ෂණයන් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලාංකීය ගොවි ප්‍රජාව වෙත හඳුන්වාදීම.
- ශ්‍රී ලාංකීක ගොවි ප්‍රජාව වෙනුවෙන් සැකසුණ ප්‍රථම විශ්ව විද්‍යාලයීය අධ්‍යයන පාඨමාලාව වීම.
- 2018 වසරේ සිට අ:පො:ස උසස් පෙළ සමත් කෘෂිකාර්මීය අධ්‍යාපනයට කැමැත්තක් දක්වන ශිෂ්‍ය කණ්ඩායමක් බඳවා ගන්නා ලදී (A කණ්ඩායම)

**කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ (B.Ag.Tec) අනුමැතිය ලබාදීම පිළිබඳ විස්තර**

සනාථන සභාවේ අනුමැතිය : 338 වැනි සනාථන සභා රැස්වීම (2010.09.29)-විෂය නිර්දේශය
පාලක සභාවේ අනුමැතිය : 462 වැනි පාලක සභා රැස්වීම (2012.08.15) - අතුරු ව්‍යවස්ථා
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය : 867 වැනි විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා රැස්වීම (2013.02.07) - උපාධි පාඨමාලාව

**කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ දළ සටහන (course outline)**

කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ කාලසීමාව වසර 04 කි.

'අධ්‍යයන වර්ෂයක්' සති 15 බැගින් වූ අධ්‍යයන සමාසික 02 කින් සමන්විත වන අතර අධ්‍යයන වැඩසටහන පදනම් වී ඇත්තේ 'පාඨමාලා සම්මාන ඇගයීම් ක්‍රමය' මත වන අතර එහිදී සිසුන් සමාසිකය පුරාම අඛණ්ඩව ඇගයීමට ලක් කරනු ලැබේ (එනම් සැකැස්ම) සහ අවසාන සමාසිකය ඇගයීම (එනම් සාරාංශය) නම් කරන ලද පාඨමාලා සඳහා සමාසිකය අවසානයේ පැවැත්වේ. එක් එක් පාඨමාලා ඒකක ආරම්භයේ දී අඛණ්ඩ ඇගයීම් සිදුකරන ක්‍රමවේදය සහ කාලසීමාවන් පිළිබඳව සිසුන්ට දැනුම් දෙනු ලැබේ.

කෘෂිතාක්ෂණවේදී ගෞරව උපාධිය සඳහා සුදුසුකම් ලැබීම සඳහා, අදාල ශිෂ්‍යයා විසින් අවසාන ශ්‍රේණියට දායක වන සම්මාන අගයන් (GPA course units) 120 ක් උපයා ගත යුතු අතර එසේම අවසාන ශ්‍රේණියට දායක නොවන (12 Non-GPA course units) පාඨමාලා ඒකකයන් ද ඇතුලත්ව සියලු පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කළ යුතු ය.

පාඨමාලා එක් එක් වසර සඳහා බණ්ඩනය කිරීම පහත පරිදි සාරාංශගත කර ඇත:

(පළමු වසර ) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 30ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (Non-GPA course units) 04ක් උපයා ගත යුතුය

(දෙවන වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 30ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 03ක් උපයා ගත යුතුය (සමුච්චිත වශයෙන් දෙවන වසර අවසානයේ දී අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 60ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 07ක් උපයා ගත යුතුය)

(තෙවන වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 32ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 03ක් උපයා ගත යුතුය (සමුච්චිත වශයෙන් දෙවන වසර අවසානයේ දී අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 92ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 10ක් උපයා ගත යුතුය)

(හතරවන වසර) - අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 28ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 02ක් උපයා ගත යුතුය (සමුච්චිත වශයෙන් දෙවන වසර අවසානයේ දී අවසාන ශ්‍රේණියට දායක වන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් (GPA course units) 120ක් සහ අවසාන ශ්‍රේණියට දායක නොවන පාඨමාලා ඒකක සඳහා සම්මාන අගයන් 12ක් උපයා ගත යුතුය)

පාඨමාලා ඒකකයක් හඳුනා ගැනීම සඳහා ඇල්ෆා සංඛ්‍යා කේතයක් (alpha numeric code) භාවිතා කරයි. කේතය 'කෘෂි තාක්ෂණය' යන වචන දැක්වීමට මුලට යොදන ලද AT නමැති අකුරු දෙකක් සහ ඉලක්කම් හතරකින් සමන්විත වේ.

එහි පළමු ඉලක්කම මගින් පාඨමාලා ඒකකය පිරිනමන 'වර්ෂය' ද දෙවන ඉලක්කම මඟින් පාඨමාලා ඒකකය පිරිනමන 'සමාසිකය' ද දක්වයි. තෙවන ඉලක්කම මඟින් පාඨමාලා ඒකකය සඳහා පවරා ඇති 'අනුක්‍රමික අංකය' දක්වයි (වගුව 08).

**කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ විෂය මාලාව (Curriculum)**

විෂය මාලාව සංශෝදනය කරන ලද අතර එය 2018.01.30 දින පැවති සනාථන සභාවේ 426 වන රැස්වීම් වාරයේ දී නිර්දේශ කරන ලදී.

වගු අංක **08 :** පාඨමාලා අන්තර්ගතය

**T:Theory (න්‍යාය), P: Practical (ප්‍රායෝගික), IL:Individual Learning through LMS (LMS ඔස්සේ තනි පුද්ගල ඉගෙනුම)**

| විෂය කේතය | විෂයේ නම | සම්මාන අගය (GPA) | සම්මාන නොවන අගය (NGPA) | අධ්‍යයන කාලය (පැය) T:P:IL |
|---|---|---|---|---|
| **Level 3** පළමු වසර පළමු සමාසිකය | | | | |
| AT1101 | ශෂ්‍ය විද්‍යා හා උද්‍යාන විද්‍යා මූලධර්ම. | 3 | - | 15:60:90 |
| AT1102 | ශාක ජීව විද්‍යා මූලධර්ම. | 2 | - | 15:30:60 |
| AT1103 | ජල සම්පාදනය හා ජල සම්පත් ඉංජිනේරු විද්‍යාව. | 3 | - | 15:60:60 |
| AT1104 | ගොවිපල සතුන්ගේ ව්‍යූහ විද්‍යාව හා කායික විද්‍යාව | 2 | - | 15:30:60 |
| AT1105 | කෘෂි ආර්ථික විද්‍යා හා කෘෂි ව්‍යාපෘතියේ මූලධර්ම. | 2 | - | 15:30:60 |
| AT1106 | පාංශු විද්‍යා මූලධර්ම. | 2 | - | 15:30:60 |
| AT1107 | කෘෂි කාලගුණ විද්‍යාව. | 1 | - | 00: 30:60 |
| AT1108 | ඉංග්‍රීසි | 0 | 2 | 15:30:90 |
| **මුළු සම්මාන අගයන්** | | **15** | **2** | **105:300:540** |
| **Level 3** පළමු වසර දෙවන සමාසිකය | | | | |
| AT1201 | එළවලු හා ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය හා කලමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT1202 | පලිබෝධ හා රෝග කලමණාකරණය. | 2 | - | 15:30:90 |
| AT1203 | ගොවිපල සතුන් කළමණාකරණය. | 3 | - | 15:60:60 |
| AT1204 | ගොවිපල බල හා යාන්ත්‍රීකරණය. | 2 | - | 15:30:60 |
| AT1205 | වාණිජ මල් වගාව. | 2 | - | 15:30:60 |
| AT1206 | පාංශු හා ශාක පෝෂණ කළමණාකරණය | 2 | - | 15:30:90 |
| AT1207 | ආහාර හා පෝෂණ විද්‍යාව හැදින්වීම | 2 | - | 15:30:90 |
| AT1208 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | 0 | 2 | 00:30:30 |
| **මුළු සම්මාන අගයන්** | | **15** | **2** | **105:270:540** |
| | **Total Credits at Level 3** | **30** | **4** | **210:570:1080** |
| **Level 4** දෙවන වසර පළමු සමාසිකය | | | | |
| AT2101 | වැවිලි බෝග නිශ්පාදනය හා කළමණාකරණය. | 3 | - | 15:60:90 |
| AT2102 | බෝග වැඩිදියුණු කිරීම හා ජෛව තාක්ෂණය. | 2 | - | 15:60:90 |
| AT2103 | පළතුරු බෝග නිෂ්පාදනය හා කළමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT2104 | පසු අස්වනු කළමණාකරණය හා ආහාර තාක්ෂණය. | 2 | - | 15:30:90 |
| AT2105 | තෘණ විද්‍යාව සහ තෘණ බිම් කළමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT2106 | කෘෂි ව්‍යාපාර කළමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT2107 | මූලික සංඛ්‍යානය. | 2 | - | 15:30:60 |

| | | | | |
|---|---|---|---|---|
| AT2108 | පරිගණක ආශ්‍රිත භාෂා අධ්‍යනය. | 0 | 2 | 15:30:90 |
| **මූලු සම්මාන අගයන්** | | **15** | **2** | **120:270:600** |
| **Level 4 දෙවන වසර දෙවන සමාසිකය** | | | | |
| AT2201 | අපනයන කෘෂිකර්ම බෝග නිශ්පාදනය හා කළමණාකරණය. | 2 | - | 15:30:90 |
| AT2202 | ආරක්ෂිත බෝග වගාව. | 2 | - | 15:30:60 |
| AT2203 | සත්ත්ව අභිජනනය හා පට්ටි පාලනය. | 3 | - | 15:60:60 |
| AT2204 | ගොවිපල සැලසුම්කරණය. | 2 | - | 15:45:90 |
| AT2205 | කෘෂි ව්‍යාප්ති විද්‍යාව හා සන්නිවේදන තාක්ෂණය. | 2 | - | 15:30:90 |
| AT2206 | ජල ජීවී විද්‍යා නිශ්පාදන තාක්ෂණය. | 2 | - | 15:30:60 |
| AT2207 | ශාක පටක රෝපණ තාක්ෂණය. | 2 | - | 15:30:60 |
| AT2208 | ජීවන කුසලතා සංවර්ධනය. | 0 | 1 | 00:30:30 |
| **Total Credits** | | **15** | **1** | **105:285:540** |
| **Total Credits at Level 4** | | **30** | **3** | **225:555:1140** |
| **Level 5 තෙවන වසර පළමු සමාසිකය** | | | | |
| AT3101 | උද්‍යාන අලංකරණය. | 3 | - | 30:60:90 |
| AT3102 | කෘෂි පාරිසරික විද්‍යාව. | 2 | - | 15:30:60 |
| AT3103 | සත්ත්ව නිෂ්පාදන සැකසුම් තාක්ෂණය. | 2 | - | 15:30:60 |
| AT3104 | ආහාර සැකසුම හා අගය එකතු කිරීම. | 2 | - | 15:30:90 |
| AT3105 | ශාක වැඩිදියුණු කිරීමේ හා ජෛව තාක්ෂණයේ යෙදවුම්. | 2 | - | 15:30:90 |
| AT3106 | ඖෂධ පැළෑටි නිෂ්පාදනය හා කළමණාකරණය. | 2 | - | 15:30:60 |
| AT3107 | කෘෂි වන වගාව. | 2 | - | 15:30:60 |
| AT3108 | මානව හා සමාජ විද්‍යා මූලධර්ම. | 0 | 2 | 15:30:60 |
| **මුළු සම්මාන අගයන්** | | **15** | **2** | **135:270:570** |
| **Level 5 තෙවන වසර දෙවන සමාසිකය** | | | | |
| AT3201 | ශාක නිෂ්පාදන පුහුණුව. | 4 | - | 00:120:90 |
| AT3202 | සත්ත්ව නිශ්පාදන පුහුණුව. | 3 | - | 00:90:90 |
| AT3203 | කෘෂි ඉංජිනේරු විද්‍යා පුහුණුව. | 2 | - | 00:60:90 |
| AT3204 | විද්‍යුත් වාණිජ කෘෂිකර්මාන්තය. | 2 | - | 30:30:60 |
| AT3205 | නිරපේක්ෂ කෘෂිකර්මාන්තය. | 2 | - | 30:30:60 |
| AT3206 | ව්‍යවසායකත්වය හා ව්‍යාපාර සැලසුම්කරණය. | 2 | - | 30:60:90 |
| AT3207 | සිද්ධි අධ්‍යනය. | 2 | - | 30:30:60 |
| AT3208 | ඉදිරිපත් කිරීමේ කුසලතා | 0 | 1 | |
| **මුළු සම්මාන අගයන්** | | **17** | **1** | **120:420:540** |
| **Total Credits at Level 5** | | **32** | **3** | **255:690:1110** |
| **Level 6 සිව්වන වසර පළමු සමාසිකය** | | | | |

| | | | | |
|---|---|---|---|---|
| AT4101 | පර්යේෂණ ක්‍රමවේදය සහ යෝජනා සංවර්ධනය | 2 | - | 15:30:90 |
| AT4102 | කෘෂිකාර්මික පරීක්ෂණ පැවැත්වීම සහ දත්ත විශ්ලේෂණය | 3 | - | 15:60:90 |
| AT4103 | කෘෂිකාර්මික ව්‍යාපෘති විශ්ලේෂණය හා කළමනාකරණය | 2 | - | 15:30:90 |
| AT4104 | කෘෂිකාර්මික අපද්‍රව්‍ය කළමනාකරණය | 2 | - | 15:30:90 |
| AT4105 | බලශක්ති පද්ධති නැවත ආරම්භ කිරීම | 2 | - | 15:30:60 |
| AT4106 | භෝග ආකෘති | 2 | - | 15:30:60 |
| AT4107 | විද්‍යුත් කෘෂිකර්මයේ භාවිතයන් | 2 | - | 30:30:60 |
| AT4108 | ජීව සාරධර්ම | 1 | - | 15:00:60 |
| AT4109 | ඉංග්‍රීසි | 0 | - | 15:30:60 |
| **Total Credits** | | **16** | **2** | **150:270:660** |
| Level **6 සිව්වන වසර දෙවන සමාසිකය** | | | | |
| AT4101 | කෘෂි තාක්ෂණික පර්යේෂණ ව්‍යාපෘතිය | 12 | 0 | 0 |
| **Total Credits** | | **12** | **0** | **0** |
| **Total Credits at Level** 6 | | **28** | **2** | **150:270:660** |

**වෛකල්පිත විෂයන්**

**වගු අංක 09 : T:Theory (න්‍යාය), P: Practical (ප්‍රායෝගික), IL:Individual Learning through LMS (LMS ඔස්සේ තනි පුද්ගල ඉගෙනුම)**

| විෂය කේතය | විෂයේ නම | සම්මාන අගය (GPA) | සම්මාන නොවන අගය (NGPA ) | අධ්‍යයන කාලය (පැය) T:P:IL |
|---|---|---|---|---|
| AT1109 | වෘත්තීය මාර්ගෝපදේශනය සහ සංවර්ධනය | 2 | - | 15:30:60 |
| AT1209 | කෘෂි සංචාරක ව්‍යාපාරය | 2 | - | 15:30:60 |
| AT2109 | කෘෂිකර්මයට අදාළ විද්‍යුත් සහ උපකරණ සැකසීම | 2 | - | 15:30:60 |
| AT2209 | ආපදා කළමනාකරණය | 2 | - | 15:30:60 |
| AT3109 | කාර්මික පුහුණුව | 2 | - | 00:60:60 |
| AT3209 | සත්ව සුභසාධනය සහ සාරධර්ම | 2 | - | 15:30:60 |
| AT4209 | වනජීවී කළමනාකරණය | 2 | - | 15:30:60 |

ග්‍රාමීය ගොවි ප්‍රජාව කෘෂිකාර්මික ව්‍යවසායකයින් ලෙස සංවර්ධනය කිරීමේ දී මෙම වැඩසටහනට ඇතුළත් කොට ඇති ප්‍රායෝගික ක්‍රියාකාරකම්, පැවරුම්, සිද්ධාන්තමය කරුණු හා ආධුනිකව අධ්‍යයනය ලබන්නන් හට දෙනු ලබන සහය සේවාවන් වැනි සියලුම සංරචක ඔවුනගේ පෞද්ගලික සහ වෘත්තීය සංවර්ධනය කෙරෙහි ප්‍රශස්ත අන්දමින් ඉවහල් වී ඇත.

තවද, මෙම උපාධි පාඨමාලාව, තරුණ පරපුර තුළ ඉහල සමාජීය පිළිගැනීමක් ලබමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ රැඳී සිටීමට විශාල අභිප්‍රේරණයක් ඇති කර තිබේ.

**අධ්‍යයන වැඩසහටන්වලට ඇතුළත් වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකම්**

ශ්‍රී ලංකාවේ ජාතික පුවත්පත්වල ප්‍රකාශයට පත් කෙරෙන පුවත්පත් දැන්වීමක් තුළින් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගෙන් අයදුම්පත් කැඳවීම මගින් බඳවා ගැනීම සිදු කෙරේ.

1. අ.පො. ස. (උසස් පෙළ) විභාගය කෘෂිකාර්මික විද්‍යාව හෝ ජෛව පද්ධති තාක්ෂණය හෝ ගණිත විෂයන්ගෙන් සම්මාන 03ක් සහිතව සමත් වීම

**හෝ**

2. අවම වශයෙන් වසර 03ක කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පළපුරුද්ද (අදාළ පදිංචි ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක සහ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ සංවර්ධන නිලධාරී විසින් සහතික කළ යුතුයි) සහ අ.පො. ස. (උසස් පෙළ) විභාගය ඉහත වගන්ති 1 සඳහන් විෂය ධාරාවන්ගෙන් හැර වෙනත් විෂය ධාරාවකින් සම්මාන 03ක් සහිතව සමත් වීම

**හෝ**

3. අවම වශයෙන් වසර 05ක කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පළපුරුද්ද (අදාළ පදිංචි ප්‍රදේශයේ කෘෂිකර්ම උපදේශක සහ කෘෂිකර්ම මධ්‍යස්ථානයේ සංවර්ධන නිලධාරී විසින් සහතික කළ යුතුයි) සහ අ.පො. ස. (සා. පෙළ) විභාගය ගණිතය සහ විද්‍යාව විෂයන් සහිතව සමත් වීම

**හෝ**

4. කොළඹ විශ්ව විද්‍යාලයේ සනාථන සභාව විසින් පිළිගන්නා වෙනත් ඕනෑම සමාන සුදුසුකම්

**හෝ**

5. පිළිගත් ආයතනයකින් කෘෂිකර්මය පිලිබඳ ඩිප්ලෝමාව (NVQ 5 මට්ටම) හෝ උසස් ඩිප්ලෝමාව (NVQ 6 මට්ටම) සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන්ට, සම්මානිත අගයන් 30කින් සමන්විත පාඨමාලාව (30 credits bridging course) සම්පූර්ණ කිරීමෙන් පසු පිලිවෙලින් කෘෂි තාක්ෂණික උපාධි පාඨමාලාවේ දෙවන හෝ තෙවන වසර සඳහා ඇතුලත් විය හැකිය.

සුදුසුකම්ලත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා අභියෝග්‍යතා පරීක්ෂණයකට කැඳවනු ලැබේ. අභියෝග්‍යතා පරීක්ෂණයේ ප්‍රතිඵලවලට අනුව, සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වීමෙන් අනතුරුව අයදුම්කරුවන් ලියාපදිංචි කෙරේ.

**වගු අංක 10 : 2021 වර්ෂයේ දී කෘෂි තාක්ෂණවේදී උපාධිය හදාරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව**

| අධ්‍යයන වර්ෂය (කාණ්ඩායම/වසර) | බඳවා ගත් වර්ෂය (අධ්‍යයන වර්ෂය) | සිසුන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | පිරිමි | ගැහැණු | එකතුව |
| පළමු වසර (11/12/13 කණ්ඩායම්) | 2019/2020-2020/2021-2021/2022 | 202 | 306 | 508 |
| 2 වන වසර (10/11/12/13 කණ්ඩායම්) | 2018/2019-2019/2020-2020/2021-2021/2022 | 69 | 94 | 163 |
| 3 වන වසර (8/9/10/11/12/13 කණ්ඩායම්) | 2016/2017-2017/2018-2018/2019-2019/2020-2020/2021-2021/2022 | 96 | 105 | 201 |
| 4 වන වසර (7 / 8 / 9 / 10 වන කණ්ඩායම්) | 2015/2016-2016/2017-2017/2018-2018/2019 | 44 | 23 | 67 |

**වගු අංක 11 :පසුගිය වසර 3 තුළ සිසුන් බඳවා ගැනීම සහ සමත් වූ සිසුන්**

| වසර | බඳවා ගත් සිසුන් සංඛ්‍යාව | සමත් වූ සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| 2021 | 323 | - |
| 2020 | 343 | 31** |
| 2019 | 267 | 32** |

* 2012/2013 සහ 2013/2014 ශිෂ්‍ය කණ්ඩායම් වල සමත් වූ සිසුන් (4 සහ 5 කණ්ඩායම්)

** 2014/2015 ශිෂ්‍ය කණ්ඩායමේ සමත් වූ සිසුන් (6 කණ්ඩායම)

2021.12.31 දිනට අධ්‍යයන වැඩසටහනේ කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

**වගු අංක 12 : අධ්‍යයන කාර්ය මණ්ඩලය (ස්ථිර)**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ආචාර්ය එන්.පී. විදානපතිරණ මිය | ජ්‍යෙෂඨ කථිකාචාර්ය II ශ්‍රේණිය , අංශ ප්‍රධාන, කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය |
| 2 | ආචාර්ය සුජාතා වීරසිංහ මිය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය |
| 3 | ආචාර්ය ඩී.එම්.සී.සී.ගුණතිලක මහතා | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය (පරිවාස) |
| 4 | එල්.එම්.රිෆ්නාස් මහතා | කථිකාචාර්ය (පරිවාස) |
| 5 | කේ.ජී.කෙටිපෙආරච්චි මෙනවිය | කථිකාචාර්ය (පරිවාස) |
| 6 | ඒ.ජේ.එම්.සී.එම්.සිරිවර්ධන මහතා | කථිකාචාර්ය (පරිවාස) |
| 7 | යූ.ආර්.චන්දිමාලා මෙනවිය | කථිකාචාර්ය (පරිවාස) |
| 8 | බී.එස්.බන්ධුසේකර මහතා | කථිකාචාර්ය (පරිවාස) |

*** 2021 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට ආයතනයේ ශාස්ත්‍රීය මණ්ඩලය ශක්තිමත් කරමින් සාමාජිකයින් හය දෙනෙකු [1- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය සහ 5- කථිකාචාර්ය (පරිවාස)] කෘෂි තාක්ෂණික දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්‍ය්‍ය මණ්ඩලයට සම්බන්ධ වී ඇත.*

**වගු අංක 13 : අධ්‍යයන (පැවරුම් පදනම මත)/අධ්‍යයන (තාවකාලික)/අධ්‍යයන සහායක (ස්ථිර) කාර්ය මණ්ඩලය**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | එස්.ඒ.පී. නෙල්කා මිය | පාඨමාලා සම්බන්ධීකාරක |
| 2 | එස්.එල්. නවරත්න මිය | පාඨමාලා සම්බන්ධීකාරක |
| 3 | එච්.කේ.ආර්.එස්. කුමාර මහතා | පාඨමාලා සම්බන්ධීකාරක |
| 4 | ටී.ජී.බී.ධනුෂ්ක මහතා | පාඨමාලා සම්බන්ධීකාරක |
| 5 | බී.පී. සිරිවර්ධන මහතා | පාඨමාලා සම්බන්ධීකාරක |
| 6 | එච්.රෝහණධීර මහතා | විද්‍යාත්මක සහකාර |
| 7 | බී.පී.දිලිනි හේමාලි | තාවකාලික ශිල්ප ප්‍රදර්ශක |
| 8 | එම්.යූ.එන්.ගුණවර්ධන | තාවකාලික ශිල්ප ප්‍රදර්ශක |
| 9 | ටී.වී.ආර්.සී.පෙරේරා | තාවකාලික ශිල්ප ප්‍රදර්ශක |
| 10 | කේ.අනුරුද්ධි මෙනවිය | තාවකාලික ශිල්ප ප්‍රදර්ශක |

**වගු අංක 14 : අනධ්‍යයන කාර්ය මණ්ඩලය**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | ඒ.ජී.යූ.වසන්ති මිය | කළමනාකරණ සහකාර III ශ්‍රේණිය |
| 2 | එස්.ඒ.ආර්.ලක්මාල් මහතා | පරිගණක ක්‍රියාකරු සහ තොරතුරු තාක්ෂණ විද්‍යාගාර කාර්මික |
| 3 | ඩබ්ලිව්.අයි.චතුමලි මිය | වැඩ සහායක III ශ්‍රේණිය |

- UCIARS හි තුන්වන අධ්‍යක්ෂවරයා වන අධ්‍යක්ෂ මහාචාර්ය සුදර්සන් සෝමසුන්දරම් මහතා 2021.08.07 දින නිල කාලය සම්පූර්ණ කළ අතර 2021.08.08 සිට වසර අවසානය දක්වා ඔහු ආයතනයේ අර්ධකාලීන උපදේශක ලෙස සේවය කළේය.

- රජයේ ගුරුවරයකු මෙන්ම UCIARS හි හිටපු සහකාර පාඨමාලා සම්බන්ධීකාරකවරයකු ලෙස සේවය කළ එච්.ආර්. චාමර මහතා, තොරතුරු තාක්ෂණ නිලධාරියකු ලෙස අර්ධ කාලීන පැවරුමක් මත 2021 වසර සඳහා සේවය ලබා දී ඇත.

- එක් එක් විෂය ක්ෂේත්‍රය පිළිබඳ විශේෂඥ දැනුම ලබා දීම සඳහා මෙන්ම පාඨමාලාවන්හි ප්‍රමිතිය පවත්වා ගැනීමේ අරමුණින් කොළඹ විශ්ව විද්‍යාලයේ සනාථන සභාව විසින් UCIARS කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය සහිතව අධ්‍යයන වැඩසටහන්වල ඇතැම් පාඨමාලා සඳහා විෂය ප්‍රවීණයින් පත් කර ඇත.

**COVID-19 වසංගත කාල සීමාව තුළ අධ්‍යයන කටයුතු**

සියලුම අධ්‍යයන වර්ෂවල සිසුන් අන්තර්ජාලය හරහා පවත්වනු ලබන දේශනවලට සහභාගි වූ අතර ඔවුන් සෞඛ්‍ය රෙගුලාසි සහ ආරක්ෂිත මාර්ගෝපදේශවලට අනුකූලව නේවාසිකාගාරවල රැඳී සිටිමින් කණ්ඩායම් වශයෙන් ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලට සහභාගි වූහ.

**ගොවිපල පුහුණු පාඨමාලාව**

තෙවන වසරේ ඉගෙනුම ලබන උපාධි අපේක්ෂක සිසුන් සඳහා විශේෂයෙන් බෝග පාලනය, සත්ව පාලනය සහ කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යාව සම්බන්ධයෙන් ඔවුන්ගේ ප්‍රායෝගික සංරචකය සපුරාලීම සඳහා සඳහා ගොවිපල පුහුණු පාඨමාලාව පැවැත්වීම අත්‍යවශ්‍ය කරුණකි. මෙම ගොවිපල පුහුණු පාඨමාලාව 2021 නොවැම්බර් 13 වන දින සිට සෞඛ්‍ය නීති රීති වලට අනුකූලව සහ ඔවුන්ගේ වැඩ වලදී සියලුම සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කරමින් ආරම්භ කරන ලදී.

**2021 වසරේ කෘෂි තාක්ෂණික අධ්‍යයන අංශය තුළ සිදු වූ විශේෂ සිදුවීම්**

- 2021 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කිරීම් සහ අධ්‍යයන වැඩසටහන සාක්ෂාත් කර ගැනීම්

  නව අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවන ලද අතර 2021 ජුනි 16 වන දින වන විට අයදුම්පත් 1200 කට අධික සංඛ්‍යාවක් ලැබී තිබුණි. දිවයිනේ සෑම ප්‍රදේශයකින්ම අයදුම්පත් ලැබී ඇත. සුදුසුකම් ලත් සියලුම අයදුම්කරුවන් සඳහා 2021 නොවැම්බර් 13 වැනි දින දෙබරවැව ජාතික පාසලේදී ප්‍රවේශ විභාගය පවත්වන ලදී. ප්‍රවේශ විභාගයේ ප්‍රතිඵල මත නවක සිසුන් කෘෂි තාක්ෂණ ගෞරව උපාධි පාඨමාලාව සඳහා බඳවාගෙන නියමිත පරිදි අධ්‍යයන වාරය ආරම්භ කරන ලදී. සියලුම සෞඛ්‍ය රෙගුලාසි සහ මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රවේශ විභාගය සඳහා අයදුම්කරුවන් 350 ක් පමණ මුහුණ දෙන ලදී. වැඩසටහන සඳහා නවක සිසුන් බඳවා ගන්නා ලද අතර 2021 දෙසැම්බර් 29 දිනට නියමිත පරිදි අධ්‍යයන වාරය ආරම්භ කරන ලදී. ICT, ඉංග්‍රීසි, ගණිතය සහ මූලික විද්‍යාව ආවරණය වන පරිදි අනුස්ථාපන වැඩසටහන (Orientation program) ක්‍රියාත්මක කරන ලදී. සතියේ දිනවල සහ සති අන්තයේ පමණක් අධ්‍යයන කටයුතු සඳහා සහභාගී වන පූර්ණ කාලීන සිසුන් (A කාණ්ඩය) සහ අර්ධකාලීන සිසුන් (B කාණ්ඩය) ලෙස අධ්‍යයන වැඩසටහන අනුගමනය කිරීමට ඇති ප්‍රවේශය සහ පහසුව සලකා සිසුන් කණ්ඩායම් දෙකකට වර්ග කර ඇත.

- ජාතික අතථ්‍ය සම්මන්ත්‍රණය 2021 (National Virtual Symposium)

  “හරිත කෘෂිකර්මයේ ඉදිරි ගමනක් ග්‍රාමීය සංවර්ධනය කරා” යන මැයෙන් ජාතික අතථ්‍ය සම්මන්ත්‍රණයක් 2021 මැයි 28 වැනි දින පැවැත්විණි. NSATRS 2021 හි ප්‍රධාන ඉලක්කය වූයේ කෘෂි තාක්ෂණයෙහි විවිධ පර්යේෂණවල අභියෝග සහ අනාගත දිශානතීන් සාකච්ඡා කිරීමට සංසදයක් සැපයීමයි. කෘෂි තාක්ෂණය පදනම් කරගත් පර්යේෂණ සහ එහි නව දිශානතීන් පිළිබඳ විවිධ අදහස් සහ දැක්මක් සපයන මාර්ගගත ප්‍රකාශනයක් ලෙස මෙම ක්‍රියාවලිය ප්‍රකාශයට පත් කරන ලදී. එබැවින් මෙම සම්මන්ත්‍රණය මගින් විශිෂ්ට අදහස් හා සංකල්ප බෙදාහදා ගැනීමටත් අවධානය ප්‍රබෝධමත් කිරීමටත් නිෂ්පාදනයෙන් ඔබ්බට ජාතික කෘෂිකර්මාන්තය දිරිමත් කිරීමටත් විශාල අවස්ථාවක් සලසා දී ඇත.

*අතථ්‍ය සම්මන්ත්‍රණයේ මාතෘකා :*

- ස්මාර්ට් කෘෂිකර්මය සහ පරිසර පද්ධති ආරක්ෂාව
- ආහාර සුරක්ෂිතතාව සඳහා කෘෂිකාර්මික නවෝත්පාදන
- දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකර්මය
- නව කෘෂිකාර්මික තාක්ෂණය හරහා ග්‍රාමීය ප්‍රජාව සවිබල ගැන්වීම

*ප්‍රධාන කථිකයින් :*

1. මහාචාර්ය රංජිත් සේනාරත්න, ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනමේ සභාපති
2. ආචාර්ය රිචර්ඩ් එස්. කහූන්, WIPO, Sr. Expert, Bio-property Strategy Group, Inc., President, Cornell University College of Agriculture & Life Sciences, Department of Global Development, Professor-adjunct, USA

සියලුම කාර්යමණ්ඩල සාමාජිකයින් සහ සිසුන්ගේ සහභාගීත්වයෙන් ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය එස්. සුදර්සන් මහතාගේ ප්‍රදානත්වයෙන් මෙම සම්මන්ත්‍රණය ආරම්භ කර මෙහෙයවන ලදී. මෙම සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය වන්ද්‍රිකා එන්. විජයරත්න මහත්මිය සහභාගි විය.

- 2021 උපාධිය ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබූ සිසුන්

කෘෂි තාක්ෂණවේදී උපාධි වැඩසටහනේ 4 වන සහ 5 වන කණ්ඩායම් වල සිසුන් 32 දෙනෙකු 2021 දී උපාධිය ලැබීම සඳහා සුදුසුකම් ලබා ඇත.

- නේවාසිකාගාර තුළ Wi Fi පද්ධතිය වැඩිදියුණු කිරීම

දැනට ක්‍රියාත්මක වන Wi Fi පද්ධතියේ ප්‍රවේශ ලක්ෂ්‍යයට නව උපාංගයක් සවි කිරීම මගින් wi fi පද්ධතිය වැඩි දියුණු කරන ලදී. මෙය සිසුන්ට බාධාවකින් තොරව මාර්ගගත අධ්‍යයන කටයුතුවල නිරත වීමට මහත් රුකුලක් විය.

**2.2 පැළ තවාන්/ විද්‍යාගාර කාර්යසාධනය**

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලිය අනුව 2008 වර්ෂයේ දී කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය ආරම්භ කළ ද, කොළඹ විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘතියක් ලෙස 1998 දී දුප්පත් ග්‍රාමීය ගොවි ජනතාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම උදෙසා පටක රෝපණ ඒකකය ආරම්භ කරන ලදී. 2001 වර්ෂයේ දී, කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පැළෑටි විද්‍යා අංශය (Department of Plant Science) මගින් ආදර්ශනයක් ලෙස මෙම ආයතනය සඳහා පටක රෝපණ කෙසෙල් හා කිරි අල පටක රෝපණය කිරීම හඳුන්වා දෙන ලදී. 2003 වර්ෂයේ සිට මෙම ආයතනය කොළඹ විශ්ව විද්‍යාලයේ මහ පෙන්වීම හා අධීක්ෂණය යටතේ ආයතනයේම නිෂ්පාදනයක් ලෙස පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනය කර ගෙනයාමට සමත් විය. වගු අංක 15 න් පෙන්නුම් කරන්නේ ශාක විද්‍යාගාරයේ සහ තවානෙහි සුමට ක්‍රියාකාරිත්වය සඳහා කාර්ය මණ්ඩලය දායක වූ ආකාරයයි.

**වගු අංක 15 : 2021.12.31 වන විට පැළතවාන් සහ විද්‍යාගාර කාර්ය මණ්ඩලය**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | එච්.රෝහණධීර මහතා | විද්‍යාත්මක සහකාර (අංශ ප්‍රධාන-නිෂ්පාදන) |
| 2 | එච්.කේ.එස්. ඉෂාර මහතා | ක්ෂේත්‍ර සුපරීක්ෂක (අංශ ප්‍රධාන-පැළ තවාන් අංශය) |
| 3 | ඒ.එන්. අබේගුණවර්ධන මිය | විද්‍යාගාර සහායක |
| 4 | එච්.කේ. සමන්ති නිලිනි කුමාරි මිය | විද්‍යාගාර සහායක |
| 5 | එම්.ජී.සී. සුදර්ශනී මිය | විද්‍යාගාර සහායක |

| | | |
|---|---|---|
| 6 | ඒ. ප්‍රියංගා සුදර්ශි මිය | විද්‍යාගාර සහායක |
| 7 | යූ. අනුෂා රුවනි මිය | විද්‍යාගාර සහායක |
| 8 | ඩබ්.එච්. දිස්නා සඳමාලි මිය | විද්‍යාගාර සහායක |
| 9 | ඕ.පී. නිලූකා සුහාෂිනී මිය | විද්‍යාගාර සහායක |
| 10 | ඩී. ඉෂාදි නිමල්ගා මිය | විද්‍යාගාර සහායක |
| 11 | කේ.පී. උදේනි නිසංසලා මිය | විද්‍යාගාර සහායක |
| 12 | එන්.එස් .පෙරේරා මිය | විද්‍යාගාර සහායක |
| 13 | එස්.එම්.වීරසූරිය මිය | විද්‍යාගාර සහායක |
| 14 | එච්.ආර්.ඒ.මධුමාලි මිය | විද්‍යාගාර සහායක |
| 15 | පී.එම්.ටී.පියුමාලි මිය | විද්‍යාගාර සහායක |
| 16 | ඩබ්.එච්.කල්පනී මිය | විද්‍යාගාර සහායක |
| 17 | කේ.එල්.ඒ.ඒ.සුදර්ශනී මිය | විද්‍යාගාර සහායක |
| 18 | අයි.සී.දොඩම්පේ මෙනවිය | විද්‍යාගාර සහායක |
| 19 | අයි.ඩී.ජී.එන්.කුමාරි මිය | විද්‍යාගාර සහායක |
| 20 | ඩබ්.කේ.එම්.එස්.සෙව්වන්දි මිය | විද්‍යාගාර සහායක |
| 21 | එන්.එස්.ප්‍රදීප් මහතා | වැඩ සහායක |
| 22 | ටී.ඒ.කේ.වයි.ඉදුනිල් මහතා | වැඩ සහායක |

**2021 වර්ෂයේ කාර්යසාධනය**

2021 වර්ෂය තුළ පටක රෝපණ පැළ නිෂ්පාදනය සහ විකුණුම් කාර්ය සාධනය පහත වගු සහ සංඛ්‍යා වලින් දක්වා ඇත.

**වගු අංක 16 : පටක රෝපණ විද්‍යාගාරයේ පැළ නිෂ්පාදන වාර්තා (සංඛ්‍යාව)**

| මාසය | කෙසෙල් පැළ | කෝමාරිකා පැළ |
|---|---|---|
| ජනවාරි | 5,609 | - |
| පෙබරවාරි | 5,185 | - |
| මාර්තු | 5,465 | 2,694 |
| අප්‍රේල් | 5,678 | 2,289 |
| මැයි | 8,257 | - |
| ජූනි | 8,182 | - |
| ජූලි | 8,250 | - |
| අගෝස්තු | 11,237 | 2,262 |
| සැප්තැම්බර් | 11,412 | - |
| ඔක්තෝබර් | 12,100 | - |
| නොවැම්බර් | 12,528 | - |
| දෙසැම්බර් | 15,246 | - |
| **එකතුව** | **109,149** | **7,245** |

**වගු අංක 17 : පසුගිය වසර අට සඳහා කෙසෙල් පැල නිෂ්පාදනය සංසන්දනය කිරීම (සංඛ්‍යාව)**

| මාසය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 18,514 | 20,315 | 20,594 | 20,386 | 18,826 | 25,628 | 7,861 | 5,609 |
| පෙබරවාරි | 18,209 | 20,127 | 20,476 | 21,527 | 24,882 | 19,025 | 16,360 | 5,185 |
| මාර්තු | 18,960 | 20,611 | 16,918 | 25,150 | 24,680 | 8,949 | 10,751 | 5,465 |
| අප්‍රේල් | 14,275 | 12,580 | 10,815 | 19,703 | 18,873 | 5,429 | 5,166 | 5,678 |
| මැයි | 10,043 | 14,852 | 19,079 | 24,351 | 27,514 | 24,023 | 10,097 | 8,257 |
| ජූනි | 10,550 | 14,218 | 19,359 | 23,260 | 23,504 | 19,425 | 18,384 | 8,182 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ජූලි | 12,791 | 12,029 | 19,750 | 25,184 | 8,673 | 20,005 | 10,437 | 8,250 |
| අගෝස්තු | 7,770 | 14,021 | 20,875 | 22,151 | 11,318 | 6,669 | 5,538 | 11,237 |
| සැප්තැම්බර් | 18,831 | 18,030 | 24,180 | 25,420 | 22,770 | 6,774 | 5,750 | 11,412 |
| ඔක්තෝබර් | 25,300 | 22,427 | 23,481 | 21,732 | 27,810 | 24,243 | 5,854 | 12,100 |
| නොවැම්බර් | 23,106 | 21,557 | 18,807 | 24,481 | 8,993 | 18,891 | 5,126 | 12,528 |
| දෙසැම්බර් | 26,409 | 21,339 | 18,100 | 18,180 | 7,822 | 14,374 | 5,211 | 15,246 |
| **එකතුව** | **204,758** | **212,106** | **232,434** | **271,525** | **225,665** | **193,435** | **106,535** | **109,149** |

* 2019 වසරේ උද්ගත වූ කෙසෙල් පැල විකෘති ගැටලුවක් හේතුවෙන් ශාක නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් පහත වැටුණු අතර උප වගා කිරීමේ අදියර (sub culture stages) 11 සිට 6 දක්වා අඩු විය. එය 2020 සහ 2021 වසරවල නිෂ්පාදනයට බල පෑ අතර COVID 19 වසංගත තත්ත්වය ද එයට අහිතකර ලෙස බලපෑවේය. කෙසේ වෙතත්, 2021 දී, වසංගත කාලසීමාව තුළ රසායනාගාර කාර්ය මණ්ඩලය රොස්ටර් පදනම මත වැඩ කළද ඉලක්ක සමඟ වැඩ කිරීම නිසා සුළු ප්‍රගතියක් ඇති විය.




**රූපසටහන 02 : 2014-2021 පැළ නිෂ්පාදනය සංසන්දනය කිරීම**

පසුගිය වසර හතක කාලය තුළ එකතු කරන ලද දත්ත අනුව, ජනවාරි සිට අප්‍රේල් දක්වා සහ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ ඉහළ ඉල්ලුමක් පවතින කාලපරිච්ඡේද රටාව පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, 2021 දී, COVID 19 වසංගත තත්වය පැළ නිශ්පාදනය කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය.

**2021 වසරේ කෙසෙල් පැළ නිෂ්පාදනය සංසන්දනය**

සමස්ත නිෂ්පාදනයෙන් 98% ක්ම ඇඹුල් කෙසෙල් පැළ සඳහා වන අතර ඉතිරි 2% කෝලිකුට්ටු කෙසෙල් ප්‍රභේදය මඟින් නියෝජනය වේ.

**පැළ අලෙවිය සැසඳීම**

පටක රෝපණ කෙසෙල් පැළ සඳහා ඇති ඉල්ලුම දේශගුණික තත්ත්වය මත රඳා පවතින අතර වර්ෂා කාලවලදී (සැප්තැම්බර් සිට අප්‍රේල්) ඉහළම ඉල්ලුමක් සහ වියළි කාලවල දී (මැයි සිට අගෝස්තු) අඩු ඉල්ලුමක් වාර්තා වී ඇත. වර්ෂා රටාව වගාව කෙරෙහි සෘජුවම බලපාන අතර ගොවීන් වර්ෂා කාලවල දී පටක රෝපණ කෙසෙල් පැළ විශාල ප්‍රමාණයක් වගා කරයි. මෙම කාලය තුළ විශේෂයෙන් දෙසැම්බර් සහ අප්‍රේල් උත්සව කාලය තුළ කෙසෙල් කැන් සඳහා අධික ඉල්ලුමක් පවතින බැවින් එම කාලය ඉලක්ක කර ගනිමින් ගොවීන් කෙසෙල්

වගාවේ නිරත වේ. එමනිසා, මෙවැනි හිතකර දේශගුණික සාධක සහ වෙළෙඳ පොලේ ඉල්ලුම සලකා බලමින් ගොවීන් පටක රෝපණ කෙසෙල් පැළ මිලදී ගනී. කෙසේ වෙතත්, 2021 දී, COVID 19 වසංගත තත්ත්වය පැළ අලෙවිය සැලකිය යුතු ලෙස අඩු කිරීම කෙරෙහි අහිතකර ලෙස බලපෑවේය.

**වගු අංක 18 : පසුගිය වසර අට තුළ පැළ අලෙවිය සැසඳීම (සංඛ්‍යාව)**

| මාසය | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 |
|---|---|---|---|---|---|---|---|---|
| ජනවාරි | 10,823 | 14,672 | 21,738 | 17,980 | 17,759 | 3,851 | 27,222 | 5,551 |
| පෙබරවාරි | 6,816 | 18,427 | 17,950 | 22,141 | 12,738 | 9,704 | 526 | 2,712 |
| මාර්තු | 2,715 | 19,835 | 14,924 | 22,536 | 26,232 | 2,344 | 4,292 | 5,048 |
| අප්‍රේල් | 7,697 | 20,579 | 13,721 | 21,467 | 15,259 | 11,524 | 19,668 | 5,617 |
| මැයි | 7,113 | 12,531 | 12,830 | 19,652 | 18,968 | 4,923 | 7,434 | 5,785 |
| ජූනි | 3,381 | 15,132 | 13,527 | 20,780 | 6,489 | 6,211 | 10,956 | 6,222 |
| ජූලි | 3,680 | 12,682 | 11,490 | 20,576 | 11,049 | 7,008 | 14,276 | 6,348 |
| අගෝස්තු | 18,404 | 12,954 | 19,465 | 21,097 | 13,454 | 15,425 | 9,106 | 6,820 |
| සැප්තැම්බර් | 11,766 | 20,943 | 18,837 | 20,877 | 7,697 | 21,701 | 5,791 | 7,384 |
| ඔක්තෝබර් | 18,498 | 15,151 | 22,040 | 22,302 | 19,692 | 5,988 | 5,169 | 8,514 |
| නොවැම්බර් | 25,705 | 16,656 | 17,327 | 21,137 | 19,349 | 12,744 | 2,810 | 5,759 |
| දෙසැම්බර් | 13,369 | 24,595 | 20,884 | 20,530 | 14,405 | 8,027 | 4,658 | 7,212 |
| **එකතුව** | **129,967** | **204,157** | **204,733** | **251,075** | **183,091** | **109,450** | **111,908** | **72,972** |




**රූප සටහන 03: 2014-2021 වර්ෂ තුල පැළ අලෙවිය සැසඳීම**

**වගු අංක 19 : අලෙවි කරන ලද පැළ සංඛ්‍යාව අනුව පැළ අලෙවිය සැසඳීම– 2021**

| විස්තරය | පැළ සංඛ්‍යාව |
|---|---|
| පැළ අලෙවිය 100> | 3,690 |
| පැළ අලෙවිය 100< | 69,289 |




**රූප සටහන 04: 2021 වර්ෂයේ පැළ අලෙවිය**

**වගු අංක 20 : ප්‍රභේද අනුව පැළ අලෙවිය - 2021**

| ප්‍රභේදය | පැළ සංඛ්‍යාව |
|---|---|
| ඇඹුල් | 71,537 |
| කෝලිකුට්ටු | 1,442 |




**රූප සටහන 05: ප්‍රභේද අනුව පැළ අලෙවිය**

2020 වර්ෂය තුළ පටක රෝපිත කෙසෙල් පැළ අලෙවියෙන් මිලියන 5.9 ක ආදායමක් උපයා ගැනීමට ආයතනයට හැකි විය. ක්ෂේත්‍රය තුළ රෝග වැළඳීමේ හැකියාව අඩු මට්ටමක පැවතීම හේතුවෙන් ඉහළ ඉල්ලුමක් සහිත ප්‍රභේදය ඇඹුල් කෙසෙල් වූ අතර වසර පහක කාලයක් දක්වා ඉහල ඉපයීම් ශක්‍යතාවක් පවත්වාගෙන තිබේ. දෙවන පරම්පරාවේදී ඇතිවන දරුණු පැනමා රෝගය හේතු කොට ගෙන තනි පැළ කළමනාකරණ ක්‍රමය යටතේ ගොවීන් කෝලිකුට්ටු කෙසෙල් වගා කරනු ලබයි. මිටි කැවෙන්ඩිෂ් නැමැති කෙසෙල් ප්‍රභේදය තෙත් කලාපය සඳහා පමණක් නිර්දේශ කල හැකි අතර, ඒ සඳහා අඩු ඉල්ලුමක් පවතින අතර ඉතාමත් සීමිත තෙත් කලාපීය ගොවීන් පිරිසක් සඳහා ආයතනය විසින් පහසුකම් සලසනු ලබයි.

පටක රෝපිත කෙසෙල් සඳහා පවතින ඉල්ලුම සාම්ප්‍රදායිකව නිෂ්පාදිත පැළ සඳහා පවතින ඉල්ලුමට වඩා ඉහල මට්ටමක පවතින අතර, දිගුකාලීන ලාභදායිත්වය සහ රෝගවලට භාජනයවීම අඩු වීම හේතු කොට ගෙන ඇඹුල් කෙසෙල් සඳහා පවතින ඉල්ලුම වැඩිවිය. ආයතනය සමග සම්බන්ධව කටයුතු කරන ගොවීන්ගෙන් බහුතරයක් (42%) නියෝජනය කරනුයේ ඉහළ මිලදී ගැනීමේ හැකියාවක් පවතින ගොවීන් වන අතර මිල

දී ගැනීමේ හැකියාව අඩු මට්ටමක පවතින ගොවීන් ආයතනය සමඟ සම්බන්ධ වී ඇත්තේ ඉතා අඩු ප්‍රමාණයකි (58%).

**වගු අංක 21: 2021 වර්ෂයේ ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව**

| ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව | ගොවීන් සංඛ්‍යාව |
|---|---|
| පැළ 100 කට වඩා වැඩියෙන් මිලදී ගත් ගොවීන් සංඛ්‍යාව | 81 |
| පැළ 100 කට වඩා අඩුවෙන් මිලදී ගත් ගොවීන් සංඛ්‍යාව | 113 |




**රූප සටහන 06: 2021 වර්ෂයේ ගොවීන්ගේ මිලදී ගැනීමේ හැකියාව**

ආයතනය මගින් අඩු මිල ගණන් යටතේ දේශීය ගොවීන්ට කෙසෙල් පැළ ලබාදෙන අතර ලංකාවේ දුරස්ථ ප්‍රදේශ නියෝජනය කරමින් ගොවීන් රැසක් ආයතනය සමඟ සම්බන්ධව කටයුතු කරයි. ආයතනයේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය විසින් එම වගාවන් විධිමත්ව නියාමනය කරමින් ඔවුන්ට අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම ලබා දේ. පටක රෝපණ කෙසෙල් පැළ වගා කරන ගොවි ප්‍රජාව රටපුරා ව්‍යාප්ත කිරීම සඳහා ආයතනයේ ක්ෂේත්‍ර නිලධාරීන් ක්‍රමානුකූලව ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කරන ලදී.

**පටක රෝපණ කෙසෙල් පැළ සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය**

පටක රෝපණ තාක්ෂණය යනු අපුනි තත්වයන් යටතේ කෘතිම මාධ්‍ය උපයෝගී කර ගනිමින් වෛරස් වලින් තොර දුහිතෘ ශාක (මාතෘ පටක) නිෂ්පාදනය කිරීමයි. එම නිසා තාක්ෂණය විශේෂිත වන අතර එබැවින් මාතෘ පටක පිහිටුවීමේ සිට දැඩිකිරීම ආරම්භ කරන තෙක් වන සියළුම ක්‍රියා කාරකම් සඳහා දක්ෂ එමෙන්ම නිපුණතාවයෙන් හෙබි සේවක පිරිසක් අවශ්‍ය වේ. දර්ශීය ලෙස, පටක රෝපණ තාක්ෂණය ප්‍රධාන පියවරයන් පහක් ඔස්සේ සිදුකරණු ලබන අතර, එනම්, නිරෝගී හා දිරිමත් මාතෘ ශාක වරණය (තෝරා ගැනීම), කෘතිම පෝෂණ මාධ්‍යක් තුළ මාතෘ ශාක කොටස් පිහිටු වීම, අංකුර ජනන අවධිය, මුල් වර්ධන අවධිය හා පැළ දැඩි කිරීමේ අවධියයි. අග්‍රස්ථ විභාජක රෝපණය මගින් කෙසෙල් පැළ නිෂ්පාදනය ආයතනය තුළ සිදුකරන අතර නිෂ්පාදනයේ ගුණාත්මය හා විකෘති තත්ව අඩු කිරීම සඳහා උපායමාර්ගික පියවරයන් ගනු ලබයි. ඉතා උසස් තත්වයේ සම්මත පරාමිතීන් ජීවානුහරණ ක්‍රියාවලි සඳහා යොදාගනු ලබන අතර උපවගා මට්ටම් (sub culture stages) 8 ක උපරිම ප්‍රමාණයක් භාවිතා කරනු ලැබේ. ක්‍රමවත් හා පරිපූර්ණ ලෙස දත්ත වාර්ථා තැබීම තුළින් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවකදී අදාල මාතෘ පටකය පිළිබඳව සියළුම විස්තර පහසුවෙන් ලබාගත හැකිය. සේවක පිරිසගේ යෝග්‍යතාවය සහ ධාරිතාවය මත නිවරදි ලෙස ඔවුන් සුදුසු නිෂ්පාදන අවස්ථාවේ පිහිටුවා ඇත.




**රූප සටහන 07: පටක රෝපණ කෙසෙල් පැළ සම්බන්ධ නිෂ්පාදන ක්‍රියාවලිය**

**3. පර්යේෂණ සහ නවෝත්පාදන**

පර්යේෂණ මාතෘකා වල අදහස වෙනස් විය හැකි බැවින් එම මාතෘකා සිංහලට පරිවර්තනය නොකරන ලදී.

**2021 දී දේශීයව සිදු කළ ප්‍රකාශන**

1. Anuruddi, H. I. G. K., Samarasinghe, K. P., Rifnas, L. M., Weerasinghe, S. S., (2021) Eco-Friendly Bio Prills with Water Hyacinth (*Eichhornia Crassipes*) To Raise Nursery Plants, *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 4

2. Anuruddi, H. I. G. K., Samarasinghe, K. P., Rifnas, L. M., Weerasinghe, S. S., (2021) Water Hyacinth Based Organic Grow Bags for Urban Gardening, *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 5

3. Samarasinghe, K. P., Anuruddi, H. I. G. K., Rifnas, L. M., Weerasinghe, S. S. (2021) Grow Bags from Banana (*Musa Spp*) Pseudo Stem for Urban Farming, *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 6

4. Madushani, W. G. C., Dodampe, I. C., Weerasinghe, S. S. (2021) Technique to Remove the Ash Adhered on Banana (*Musa Spp*) Leaves Before Curing as Food Wrappers, *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 7

5. Sandaruwan, H. M. A. Y. A., Anuruddi, H. I. G. K., Weerasinghe, S. S., Saneer, M. F. A., (2021) Effect of Organic Manure on Performances of Paddy (*Oryza Sativa*) Cultivation in Ampara District, *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 8

6. Bandusekara, B. S., Weerasinghe, S. S., Wijesinghe, K. G. G., (2021) YIELD AND PEELING PERFORMANCES OF CLONAL-CUTTINGS AND SEEDLINGS OF CINNAMON (*Cinnamomum Zeylanicum*) *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 18

7. Ketipearachchi, K. G., Subasinghe, S., Vidanapathirana, N. P., Silva, T. D., (2021) Morphological Characterization of Terminalia Catappa L. (*Tropical Almond*) In Galle District, Sri Lanka. *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 24

8. Kumara, K., Nelka, S. A. P., Subasinghe, S., Vidanapathirana, N. P., Anuruddhi, H. I. G. K., (2021) Effects of Seed Treatments and Growing Media on Germination of Vara (*Calotropis Gigantea*) Seeds. *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 26

9. Kumari, H. K. S. N., Rohanadheera, H., Vidanapathirana, N. P., (2021) Development of An In-Vitro Propagation Protocol to Induce Suckers from Sour Banana, *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 27

10. Tharanga, S. J., Vidanapathirana, N. P., Siriwardana, A. J. M. C. M., (2021) Effects of Cinnamon (*Cinnamomum Zeylanicum*) Powder Extract Against the Pests of Radish (Raphanus Raphanistrum Subsp. Sativus) *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 28

11. Kumara, M. M. P. A., Anuruddi, H. I. G. K., Weerasinghe, S. S., Somachandra, M. N., (2021) Effect of Different Soil Amendments on Soil Moisture Retention and Bean (*Phaseolus Vulgaris*) Crop Growth. *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 34

12. Kumara, T. T. M., Anuruddi, H. I. G. K., Madushani, W. G. C., Weerasinghe, S. S., (2021), Formulation, Evaluation and Antibacterial Efficiency of Aloe Vera-Based Herbal Hand Sanitizer. *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 47
13. Chandimala, U. R.., Arampath, P. C., (2021), Review: Association In-Between Food Additives and Non-Communicable Diseases in Modern World, *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 48

14. Sarangi, W. G. K., Siriwardena, B. P., Dhanushka, T. G. B., Vidanapathirana, N. P., (2021) Farmer Awareness on Agro-Chemical's Application in Sooriyawewa of Hambantota District in Sri Lanka – A Case Study, *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 48

15. Chandimala, U. R., Vidanapathirana, N. P., Rifnas, L. M., (2021) A Study on Perception of Sri Lankan Society on Cultured Meat. *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 50

16. Herath, H. M. M. T., Kumara, H. K. R. S., Anuruddi, H. I. G. K., (2021) Consumer and Producer Concerns on Quality of Dried Fish in Hambantota District, *Proceedings of the 2nd National Symposium on Agro-Technology and Rural Sciences (NSATRS).* 28th June 2021. Pp 51

**2021 දී විද්‍යීයව සිදු කළ ප්‍රකාශන**

**Journal Papers**

1. Rifnas L.M., Vidanapathirana N. P., Silva T. D., Dahanayake N., Subasinghe S., Weerasinghe S. S., Madushani W. G. C., Nelka S. A. P. and Rohanadeera H. (2021), Vegetative propagation of Acalypha hispida through cuttings with different types of media-minor fruits, International Journal of Minor Fruits and Medicinal Plants

2. Gamage, L.K.T., Thushari G.G.N., Atapaththu K.A,S., H.K.R.S. Kumara, Senevirathna J.D.M., (2021) Diversity, Length-Weight Relations, and Condition Factor of Sea Cucumbers in Three Coastal Areas Along the Southern Coast of Sri Lanka: A Case Study, Turkish Journal of Fisheries and Aquatic Sciences- HKRS Kumara

**ABSTRACTS**

1. Ketipearachchi, K.G., Vidanapathirana, N.P., Somachandra, K.P., Mangalika, W.P.W., (2021) Influence of integrated plant nutrient management using "Newly Modified Panchagavya" and "Albert Solution" on growth and yield parameters of *Capsicum annuum* (Variety - Muria 358 F1) under polytunnel cultivation, Proceeding of the International Symposium on Agriculture and Environment (ISAE 2021) University of Ruhuna, Sri Lanka,7th May 2021, Pp 78

2. Ketipearachchi, K.G., Vidanapathirana, N.P., Wickramasinghe, M., Weerasinghe, W.K., (2021) Enhancement of seed germination by pre-plant treatments of *Cyrtostachys renda* (Red palm), Proceeding of the International Symposium on Agriculture and Environment (ISAE 2021) University of Ruhuna, Sri Lanka, 7th May 2021, Pp 95.

**Research proposals Submitted**

1. The project on "Implementation of the Special Initiative for Improving English Through Blended Learning at UCIARS" submitted to the AHEAD-ICE.

2. About ten research proposals were submitted to the Sri Lanka Council for Agriculture Research Policy.

i. Utilization of disused banana fruits for value added product development.
ii. Establishment of Agri-business incubator as a tool for accelerating agricultural entrepreneurship.
iii. Development of Bio Pesticide for Papaya Mealybug (*Paracoccus marginatus*) using Commonly Available Medicinal Plant Extracts .
iv. Evaluation of the performances of different traditional and improved rice (Oryza sativa L.) varieties for organic manure application.
v. Development of a mass propagation protocol for *Cleistanthus collinus* (Gaja madara) as a natural deterrent for crop raiding elephants.
vi. Foliage of different Cassia species as an alternative feed for growing goats in Sri Lanka
vii. Development of Eco friendly weed management techniques in commercial cultivation of Pineapple (Ananas comosus
viii. Development of liquid fertilizer to promote growth and yield performances of Chili (Capsicum annum) and Tomato (Lycopersicon esculentum.
ix. Development of a protocol for muzle cell isolation and production of invitro meat in Sri Lanka. Submitted to the Ministry of Agriculture

3. Banana fiber: Environmentally Sustainable Alternative for Synthetic Fiber - Submitted to the Indian Agriculture Research Council.

**නවෝත්පාදනයන්**

1. ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) යාවත්කාලීන කිරීම සඳහා මෘදුකාංගයක් සංවර්ධනය කිරීම

ආයතනයේ LMS පරිපාලකයින් විසින් LMS හි පවතින ලිපිගොනු ප්‍රතිව්‍යුහගත කර කොළඹ විශ්ව විද්‍යාලයේ පද්ධතිය තුළ ගොනු තදබදය මුදා හැරීම සඳහා යාවත්කාලීන කරන ලදී.

2. කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) හඳුන්වා දීම

මෙම පද්ධතිය සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පුද්ගලයන් සහ ආයතනය පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඉක්මන් ප්‍රවේශයක් ලබා දෙයි. මෙම හඳුන්වා දීම වර්තමානයේ අතිශය සීමිත කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාවක් විසින් උර දී ඇති කඩිනම් සහ නිවැරදි පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා අතිමහත් සහයෝගයකි.

3. Catharansus roseas හි විකෘති ශාකයක් නිෂ්පාදනය කිරීම

ඉරි සහිත පෙති සහිත ආකර්ෂණීය මල් තිබීම විකෘති අභිජනනය හරහා වර්ධනය විය. සාමාන්‍යයෙන්, මෙම විකෘති මල් වගා කර්මාන්තයේ නොපවතින අතර කොළඹ විශ්ව විද්‍යාලයේ යුනිවර්සිටි බිස්නස් ලින්ක් හි මගපෙන්වීම සමඟ වාණිජ හවුල්කරුවෙකු සම්බන්ධව වාණිජ මට්ටමින් ඒවා නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරයි. මෙම නව නිපැයුම එස්.ඒ.පී.නෙල්කා මහත්මිය විසින් AHEAD – ICE ව්‍යාපෘතිය යටතේ කණ්ඩායමක හෝ අධීක්ෂකවරුන්ගේ මගපෙන්වීම සමඟ සිදු කර ඇත.



ඉරි සහිත පෙති සහිත මල් සහිත විකෘති ශාකය

4. මිරිදිය මාළු තිලාපියා (Oreochromis niloticus) සඳහා ප්‍රෝටීන් බහුල ආහාර නිෂ්පාදනය

වෙළඳපොලේ ඇති මිල අධික මාළු කෑම වෙනුවට ආදේශකයක් ලෙස රුධිරය ආශ්‍රිත ආහාර වේලක් හඳුන්වා දී ඇත. දැනට වෙළඳපොලේ පවතින මත්ස්‍ය ආහාරවල නිහකම, අධික මිල සහ දුර්වල ගුණාත්මක බව සමහර බාධාවන් වේ. සත්ව රුධිරයේ අපද්‍රව්‍ය නව නිපැයුමට ඇතුළත් කර ඇති අතර එය මාළු පැටවුන්ගේ වර්ධනය සාර්ථකව වැඩි දියුණු කරයි.



මිරිදිය ධීවර කර්මාන්තය සඳහා රුධිර ආහාර වේලක්

5. නාගරික කෘෂිකර්මාන්තය සඳහා ජලජ වල් පැලෑටි සහිත පරිසර හිතකාමී වර්ධන ව්‍යුහයන්: පෙති සහ රොටි

කෘත්‍රිම බහාලුම් සහ කොහු කුඩු සහිත මාධ්‍ය සඳහා ආදේශකයක් ලෙස ආක්‍රමණශීලී ජලජ වල් පැළෑටියක් පරිසර හිතකාමී බහාලුම්වල නිපදවා ඇත. ඒවා බරින් අඩු වන අතර නාගරික ප්‍රදේශවල බහුලව දක්නට ලැබෙන සීමිත ඉඩ ප්‍රමාණයක සිරස් ගොවිතැන සඳහා වඩාත් සුදුසු වේ. මෙය ජලය අවශෝෂණය කර දිගටි ව්‍යුහයක් ලෙස ප්‍රසාරණය වේ. ආචාර්ය සුජාතා වීරසිංහ (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I/UCIARS) මහත්මියගේ මගපෙන්වීම මත අනුරුද්ධි කෝකිලා මෙනවිය (තාවකාලික ශිල්ප ප්‍රදර්ශක/UCIARS), L.M.රිෆ්නාස් (කථිකාචාර්ය (පරිවාස)/UCIARS), කැලුම් ප්‍රසාද් සමරසිංහ මහතා විසින් මෙම නව නිපැයුම වැඩි දියුණු කරන ලදී.



ජලජ වල් පැලෑටි වලින් ලබාගත් වර්ධන ව්‍යුහය

6. වයින් කොමඩු (Benincasa hispida) සඳහා ඇතුළත් කළ බිත්තර පළතුරු (Pouteria campechiana) සමග ජෑම්

UCIARS පාඨමාලා සම්බන්ධීකාරක B. P. සිරිවර්ධන මහතාගේ මගපෙන්වීම ඇතිව පර්යේෂණ ශිෂ්‍යයෙකු වන M.G.D.P ජයලත් මහතා විසින් අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස අඩු ප්‍රයෝජනයට නොගත් බිත්තර පලතුරක් යොදා ගනිමින් පෝෂණීය ජෑම් වර්ගයක් නිෂ්පාදනය කර ඇත. මෙම ජෑම් බිත්තර පලතුරු වලින් පැමිණි ස්වභාවික බිත්තර කහ පැහැයක් ඇත.



**බිත්තර පළතුරු මත පදනම් වූ ජෑම්**

7.රතු වට්ටක්කා වලින් බිස්කට් (වට්ටක්කා)

රතු වට්ටක්කා යනු අලෙවි තෘෂ්ණාව ඇති එළවළුවක් වන අතර එය විශාල පසු අස්වනු අලාභයක් සිදු කරයි. ඊට විසඳුමක් ලෙස රතු වට්ටක්කා යොදා ගනිමින් බිස්කට් නිෂ්පාදනය කර ඇති අතර එය පෝෂ්‍යදායී, ස්වාභාවික වර්ණයෙන් හා රසයෙන් මිහිරි ය. පාඨමාලා සම්බන්ධීකාරක/UCIARS B.P.සිරිවර්ධන මහතාගේ මගපෙන්වීම ඇතිව පර්යේෂණ ශිෂ්‍ය L.M.පෙරේරා මහතා විසින් මෙය නිර්මාණය කර ඇත.



8.Invitro propagated කෝමාරිකා සහ කහ පැල නිෂ්පාදනය

සාමාන්‍යයෙන්, කෝමාරිකා මව් පටක මගින් ශාකමය වශයෙන් ප්‍රචාරණය වන අතර කහ ඉහුරු මගින් ප්‍රචාරණය වේ. කෙසේ වෙතත්, මෙම භෝග දෙකෙහිම රෝපණ ද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම සපුරාලීම දුෂ්කර බැවින් ආගන්තුක ප්‍රචාරණය ආරම්භ කරන ලදී. නව යෝජනා දෙකක් සකස් කර ඇති අතර දැනට වාණිජ පරිමාණයෙන් ශාක සාර්ථකව නිෂ්පාදනය කරයි. මෙම උත්සාහය ආයතනයට ද ආදායමක් උපයා ගැනීමට උපකාරී වේ. විද්‍යා ත්මක සහකාර එච්.රෝහණධීර මහතා විෂය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් කැපී පෙනෙන උනන්දුවක් ඇති නිපුණතාවයක් සහ ප්‍රවීණත්වයක් ඇති මෙම වැඩසටහන භාරව කටයුතු කරයි.





**පේටන්ට් බලපත්‍ර සහ ගිවිසුම්**

පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කිරීම

නව නිපැයුම් හතරක් සඳහා පේටන්ට් බලපත්‍ර ඉල්ලා අයදුම්පත් හතරක් (04) ඉදිරිපත් කර ඇත; ආයතනය විසින් නිෂ්පාදන තුනක් සහ එක් තාක්ෂණික සංවර්ධනය කිරීමක් ද ඇතුලත්ව පහත සඳහන් පරිදි වේ.

i. *Acalypha hispida* plant with multi coloured inflorescence (බහු වර්ණ පුෂ්ප මංජරිය සහිත Acalypha hispida ශාකය)

ii. Banana coins developed with banana pseudo stems for raising seedlings (බීජ පැල ඇති කිරීම සඳහා කෙසෙල් ව්‍යාජ කඳන් භාවිතයෙන් නිපදවන ලද කෙසෙල් කාසි)

iii. A machine to fabricate bio pots with Banana pseudo stems (කෙසෙල් ව්‍යාජ කඳන් භාවිතයෙන් ජෛව භාජන නිපදවීමේ යන්ත්‍රයක්

iv. Rapid propagation technique along with potting media for *Alamanda cathertica* ( Rukatthana) (Alamanda cathertica (රුකත්තන) සඳහා භාජන මාධ්‍ය සමඟ වේගවත් ප්‍රචාරණ තාක්ෂණය)

ඒ අතරින් පේටන්ට් බලපත්‍ර දෙකක් කොළඹ විශ්ව විද්‍යාලයේ යුනිවර්සිටි බිස්නස් ලින්ක් මගින් ජාතික බුද්ධිමය දේපල සංවිධානයට (NIPO) ඉදිරිපත් කර ඇති අතර අනෙකුත් පේටන්ට් බලපත්‍ර UBL විසින් සකස් කරමින් පවතී.

**අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම (Signing MOUs)**

නව නිපැයුම් වාණිජකරණය කිරීම සඳහා ආයතනය ව්‍යාපාරික හවුල්කරුවන් හතර දෙනෙකු සමඟ අවබෝධතා ගිවිසුම් හතරක් අත්සන් කර ඇත. ඉන් දෙකක් කොළඹ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් (OTS) වෙත ඉදිරිපත් කර ගිවිසුම් අත්සන් කර ඇත. මෙම අවබෝධතා ගිවිසුම් හා සම්බන්ධ බලපත්‍ර ගිවිසුම් ද OTS වෙත ඉදිරිපත් කර අදාල කටයුතු සඳහා යොමු කර ඇත.

## 4. පුහුණු, වැඩමුළු සහ කාර්ය මණ්ඩල සංවර්ධනය

2021 වර්ෂය තුළ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් මාර්ගගතව පුහුණු වැඩසටහන් සහ වැඩමුළු කිහිපයකට සහභාගී වූ අතර පහත වගුවේ විස්තර කර ඇති පරිදි අධ්‍යයන කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා සම්බන්ධ විය.

**වගු අංක 22: අධ්‍යයන කාර්‍ය මණ්ඩලය සහභාගී වූ වැඩසටහන්**

| අංක | සේවකයාගේ නම | තනතුර | සහභාගී වූ වැඩසටහන් |
|---|---|---|---|
| 1 | බී.එස්.බන්දුසේකර මහතා | කථිකාචාර්ය (පරිවාස) | 1. BRITAE කණ්ඩායම විසින් මෙහෙයවන ලද ව්‍යාත්තීය සංවර්ධන වැඩමුළුව-BRITAE ව්‍යාපෘතිය 2021.09.19 දින (මාර්ගගත ක්‍රමවේදය හරහා)<br>2. 2021 ඔක්තෝම්බර් මස පැවැත්වුණු DATC, හොරණ හතු වගාව පිළිබඳ පුහුණු වැඩසටහන (මාර්ගගත ක්‍රමවේදය හරහා)<br>3. AMP Induction 2021 වැඩසටහන කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන උපදේශන වැඩසටහන මගින් කොළඹ විශ්ව විද්‍යාලයේ මුල් කාලීන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2021.07.02 දින (zoom හරහා) පවත්වන ලදී. |
| 2 | ඒ.ජේ.එම්.සී.එම්. සිරිවර්ධන මහතා | කථිකාචාර්ය (පරිවාස) | AMP Induction 2021 වැඩසටහන කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන උපදේශන වැඩසටහන මගින් කොළඹ විශ්ව විද්‍යාලයේ මුල් කාලීන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2021.07.02 දින (zoom හරහා) පවත්වන ලදී. |
| 3 | යූ.ආර්.චන්දිමාලා මෙනවිය | කථිකාචාර්ය (පරිවාස) | AMP Induction 2021 වැඩසටහන කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන උපදේශන වැඩසටහන මගින් කොළඹ විශ්ව විද්‍යාලයේ මුල් කාලීන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2021.07.02 දින (zoom හරහා) පවත්වන ලදී. |
| 4 | එල්.එම්.රිෆ්නාස් මහතා | කථිකාචාර්ය (පරිවාස) | AMP Induction 2021 වැඩසටහන කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන උපදේශන වැඩසටහන මගින් කොළඹ විශ්ව විද්‍යාලයේ මුල් කාලීන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2021.07.02 දින (zoom හරහා) පවත්වන ලදී. |
| 5 | කේ.ජී.කෙටිපෙආරච්චි මෙනවිය | කථිකාචාර්ය (පරිවාස) | 1. AMP Induction 2021 වැඩසටහන කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන උපදේශන වැඩසටහන මගින් කොළඹ විශ්ව විද්‍යාලයේ මුල් කාලීන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2021.07.02 දින (zoom හරහා) පවත්වන ලදී.<br>2. ශිෂ්‍ය උපදේශකයින් සඳහා වූ පුහුණු වැඩසටහන 2021/2022 කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය උපදේශක ඒකකය විසින් 2021.06.07, 2021.06.14, 21/06/2021, 28/06/2021, 05/07/2021, 08/07/2021 සහ 15/07/2021 දින පවත්වන ලදී (මාර්ගගත ක්‍රමවේදය හරහා).<br>3. කොළඹ විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති විසින් 2021.10.12 දින පවත්වන ලද ටර්නිටින් පිළිබඳ වැඩමුළුව (මාර්ගගත ක්‍රමවේදය හරහා). |
| 6 | එස්.ඒ.පී.නෙල්කා මහත්මිය | පාඨමාලා සම්බන්ධීකාරක | ශිෂ්‍ය උපදේශකයින් සඳහා වූ පුහුණු වැඩසටහන 2021/2022 කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය උපදේශක ඒකකය විසින් 2021.06.07, 2021.06.14, 21/06/2021, 28/06/2021, 05/07/2021, 08/07/2021 සහ 15/07/2021 දින පවත්වන ලදී (මාර්ගගත ක්‍රමවේදය හරහා). |

| | | | |
|---|---|---|---|
| 7 | එස්.එල්.නවරත්න මහත්මිය | පාඨමාලා සම්බන්ධීකාරක | 1. Turnitin භාවිතයෙන් ඔබේ පීඨ උපදේශකයින් පුහුණු කරන්නේ කෙසේද යන්න පිළිබඳ පුහුණු වැඩසටහන: 2021.06.02 දින පැවති කොළඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මගින් පවත්වනු ලැබූ සැබෑ පන්ති අත්දැකීම් සමඟ (මාර්ගගතව)<br>2. 2021.01.19 දින පැවති කොළඹ විශ්ව විද්‍යාලයේ Blended Learning Committee විසින් පවත්වන ලද H5P භාවිතයෙන් අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම් අන්තර්ගතයන් නිර්මාණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය (මාර්ගගතව)<br>3. ශ්‍රී ලංකා ජාතික වැව්ලි කළමනාකරණ ආයතනය විසින් 2021.06.07 දින පවත්වන ලද සැමට ස්ථීරභාවයේ සහ සෞභාග්‍යයේ ආර්ථිකය සඳහා පුනර්ජනනීය කාබනික ගොවිතැන පිළිබඳ සම්මන්ත්‍රණය (මාර්ගගතව)<br>4. විදේශයන්හි උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්වයක්/ශිෂ්‍යත්වයක් සඳහා ඵලදායී පර්යේෂණ යෝජනාවක් සකස් කරන්නේ කෙසේද යන්න පිළිබඳ සම්මන්ත්‍රණය? ශ්‍රී ලංකාවේ ජාතික විද්‍යා පදනම විසින් 2021.08.12 දින පවත්වන ලදී (මාර්ගගතව)<br>5. ඝන කාබනික අපද්‍රව්‍ය සඳහා යොදන අධෝරක්ත වර්ණාවලීක්ෂය පිළිබඳ සම්මන්ත්‍රණය: 2021.12.15 දින ජපානයේ කෝබේ විශ්වවිද්‍යාලයේ කෘෂිකාර්මික විද්‍යා උපාධි පාසැලේ Aquaphotomics පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ ජල බලපෑම් වළක්වා ගන්නේ කෙසේද යන්න පිළිබඳව (අන්තර්ජාලය හරහා) |
| 8 | බී.පී.සිරිවර්ධන මහතා | පාඨමාලා සම්බන්ධීකාරක | AMP Induction 2021 වැඩසටහන කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයන උපදේශන වැඩසටහන මගින් කොළඹ විශ්ව විද්‍යාලයේ මුල් කාලීන අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2021.07.02 දින (zoom හරහා) පවත්වන ලදී. |

**වගු අංක 23: අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධ වූ පශ්චාත් උපාධි පාඨමාලා**

| අංක | සේවකයාගේ නම | තනතුර | පශ්චාත් උපාධි පාඨමාලාව |
|---|---|---|---|
| 1 | බී.එස්.බන්දුසේකර මහතා | කථිකාචාර්ය (පරිවාස) | Ph.D. (Reading) , කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය (2018-2023) |
| 2 | යූ.ආර්.වන්දිමාලා මෙනවිය | කථිකාචාර්ය (පරිවාස) | M.Sc. in Food Science and Technology , කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය (2018.09.29-2021.11.11) |
| 3 | ඒ.ජේ.එම්.සී.එම්. සිරිවර්ධන මහතා | කථිකාචාර්ය (පරිවාස) | M.Phil. in Crop Science, බෝග විද්‍යා දෙපාර්තමේන්තුව කෘෂිකර්ම පීඨය, උපාධි අධ්‍යයන පීඨය - රුහුණු විශ්වවිද්‍යාලය (30.11.2021) |
| 4 | එල්.එම්.රිෆ්නාස් මහතා | කථිකාචාර්ය (පරිවාස) | M.Phil. (Reading) , කොළඹ විශ්ව විද්‍යාලය (2019-2022) |
| 5 | කේ.ජී.කෙටිපෙආරච්චි මෙනවිය | කථිකාචාර්ය (පරිවාස) | M.Phil. in Plant Science (Reading), ශාක විද්‍යා දෙපාර්තමේන්තුව, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය (2020-2022) |
| 6. | එස්.ඒ.පී.නෙල්කා මහත්මිය | එස්.ඒ.පී.නෙල්කා මහත්මිය | M.Phil. (Reading) , කොළඹ විශ්ව විද්‍යාලය (2019-2022) |

**වගු අංක 24 : අනධ්‍යයන කාර්ය මණ්ඩලය සම්පූර්ණ කළ පාඨමාලා සහ සහභාගී වූ පුහුණු වැඩසටහන්**

| අංක | සේවකයාගේ නම | තනතුර | සහභාගී වූ වැඩසටහන් |
|---|---|---|---|
| 1 | එස්.ඒ.එස්.ප්‍රියදර්ශනී මහත්මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 2021.11.03 සිට 2021.12.12 දක්වා මුදල් අමාත්‍යාංශයේ මිලෝදා මූල්‍ය අධ්‍යයන ඇකඩමිය විසින් පවත්වනු ලැබූ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සම්පූර්ණ කිරීම (මාර්ගගතව) |
| 2. | ආර්.ඒ.එම්.දිල්හාරි මහත්මිය | විද්‍යාගාර සහායක | 2021.10.26 සිට 2021.10.28 දක්වා මුදල් අමාත්‍යාංශයේ මිලෝදා මූල්‍ය අධ්‍යයන ඇකඩමිය විසින් පවත්වනු ලැබූ පුද්ගලික ගොනු කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන |

## 5. නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති

පහත වගු අංක 25 මඟින් ආයතනයේ දැනටමත් ආරම්භ කර ඇති ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය නිරූපණය කෙරේ.

**වගු අංක 25: නවීකරණය කිරීම් සහ ඉදිකිරීම් ව්‍යාපෘති**

| අංකය | ව්‍යාපෘති නාමය | වෙනත් කරුණු |
|---|---|---|
| **2017 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති** | | |
| 01 | පටක රෝපණ විද්‍යාගාරය සඳහා තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම (සැලසුම් කර ඉදිකිරීම) | ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 150 (VAT සහිතව)<br>කොන්ත්‍රාත්කරු: KSJ ඉදිකිරීම් පුද්ගලික සමාගම<br>භෞතික ප්‍රගතිය: 100%<br>මූල්‍ය ප්‍රගතිය : 94% |
| **2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති** | | |
| 02 | ඉංජිනේරු වැඩ ඒකකය ඉදි කිරීම | ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 7.89 (VAT සහිතව)<br>කොන්ත්‍රාත්කරු: විජේසිංහ ඉදිකිරීම් සමාගම<br>භෞතික ප්‍රගතිය: 100%<br>මූල්‍ය ප්‍රගතිය :73 % |
| 03 | බාහිර විදුලි පද්ධතිය ස්ථාපිත කිරීම | ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 9.99 (VAT සහිතව)<br>කොන්ත්‍රාත්කරු: සන්පවර් ඉංජිනියරින් පුද්ගලික සමාගම<br>භෞතික ප්‍රගතිය: 100%<br>මූල්‍ය ප්‍රගතිය : 62% |
| 04 | එළු ගාල ඉදි කිරීම | ව්‍යාපෘති පිරිවැය: රුපියල් මිලියන 5.45 (VAT සහිතව)<br>කොන්ත්‍රාත්කරු: වන්දන එන්ටර්ප්‍රයිසස්<br>භෞතික ප්‍රගතිය: 100%<br>මූල්‍ය ප්‍රගතිය : 63% |

**2021 වර්ෂය තුළ ආයතනයේ යටිතල පහසුකම් සංවර්ධනය**

- **ආදර්ශ ගොවිපලක් සංවර්ධනය**

අක්කර 40කට අධික භූමි ප්‍රමාණයකින් යුත් කැලෑවක් ආයතනයේ සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දායකත්වයෙන් ගොවි බිමක් ලෙස සංවර්ධනය කරන ලදී. මෙම ගොවිපල පලතුරු, එළවළු, ඖෂධීය ශාක, ක්ෂේත්‍ර බෝග, කාර්මික භෝග, පශු සම්පත් සහ මිරිදිය ධීවර කර්මාන්තයෙන් සමන්විත විය. මෙම ගොවිපල බහුකාර්ය නිෂ්පාදන ඒකකයක් වන අතර උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික අවස්ථා සලසා දෙයි, විද්වතුන් සඳහා පර්යේෂණ අවස්ථා ලබා දෙයි, ගොවීන් සහ ව්‍යවසායකයින් සඳහා නවීන තාක්ෂණයන් පිළිබඳ ප්‍රදර්ශන ඒකකයක් ලෙස ක්‍රියා කරයි සහ වඩාත්ම වැදගත් දෙය නම් එමඟින් ආයතනයට ආදායම් උපයා ගැනීමට හැකි වීමයි. ගොවිපලේ සම්පූර්ණ වගකීම ආයතනයේ පාඨමාලා සම්බන්ධීකාරක/වැඩබලන ගොවිපල කළමනාකරු, ජවසම්පන්න සහ අධිෂ්ඨානශීලී පෞරුෂයක් ඇති T.G.B ධනුෂ්ක මහතා විසින් දරනු ලැබේ.

- **තාක්ෂණ හුවමාරු මධ්‍යස්ථානයක් (TECTRACE) පිහිටුවීම**

ආයතනය සහ ගොවි ප්‍රජාව අතර ද්වි-මාර්ග සන්නිවේදන යාන්ත්‍රණයක් ඇති කිරීමේ අරමුණින් UCIARS වෙත අනුයුක්ත ඒකකයක් ස්ථාපිත කරන ලදී. කෘෂිකාර්මික තොරතුරු ව්‍යාප්ත කිරීම, ආයතනය මගින් ජනනය කරන ලද තාක්ෂණික සෘජු පරිවර්තනය, ගොවීන් මුහුණ දෙන තාක්ෂණික ගැටලු විසඳීම සහ කෘෂි කර්මාන්තය ආශ්‍රිත නව අත්දැකීම් ගොවීන්, ව්‍යවසායකයින්, පෞද්ගලික අංශය සහ සිසුන් සමඟ බෙදා ගැනීම මෙම විශේෂිත ඒකකය පිහිටුවීමේ අරමුණු විය. ඒකකය පිහිටුවීමේ ක්‍රියා පටිපාටිය ආයතනයේ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව සහ කොළඹ විශ්වවිද්‍යාලයේ රෙගුලාසිවලට අනුකූලව සිදු කරන ලදී. 2021 දී TECTRACE විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් වූයේ:

1. විවිධ කෘෂිකාර්මික ආශ්‍රිත ප්‍රදේශවල ප්‍රායෝගිකව අදාළ වන තාක්ෂණයන් පොත් පිංචක් ලෙස සම්පාදනය කර ගොවීන්ගේ ප්‍රයෝජනය සඳහා සිංහල සහ දෙමළ භාෂා දෙකෙන්ම නිකුත් කිරීම.
2. අවම වශයෙන් SLQF 1 සුදුසුකම් ඇති සහභාගිවන්නන් සඳහා පැය 20 න්‍යාය සහ පැය 30 ප්‍රායෝගිකව සමන්විත ‘‘කාබනික ගොවිතැන’’ සහ ‘‘ආහාරයට ගත හැකි බිම්මල් නිෂ්පාදනය’’ පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා දෙකක් ප්‍රකාශයට පත් කරන ලදී.
3. පරිසර හිතකාමී පළිබෝධනාශක, පොහොසත් කාබනික පොහොර, දියර පොහොර නිෂ්පාදනය සහ වී, ක්ෂේත්‍ර බෝග, එළවළු සහ පලතුරු භෝග සඳහා පරිසර හිතකාමී කෘෂි විද්‍යාත්මක භාවිතයන් හඳුන්වාදීම.
4. ආයතනයේ සිසුන්ට ඉතාමත් වැදගත් අදහස් ලබා දීම සඳහා බිත්ති පත්‍රිකා සහ ගෙදර ගෙන යා හැකි පණිවිඩ ප්‍රදර්ශනය කිරීම.
5. කුඩා පරිමාණ ව්‍යවසායකයින්ට නොමිලයේ ලබා ගත හැකි සියඹලා ගෙඩි භාවිතයෙන් ‘‘රසම්’’ අගය එකතු කළ නිෂ්පාදනයක් ලෙස නිෂ්පාදනය කිරීමට සහාය වීම.
6. විද්‍යුත් තැපෑලෙන්, දුරකථනයෙන්, සමාජ මාධ්‍ය හරහා සහ සෘජුව සම්බන්ධ වීමෙන් ගොවීන්ගේ ගැටලු විසඳීම සඳහා ස්වේච්ඡා උපදේශන සේවාවක් ආරම්භ කිරීම.
7. කොළඹ විශ්ව විද්‍යාලය තුළ සනීපාරක්ෂක අවශ්‍යතාවය සපුරාලීමේ අරමුණින් කෝමාරිකා පදනම් කර ගනිමින් ශාකසාර විෂබීජ නාශක නිෂ්පාදනය කිරීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී.
8. රසායනික පොහොර වෙනුවට ‘‘ජීවමූර්තම්’’ දියර පොහොර නිෂ්පාදනය කිරීම සඳහා Multilac Pvt Ltd සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරමින් පුද්ගලික පොදු හවුල්කාරිත්ව වැඩසටහනක් දියත් කරන ලදී.
9. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් සහ කෑගල්ල සහ යාපනය දිස්ත්‍රික්කවල වගාකරුවන් දැනුවත් කිරීම සඳහා ‘‘ශ්‍රී ලංකාවේ අපනයන කෘෂි බෝග නිෂ්පාදනයේ පරිසර හිතකාමී තාක්ෂණික ක්‍රම’’ පිළිබඳව ‘‘Oxfam’’ විසින් සංවිධානය කරන ලද ජාතික webinar සඳහා දායක විය.
10. මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කුඩා ව්‍යවසායක දෙපාර්තමේන්තුව ආශ්‍රිතව ‘‘කෙසෙල් කොළ සහිත ජීව ආහාර දවටන’’ පිළිබඳ ජාතික වෙබ් සංදර්ශණයක් පවත්වන ලදී.

- **මුදල් සඳහා පහසු ප්‍රවේශය - මහජන බැංකුවේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් ස්ථාපනය කිරීම**

UCIARS නගරය ආසන්නයේ සිට කිලෝමීටර 12 ක් පමණ දුරින් පිහිටා ඇති අතර සිසුන් බැංකු සමඟ ගනුදෙනු කිරීම සඳහා ඉතා අපහසුවෙන් එහි යා යුතුය. මෙයට පිළියමක් ලෙස සිසුන්ට ගනුදෙනු සඳහා පහසු ප්‍රවේශයක් ලබා දීම සඳහා මහජන බැංකුවේ ටෙලර් යන්ත්‍රයක් ස්ථාපනය කිරීමට ආයතනය ආරම්භ කරන ලදී. මහාචාර්ය එස් සුදර්සන්, අධ්‍යක්ෂ/UCIARS, කේ.සුනිල් මහතා, සහකාර මූල්‍යාධිකාරී (පැවරුම් මත)/UCIARS, සහ එස්.ඒ.එස්.ප්‍රියදර්ශනී/ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී මෙම කටයුත්ත මෙහෙයවූ අතර අවසානයේ එය බාධා කිහිපයක් මැද ඉටුවිය. මෙය විශ්ව විද්‍යාල ප්‍රජාවට පමණක් නොව, ගම්මානයේ ජනතාවට එමෙන්ම මෙම ස්ථානය හරහා ගමන් කරන පුද්ගලයින්ට වඩා හොඳ පහසුකමක් වනු ඇත.

## 6. මූල්‍ය

### 6.1 මූල්‍ය ප්‍රගතිය

**වගු අංක 26 : පුනරාවර්තන වියදම් විස්තර**

| විෂය | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 75,582,791.25 | 57,874,671.83 |
| ගමන් වියදම් | 86,466.12 | 1,098,988.84 |
| සැපයුම් | 3,818,709.02 | 4,308,735.62 |
| නඩත්තු | 1,353,142.92 | 1,169,112.00 |
| ගිවිසුම්ගත සේවා | 18,677,394.67 | 20,348,281.24 |
| වෙනත් | 8,911,868.15 | 5,447,118.43 |
| **මුළු එකතුව** | **108,430,372.13** | **90,246,907.96** |

**වගු අංක 27 : ප්‍රාග්ධන වියදම් විස්තර**

| විෂය | 2021 (රු.) | 2020 (රු.) |
|---|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් අත්පත් කරගැනීම සහ වැඩි දියුණු කිරීම් | 38,563,126.37 | 59,908,525.91 |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් පුනරුත්ථාපනය | 46,136,943.00 | 1,121,464.40 |
| වාහන | 4,899,999.00 | - |
| රසායනාගාර සහ ඉගැන්වීම | 120,670.00 | 1,879,200.00 |
| පිරියත යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 1,011,270.00 | 5,256,165.45 |
| සවිකිරීම් සහ උප මෙවලම් | - | 173,995.00 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | - | - |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය | - | - |
| ගෘහ උපකරණ | 595,578.00 | 267,929.08 |
| කාර්යාල උපකරණ | 803,520.00 | 293,240.50 |
| ලී බඩු සහ සවි කිරීම් | 236,115.00 | 13,874,133.95 |
| මෘදුකාංග | 695,000.00 | - |
| ක්‍රීඩා භාණ්ඩ | - | - |
| පොත් | - | - |
| ඉඩම් මූලික පිරිවැය | - | 47,836,210.92 |
| දැනට ක්‍රියාත්මක වැඩ (නොනිමි වැඩ) | - | 23,302,214.45 |
| සංගීත උපකරණ | - | - |
| **මුළු එකතුව** | **93,062,221.37** | **153,913,079.66** |

**වගු අංක 28 : ව්‍යාපෘති වියදම් විස්තර ( දේශීය/ ~~විදේශීය~~ අරමුදල්)**

| නම | මුළු පිරිවැය ඇස්තමේන්තුව රු. | 2021 වර්ෂයේ වියදම රු. | 2021.12.31 දිනට සමුච්චිත වියදම රු. | භෞතික ප්‍රගතිය % (2021) |
|---|---|---|---|---|
| **2017 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති** | | | | |
| පටක රෝපණ විද්‍යාගාරය සඳහා ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කර ඉදිකිරීම | 150,000,000.00 | 11,390,407.00 | 140,746,549.44 | 100% |

| | | | | |
|---|---|---|---|---|
| **උප එකතුව** | **150,000,000.00** | **11,390,407.00** | **140,746,549.44** | |
| **2019 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ ව්‍යාපෘති** | | | | |
| ඉංජිනේරු වැඩ ඒකකය ඉදි කිරීම | 7,891,359.00 | 1,822,503.07 | 5,681,718.70 | 100% |
| බාහිර විදුලි පද්ධතිය ස්ථාපිත කිරීම | 9,995,800.00 | 2,000,000.00 | 6,096,192.50 | 100% |
| එළු ගාල ඉදි කිරීම | 5,454,840.51 | 1,745,007.55 | 2,907,232.60 | 100% |
| **උප එකතුව** | **23,341,999.51** | **5,567,510.62** | **14,685,143.80** | |
| **මුළු එකතුව** | **173,341,999.51** | **16,957,917.62** | **155,431,693.24** | |

**වගු අංක 29 : මූල්‍ය ප්‍රගතිය පිළිබඳ විස්තර (ඉපැයූ ආදායම්)**

| ආදායම් මූලාශ්‍රය | **2021** වර්ෂයේ ප්‍රතිපාදන රු. | **2021** වර්ෂයේ එකතු කිරීම් රු. | **(හිඟය)/අතිරික්තය** රු. |
|---|---|---|---|
| IARS - සහතික පත්‍ර පාඨමාලා | 18,706,000.00 | 41,077,942.00 | 22,371,942.00 |
| පටක රෝපිත කෙසෙල් පැළ අලෙවිය | 10,775,000.00 | 5,892,590.00 | (4,882,410) |
| වෙනත් ආදායම් | 441,000.00 | 5,180,956.00 | 4,739,956.00 |
| **මුළු එකතුව** | **29,922,000.00** | **52,151,488.00** | **22,229,488.00** |

**වගු අංක 30 : මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය**

| **විෂය** | **සූත්‍රය** | **එක් සිසුවකු සඳහා වන වියදම (රු.) 2021** | **එක් සිසුවකු සඳහා වන වියදම (රු.) 2020** | **එක් සිසුවකු සඳහා වන වියදම (රු.) 2019** | **එක් සිසුවකු සඳහා වන වියදම (රු.) 2018** |
|---|---|---|---|---|---|
| එක් සිසුවකු වෙනුවෙන් දරන පුනරාවර්තන වියදම | පුනරාවර්ථන වියදම්/ සිසුන් ගණන | 115,474.30 | 156,174.10 | 125,517.26 | 243,798.41 |
| එක් සිසුවකු වෙනුවෙන් දරන ප්‍රාග්ධන වියදම | ප්‍රාග්ධන වියදම්/ සිසුන් ගණන | 99,107.79 | 233,948.07 | 214,065.48 | 113,867.42 |
| **මුළු එකතුව** | | **214,582.09** | **390,122.17** | **339,582.74** | **357,665.83** |

**6.2 ලෝක බැංකුව අරමුදල් සපයන ව්‍යාපෘති**

**ව්‍යාපෘතියේ නම**: ලෝක බැංකු අරමුදල් සහිත නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීමේ (ICE) ව්‍යාපෘතිය

**ව්‍යාපෘති මාතෘකාව** : ජෛව තාක්ෂණය තුළින් දේශීය විසිතුරු ශාකවල සෞන්දර්යාත්මක අගයන් වැඩිදියුණු කිරීම

**ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරයක්:**

ව්‍යාපෘතියේ අරමුණ වන්නේ වාණිජ වගාවන් සඳහා විවිධ විසිතුරු ශාක විශේෂ සංවර්ධනය කිරීම සහ මෙම ආයතනයේ ඉගෙනුම ලබන සිසුන් හරහා සහ උනන්දුවක් දක්වන මල් වගාකරුවන් හරහා එය ප්‍රචලිත කිරීමය. එබැවින්, පර්යේෂක කණ්ඩායම පහත සඳහන් නවෝත්පාදනයන් වාණිජකරණය වූ පර්යේෂණ නිෂ්පාදන ලෙස නිකුත් කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කළේය.

1. සමන් පිච්ච (*Jasminum officinale*) ප්‍රවේශයන් වැඩි දියුණු කිරීම

2. *Catheranthus roseus* (Vinca rosea) විවිධ වර්ණ සහිත මල් සහ මල් පෙති
3. Rukkaththana, Allamanda, cathertica මල් විවිධ වර්ණ සහිත සහ සුළි සහිත බහු පෙති
4.Etteria, *Murraya paniculata* ශාකයේ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම
5.විවිධ වර්ණ හා පෙති වල වෙනස්කම් සහිත Vesak orchid ප්‍රභේද වැඩිදියුණු කිරීම
6. තනි මල් විශේෂ සඳහා ප්‍රොටෝකෝල වර්ධනය කිරීම

වෙසක් ඕකිඩ් පැල සොයාගැනීමේ දුෂ්කරතා හේතුවෙන් එය වෙනුවට *Acalipa histida* Cat's tail සහ ඊට අමතරව සූරියකාන්ත සහ හීන් බෝවිටියා විශේෂ ද තෝරා ගන්නා ලදී.

**ව්‍යාපෘතියේ කාලසීමාව**: අවුරුදු 3 යි

**ව්‍යාපෘතියේ අරමුණු/අරමුණු:**

1. තෝරා ගැනීම, දෙමුහුන් කිරීම සහ විකෘති අභිජනනය හරහා අවධානයට ලක් නොවූ නමුත් වැදගත් මල් විශේෂවල ආකර්ෂණීය ප්‍රවේශයන් වර්ධනය කිරීම
2. හොඳින් ස්ථාපිත ව්‍යවසායකයින් සමඟ හවුල්කාරිත්වයන් තුලින් සංවර්ධිත ප්‍රවේශයන් ජනප්‍රිය කිරීම සහ වාණිජකරණය කිරීම.

**ව්‍යාපෘති වටිනාකම** (මිලියන) -වසර අනුව/වෙනත් ආකාරයකින්: මිලියන 40

**සිදු කළ අලුත්වැඩියා කටයුතු :**

1. සෙවන දැල් නිවස ප්‍රතිසංස්කරණය කිරීම
2. ජෛව තාක්ෂණ රසායනාගාරය ප්‍රතිසංස්කරණය කිරීම
3. "ජෛව තාක්ෂණය තුළින් දේශීය විසිතුරු ශාකවල සෞන්දර්යාත්මක අගයන් වැඩිදියුණු කිරීම" පිළිබඳ අවබෝධතා ගිවිසුම (MOU) 2021 ඔක්තෝබර් 12 වන දින කොළඹ විශ්ව විද්‍යාලය සහ (A) Canal Corner මල් උද්‍යානය සහ (B) Charles Roses පැල තවාන අතර අත්සන් කරන ලදී.

**වගු අංක 31 : ප්‍රදාන (දේශීය/විදේශීය අරමුදල් සහිත) - 2021**

| **ප්‍රදානයේ නම** | **TCE (මුළු පිරිවැය ඇස්තමේන්තුව)** | **2021 වියදම** | **2021.12.31 දිනට සමුච්චිත වියදම** | **භෞතික ප්‍රගතිය (2021)** |
|---|---|---|---|---|
| **ප්‍රදාන AHEAD/ICE** | **මිලියන 40** | **මිලියන 3.7** | **මිලියන 30** | **70%** |

**වගු අංක 32 : මිලදී ගත් උපකරණ / සිදු කළ අලුත්වැඩියා කටයුතු**

| අංක | විස්තරය | ඉන්වෙන්ටරි ෆෝලියෝ අංකය | තහවුරු කළ ශේෂ ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | Desktop Computers HP | 1 | 03 |
| 02 | DNA/RNA Quantifier | 2 | 02 |
| 03 | PCR Machine | 3 | 02 |
| 04 | Laboratory Shaker | 4 | 02 |
| 05 | Gel Electrophoresis Unit | 5 | 02 |
| 06 | Gel Documentation Unit | 6 | 01 |
| 07 | UV Cross Linker | 7 | 01 |
| 08 | Liquid Nitrogen Tank | 8 | 01 |
| 09 | Refrigerated Centrifuge | 9 | 01 |
| 10 | Spectrophotometer | 10 | 01 |
| 11 | Water bath | 11 | 02 |
| 12 | Light Microscope | 12 | 04 |
| 13 | Sterilization Boxes | 13 | 05 |

| | | | |
|---|---|---|---|
| 14 | Trinocular Microscopewith LCD Monitor and Digital Camera | 14 | 01 |
| 15 | Milli Q water purification unit | 15 | 01 |
| 16 | Microfuge | 16 | 01 |
| 17 | Distillation Unit | 17 | 01 |
| 18 | Incubator | 18 | 02 |
| 19 | Dry oven | 19 | 02 |
| 20 | Air Conditioner | 20 | 03 |
| 21 | Hand held GPS | 21 | 01 |
| 22 | Micro Pipettes | 22 | 12 |
| 23 | Laminar Flow | 23 | 03 |
| 24 | Hybridization oven | 24 | 01 |
| 25 | Autoclave | 25 | 03 |
| 26 | Motor and Pestles | 26 | 10 |
| 27 | -80˚C Refrigerator | 27 | 01 |
| 28 | Fume Hoods | 28 | 02 |
| 29 | Multipurpose Photocopy Machine with Printer | 29 | 01 |
| 30 | Black and white Printer | 30 | 01 |
| 31 | -20˚C Freezer | 31 | 01 |
| 32 | Analytical Balance | 32 | 02 |
| 33 | Refrigerator | 33 | 01 |
| 34 | Knapsack sprayer | 34 | 01 |
| 35 | Bush cutter | 35 | 05 |
| 36 | UPS | 36 | 02 |
| 37 | Microwave Oven | 37 | 01 |

**7. තිරසර සංවර්ධනය මත පදනම් ෙවූ අනාගත අපේක්ෂිත වාර්තාව**

කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය උපාය මාර්ගික කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී තිරසාර සංවර්ධන අරමුණු ඉටු වන ආකාරයට සකස් කිරීමට පියවර ගෙන ඇත. ඒ අනුව 2021-2025 වර්ෂ සඳහා සකස් කල උපාය මාර්ගික කළමනාකරණ සැලැස්මේ සහ 2021 ක්‍රියාකාරී සැලැස්ම පහත සඳහන් අරමුණු ස්ථාපිත කර ඇත්තේ පරිසරයට අවම සෘණාත්මක බලපෑමක් ඇති වන ආකාරයට සහ පරිසරය ආරක්ෂා වන අයුරිනි.

අරමුණ 01 : අත්‍යවශ්‍ය ගුණාංගයන්ගෙන් හෙබි උපාධිදාරීන් බිහි කිරීම ඉහළ නැංවීම
අරමුණ 02 : වැඩි දියුණු කළ ව්‍යාපාරිකමය හවුල් සම්බන්ධතා සහ අන්තර්ජාතික සහයෝගීතාවය
අරමුණ 03 : වැඩි දියුණු කළ ශාස්ත්‍රීය පැතිකඩ (academic profile) සහ පර්යේෂණ හා ව්‍යාප්තියේ බලපෑම
අරමුණ 04 : වැඩි දියුණු කළ යටිතල පහසුකම් හා පහසුකම්
අරමුණ 05 : වැඩිදියුණු කළ පාලනය සහ මූල්‍ය කළමනාකරණය/විනය සහ මූල්‍ය යැපීම අඩු කිරීම

UCIARS යනු කෘෂිකර්මාන්තය පදනම් කරගත් ආයතනයක් වන අතර එහි කෘෂිකාර්මික පිළිවෙත් තුළ පරිසරය ආරක්ෂා කිරීම සහ ප්‍රජාව සඳහා කෘෂිකර්මාන්තය ආකෘතිකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි.

ඒ අනුව 2021 වර්ෂය තුල දී ආයතනය විසින් පරිසරය ආරක්ෂා කර ගැනීම සහ තිරසාර සංවර්ධනය වෙනුවෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත පරිදි සාරාංශ කොට දැක්විය හැකිය.

1. සෑම කෙනෙකුටම ඉතා සාධාරණ සහ දැරිය හැකි පාඨමාලා ගාස්තුවක් යටතේ ජාතික විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමේ අවස්ථාව මඟ හැරුණු ගොවි ප්‍රජාවට මෙන්ම උසස් පෙළ සමත් සිසුන් සඳහා ද කෘෂි තාක්ෂණ උපාධිය පිරිනැමීම.
2. ආයතනය ගාස්තු අයකිරීමේ පාඨමාලා පවත්වන බැවින්, ආයතනය විසින් UCIARS නේවාසිකාගාරයේ සිසුන් සඳහා ඉතා අඩු දෛනික ගාස්තු/මාසික ගාස්තුවකට නවාතැන් ලබා දෙන අතර එමඟින් සියලුම සිසුන්ට පිරිවැය දැරිය හැකි වේ.

3. උපාධිය හැදෑරීමට වයස් බාධක නොමැති බැවින්, එය ජීවිත කාලය පුරාම ඉගෙනීමේ සංකල්පය සහතික කරයි.

4. සූර්ය බලශක්ති භාවිතය (විදුලිය ඉතිරි කර ගැනීම සඳහා අලි වැටෙහි සහ එළිමහන් ආලෝක පද්ධතියෙහි සූර්ය පැනල සවි කර ඇත).

5. කාර්යාල කටයුතුවලදී කඩදාසි භාවිතය අඩු කිරීම (ඊමේල් වැඩිපුර භාවිතා කිරීමෙන්) සහ ඒක පාර්ශවීය කඩදාසි (one side papers) නැවත භාවිතා කිරීම සහ බොහෝ රැස්වීම් අන්තර්ජාලය හරහා පැවැත්වීම.

6. ආයතනයේ සුභසාධක සමිති ආපන ශාලාව හරහා සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පෝෂණ ආහාර සාධාරණ මිලකට ලබා දීම.

7. ආයතනයේ LMS පරිපාලකයින් විසින් LMS හි පවතින ලිපිගොනු ප්‍රතිව්‍යුහගත කර කොළඹ විශ්ව විද්‍යාලයේ පද්ධතිය තුළ ඇති ගොනු තදබදයට පහසුවෙන් ප්‍රවේශ විය හැකි පරිදි යාවත්කාලීන කරන ලදී.

8. පුද්ගලයන් සහ ආයතනය පිළිබඳ අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ඉක්මන් ප්‍රවේශයක් ලබා දීමෙන් සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට සහාය වීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) හඳුන්වා දෙන ලදී. මෙම හැඳින්වීම වර්තමානයේ අතිශය සීමිත කාර්ය මණ්ඩල සාමාජිකයින් සංඛ්‍යාවක් විසින් උර දී ඇති කඩිනම් සහ නිවැරදි පරිපාලන කටයුතු සිදු කිරීම සඳහා අතිමහත් සහයෝගයකි.

9. වෙළඳපොලේ ඇති මිල අධික මාළු කෑම වෙනුවට ආදේශකයක් ලෙස ලේ ආහාරය (blood meal) හඳුන්වා දී ඇත. මිරිදිය මත්ස්‍ය තිලාපියා (Oreochromis niloticus) සඳහා වන ප්‍රෝටීන් බහුල ආහාර වේලෙහි නව නිපැයුම් සඳහා සත්ව ලේ අපද්‍රව්‍ය ඇතුළත් කර ඇති අතර එය මාළු පැටවුන්ගේ වර්ධනය සාර්ථක ලෙස වැඩි දියුණු කරයි.

10. කොහු දුවිලි සහිත කෘතිම බහාලුම් සහ මාධ්‍ය සඳහා ආදේශකයක් ලෙස පරිසර හිතකාමී බහාලුම්වල ආක්‍රමණශීලී ජලජ වල් පැළෑටියක් නිපදවා ඇත. ඒවා බරින් අඩු වන අතර නාගරික ප්‍රදේශවල බහුලව දක්නට ලැබෙන සීමිත ඉඩ ප්‍රමාණයක සිරස් ගොවිතැන සඳහා වඩාත් සුදුසු වේ. මෙය ජලය අවශෝෂණය කර දිගටි ව්‍යුහයක් ලෙස ප්‍රසාරණය වේ.

11. රතු වට්ටක්කා යනු වෙළෙඳපොළ අතිරික්තයක් ඇති එළවළුවක් වන අතර එය විශාල පසු අස්වනු අලාභයක් සිදු කරයි. ඊට විසඳුමක් ලෙස රතු වට්ටක්කා යොදා ගනිමින් බිස්කට් නිෂ්පාදනය කර ඇති අතර එය පෝෂ්‍යදායී, ස්වාභාවික වර්ණයෙන් හා රසයෙන් මිහිරි ය.

12. ඌන ප්‍රයෝජනයට නොගත් බිත්තර පලතුරක් භාවිතා කරමින් UCIARS විසින් අගය එකතු කරන ලද නිෂ්පාදනයක් ලෙස පෝෂණීය ජෑම් වර්ගයක් නිපදවා ඇති අතර එය බිත්තර පලතුරු වලින් පැමිණි ස්වභාවික බිත්තර කහ පැහැයක් ගනී.

13. මෙම කෝමාරිකා සහ කහ යන භෝග දෙකෙහිම රෝපණ ද්‍රව්‍ය සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහා ආධුනික ප්‍රචාරණය ආරම්භ කරන ලද අතර වර්තමානයේදී ආයතනයට ආදායමක් උපදවමින් වාණිජ පරිමාණයෙන් ශාක සාර්ථකව නිෂ්පාදනය කරයි.

14. UCIARS ගොවිපල බහුකාර්ය නිෂ්පාදන ඒකකයක් වන අතර එය උපාධි අපේක්ෂකයින් සඳහා ප්‍රායෝගික අවස්ථා ලබා දෙයි, විද්වතුන් සඳහා පර්යේෂණ අවස්ථා ලබා දෙයි, ගොවීන් සහ ව්‍යවසායකයින් සඳහා නවීන තාක්ෂණ ප්‍රදර්ශන ඒකකයක් ලෙස ක්‍රියා කරන අතර එය ආයතනයට ආදායම් උපයා දෙයි.
15. ආයතනය සහ ගොවි ප්‍රජාව අතර ද්වි-මාර්ග සන්නිවේදන යාන්ත්‍රණයක් ඇති කිරීමේ අරමුණින් UCIARS වෙත අනුබද්ධ තාක්ෂණික හුවමාරු මධ්‍යස්ථානයක් ස්ථාපිත කරන ලදී. කෘෂිකාර්මික තොරතුරු ව්‍යාප්ත කිරීම, ආයතනය මගින් ජනනය කරන ලද තාක්ෂණික සෘජු පරිවර්තනය, ගොවීන් මුහුණ දෙන තාක්ෂණික ගැටලු විසඳීම සහ කෘෂි කර්මාන්තය ආශ්‍රිත නව අත්දැකීම් ගොවීන්, ව්‍යවසායකයින්, පෞද්ගලික අංශය සහ සිසුන් සමඟ බෙදා ගැනීම මෙම විශේෂිත ඒකකයේ අරමුණ විය.

පරිසරය සුරැකීම සහ තිරසාර සංවර්ධනය සඳහා ඉදිරියේදී ගත යුතු පියවර පහත පරිදි සාරාංශ කළ හැක.

1. ආයතනයේ අක්කර 40ක ගොවිපලේ පූර්ණ සංවර්ධනයෙන් පසු කාබනික ගොවිතැන සහ බෝග වගාව වාණිජ වශයෙන් සංවර්ධනය කිරීම තුළින් ප්‍රජාවට කාබනික ආහාර අලෙවි කිරීම තුළින් සෞඛ්‍ය හා පෝෂණය වැඩිදියුණු කිරීම.

2. කෘෂි තාක්ෂණික පර්යේෂණ හරහා කෘෂි ව්‍යවසායකත්වය සඳහා නව තාක්ෂණයන් හඳුන්වා දීම.

3. සමස්ත සංවිධානයටම සූර්ය බලශක්තිය හඳුන්වා දීමෙන් බලශක්තිය ඉතිරි කිරීමට සැලසුම් කරයි. එහි පළමු පියවර ලෙස නව පටක රෝපණ විද්‍යාගාරය සඳහා Solar PV පද්ධතියක් පිහිටුවීමට සැලසුම් කර ඇත.

4. සමස්ත ආයතනය සඳහා ජල පිරිපහදු තාක්ෂණය හඳුන්වා දීමට සැලසුම් කර ඇත. මෙමගින් පානීය ජලය පිටතින් ලබාගැනීමේ පිරිවැය අවම වීමෙන් ජලය සංරක්ෂණය වේ.
5. භෞමික පරිසර පද්ධති ආරක්ෂා කළ හැකි පාංශු සංරක්ෂණ වගාවන් හඳුන්වාදීම වැඩි කිරීම

6. ආයතන පරිශ්‍රය තුළ (ගොවිබිම් ඇතුළුව) සියලුම අත්‍යවශ්‍ය ප්‍රදේශවලට අන්තර්ජාල ප්‍රවේශය ලබා දීම සහ ආයතනයේ සිසුන්ට සහ සේවකයින්ට නවීන තාක්ෂණය සඳහා ප්‍රවේශය ලබා දීම.

7. ආයතනයේ පරිපාලන හා උත්සව කටයුතු වලදී පරිසරය දූෂණය වීම හැකිතාක් වළක්වා ගැනීම.

8. හරිත පරිසරයක් නිර්මාණය කිරීම සඳහා හැකිතාක් ආයතනය තුළ කෘෂි-ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල දී ගස් සිටුවීමට සිසුන් යොමු කිරීම.

9. බලශක්ති හා ජල සම්පත් ආර්ථික වශයෙන් භාවිතා කිරීම සහ ඌරන් පෝෂණය කිරීම සඳහා අපතේ යන සියලුම ආහාර භාවිතා කිරීම.

10. කාර්ය මණ්ඩලයට සහ සිසුන්ට ප්‍රමාණවත් පරිදි නවාතැන් පහසුකම් සැපයීම.

11. මාසික විදුලි බිල ඉතිරි කර ගැනීම සඳහා බලශක්ති බවට පරිවර්තනය කිරීම සඳහා ජීව වායු ඒකකයක් හඳුන්වා දීම

**අවසාන ගිණුම - 2021**

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍ය ආයතනය**

**කොළඹ විශ්ව විද්‍යාලය**

**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| දෙසැම්බර් 31 දිනට | | 2021 | 2020 |
|---|---|---|---|
| | | රු | රු |
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| බැංකු ශේෂය | සටහන -1 | 1,973,732 | 16,548,694 |
| තොගය | සටහන - 2 | 7,247,711 | 5,142,979 |
| ආයෝජන මත ලැබිය යුතු පොළි | සටහන - 3 | 281,494 | 82,360 |
| ලැබිය යුතු ණය ගිණුම | සටහන -4 | 1,987,271 | 1,463,081 |
| පෙර ගෙවීම් ගිණුම | සටහන -5 | 159,822 | 643,852 |
| අත්තිකාරම් | | - | 26,000 |
| සජීව වත්කම් | | 265,600 | |
| වෙනත් ජංගම වත්කම් | | 75,000 | 75,000 |
| | | **11,990,629** | **23,981,965** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | සටහන - 6 | 523,810,609 | 470,749,416 |
| සජීව වත්කම් | | 4,421,000 | 306,300 |
| විලම්බිත වියදම් | සටහන - 7 | 1,356,784 | 1,883,437 |
| ට්‍රාන්ස්ෆෝමරය සඳහා තැන්පතු | | 500,000 | 500,000 |
| කෙරිගෙන යන වැඩ | | - | 51,743,291 |
| ආයෝජන | සටහන - 8 | 21,299,950 | 300,000 |
| | | **551,388,343** | **525,482,444** |
| | | | |
| **මුළු වත්කම්** | | **563,378,971** | **549,464,409** |
| | | | |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | සටහන - 9 | 12,716,835 | 7,335,518 |
| වෙනත් ජංගම වගකීම් | | 64,271 | 22,394 |
| | | 12,781,107 | **7,357,912** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ජංගම නොවන වගකීම් | සටහන - 10 | 18,868,082 | 12,481,668 |
| | | 18,868,082 | **12,481,668** |
| | | | |
| මුළු වගකීම් | | 31,649,189 | **19,839,580** |
| | | | |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | | **531,729,782** | **529,624,829** |
| **සමුච්චිත අරමුදල්** | | | |
| වියදම් කළ ප්‍රාග්ධන දීමනා | | 234,705,740 | 223,926,232 |
| වියදම් නොකළ ප්‍රාග්ධන දීමනා | | - | 870,576 |
| තොරතුරු තාක්ෂණ දීමනා | | - | 3,160,390 |
| වියදම් කළ අනිකුත් දීමනා | | 95,145,445 | 94,229,423 |
| වියදම් නොකළ අනිකුත් දීමනා | | 685,468 | 916,022 |
| රදවාගත් ඉපයුම් | | 22,542,960 | 15,072,294 |
| **වෙනත් සංචිත** | | 9,858,571 | 416,000 |
| වියදම් කළ විශේෂ දීමනා | | 168,791,599 | 191,033,892 |
| **මුළු ස්කන්ධය** | | **531,729,782** | **529,624,829** |

සහතික කළේ
ඒ.ඩී.පී.ද.සොයිසා
සහකාර මූල්‍යාධිකාරී
(කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය)

ආචාර්ය එන්.පී. විදානපතිරණ
අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය)
කළමනාකාරීත්වය මණ්ඩලය වෙනුවෙන්

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

**කොළඹ විශ්ව විද්‍යාලය**

**මූල්‍ය කාර්යසාධනය සහ වෙනත් විස්තීරණ ආදායම් පිළිබඳ ප්‍රකාශය**

| **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා** | | **2021** | **2020** |
|---|---|---|---|
| | | **රු.** | **රු.** |
| ආදායම | | 5,892,590 | 8,964,380 |
| විකුණුම් පිරිවැය | සටහන 11 | (16,925,243) | (20,503,926) |
| දළ ලාභය | | **(11,032,653)** | **(11,539,546)** |
| | | | |
| | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | 78,170,000 | 73,650,000 |
| උපදවන ලද ආදායම් | සටහන - 12 | 46,258,898 | 30,058,381 |
| පොළි ආදායම | සටහන - 13 | 388,461 | 33,586 |
| ක්‍රමක්ෂය | | 37,333,360 | 33,761,155 |
| සජීවී වත්කම් නැවත තක්සේරු කිරීම් ලාභය | | 2,885,800 | - |
| | | | |
| | | **154,003,866** | **125,963,577** |
| වියදම් | | | |
| පුද්ගලික පඩිනඩි | සටහන -14 | (63,666,739) | (50,035,020) |
| ගමන් වියදම් | සටහන - 15 | (86,466) | (89,999) |
| සැපයීම් | සටහන -16 | (3,818,709) | (3,254,044) |
| නඩත්තු වියදම් | සටහන -17 | (1,353,143) | (747,103) |
| ගිවිසුම්ගත සේවාවන් | සටහන -18 | (18,677,395) | (19,535,428) |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | සටහන -19 | (8,911,868) | (5,866,266) |
| මානව සංවර්ධන ප්‍රාග්ධනය | සටහන -20 | - | (82,250) |
| පාරිතෝෂික | | (2,624,621) | 4,061,321 |
| විලම්බිත වියදම් කපාහැරීම | | (526,653) | (526,653) |
| ක්ෂයවීම් | | (38,784,378) | (32,914,139) |
| ක්‍රමක්ෂය - මෘදුකාංග | | (84,500) | - |
| | | **(138,534,472)** | **(108,989,582)** |
| අතිරික්තය/ඌනතාවය | | **15,469,394** | **16,973,994** |

සහතික කළේ
ඒ.ඩී.පී.ද.සොයිසා
සහකාර මූල්‍යාධිකාරී
(කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය)

ආචාර්ය එන්.පී. විදානපතිරණ
අධ්‍යක්ෂ (කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය)
කළමනාකාරීත්වය මණ්ඩලය වෙනුවෙන්

| පැල නිෂ්පාදන ඒකකයේ නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම **2021** | | | | රු.. | | රු.. |
|---|---|---|---|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | සටහන් | මුලු මුදල | | කෙසෙල් | | කෝමාරිකා |
| | | | | | | |
| අමුද්‍රව්‍යවල පිරිවැය | | 1,447,106 | | 1,387,090 | | 60,016 |
| වෙනත් සෘජු පිරිවැය/සෘජු කම්කරු | | 11,916,052 | | 11,728,552 | | 187,500 |
| | | | | | | |
| ප්‍රාථමික පිරිවැය | | **13,363,157** | | **13,115,642** | | **247,516** |
| අවසන් කෙරිගෙන යන වැඩ (10183/10081) | | 103,016 | | 68,970.08 | | 34,045 |
| අවසන් කෙරිගෙන යන වැඩ | | (170,949) | | (170,949.37) | | - |
| මුළු ප්‍රාථමික පිරිවැය | | 13,295,224 | | 13,013,663 | | 281,561 |
| වක්‍ර / පොදු කාර්ය පිරිවැය | | 3,498,601 | | 3,260,282 | | 238,319 |
| මුළු නිෂ්පාදන පිරිවැය | | **16,793,824** | | **16,273,944** | | **519,880** |
| විකුණුම් | | 5,892,590 | | 5,867,240 | | 25,350 |
| විකුණුම් පිරිවැය | | | | | | |
| පැළ 2021.01.01 දිනට ඒකක 1703 ක් රු. 149.68 සහ ඒකක 8905 ක් රු. 147.62 | | **1,560,553** | **1703** | **254,902** | **8905** | **1,305,651** |
| එකතු කරන්න: නිෂ්පාදන පිරිවැය | 99,114 | 16,793,824 | | 16,273,944 | | 519,880 |
| | 7,245 | 18,354,378 | | 16,528,846 | | 1,825,531 |
| පැල 31.12.2021 ඒකක පිරිවැය | | (1,429,135) | | (1,262,260) | | (166,875) |
| මුළු නිෂ්පාදන පිරිවැය | | 16,925,243 | | 15,266,586 | | 1,658,656 |
| ලාභය / අලාභය | | **(11,032,653)** | | **(9,399,346)** | | **(1,633,306)** |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**
**2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**
**ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය**

| | වියදම් කල ප්‍රාග්ධන ප්‍රදාන | වියදම් නොකල ප්‍රාග්ධන ප්‍රදාන | තොරතුරු තාක්ෂණ ප්‍රදාන | අනෙකුත් වියදම් කල ප්‍රදාන | අනෙකුත් වියදම් නොකල ප්‍රදාන | සංචිත ප්‍රත්‍යාගණනය | විශේෂ ප්‍රදාන | වෙනත් සංචිත | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| 2021.01.01 දිනටශේෂය | 223,926,232 | 870,576 | 3,160,390 | 94,229,423 | 916,022 | 15,072,294 | 191,033,892 | - | 529,208,829 |
| ක්‍රමක්ෂය ගැලපුම් සටහන | 11,121,146 | | | | | | (11,121,146) | | - |
| ආරම්භක ගැලපුම් සටහන | 870,576 | (870,576) | (3,160,390) | | | (7,99,728.53) | | 4,578,725 | (6,580,394) |
| | 235,917,954 | - | - | 94,229,423 | 916,022 | 7,073,566 | 179,912,745 | 4,578,725 | 522,628,435 |
| **2021 වසර සඳහා ස්කන්ධයෙහි වෙනස්වීම්** | | | | | | | | | |
| කාලසීමාව සඳහා හිඟය/අතිරික්තය | | | | | | | | | |
| වර්ෂය සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් | | 25,000,000 | | | 685,468 | 15,469,394 | | | 41,154,862 |
| වර්ෂයේ ප්‍රාග්ධන වියදම් | 25,000,000 | (25,000,000) | | 916,022 | (916,022) | | | | - |
| පාරිතෝෂිතවෙන් කිරීම් ලාභ/අලාභ | | | | | | | | 1,915,792 | 1,915,792 |
| ක්‍රමක්ෂය | (26,212,214) | | | | | | (11,121,146) | | (37,333,360) |
| සජීවී කොටස් ප්‍රත්‍යාගණනය | | | | | | | | | - |
| දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය | | | | | | | | 3,364,054 | 3,364,054 |
| 2021.12.31 දිනට ඉදිරියට ගෙන ගිය ශේෂය | **234,705,740** | **-** | **-** | **95,145,445** | **685,468** | **22,542,960** | **168,791,599** | **9,858,571** | **531,729,782** |

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

**කොළඹ විශ්ව විද්‍යාලය**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2021 | 2020 |
|---|---|---|
| **2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා** | රු. | රු. |
| වසරේ අතිරික්තය | 15,469,394 | 16,973,994 |
| අරමුදල් වෙනස්වීමට සම්බන්ධ නොවූ අයිතම සඳහා ගැලපීම් | | |
| එකතුකළා පෙර වසරේ ගැලපීම් | | 36,013 |
| ක්ෂයවීම | 39,717,793 | 32,914,139 |
| විලම්බිත වියදම් කපාහැරී මුදල | 526,653 | 526,653 |
| ජේන්ටික් ප්‍රදාන | | - |
| ක්‍රමක්ෂය | (37,333,360) | (33,761,155) |
| පොළි ආදායම | (388,461) | (33,586) |
| ඉවත් කිරීමේ අලාභ | | - |
| පාරිතෝෂික වෙන්කිරීම් | (2,624,621) | (4,061,321) |
| සජීව වත්කම් තක්සේරුව | (2,885,800) | (4,162,725) |
| වෙනත් විස්තිර්ණ වියදම් | | 130,000 |
| | | |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් කටයුතු ශුද්ධ මුදල් ප්‍රවාහය** | 17,730,839 | 8,562,012 |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීම** | | |
| තොගය තුළ වැඩිවීම්/අඩුවීම් | (2,104,732) | 7,272,465 |
| ලැබීම් වැඩිවීම්/අඩුවීම් | 13,960 | 65,140 |
| ලැබිය යුතු ණය වැඩිවීම්/අඩුවීම් | (524,190) | 775,318 |
| ඉදිරියට කල ගෙවීම් වැඩිවීම්/අඩුවීම් | 484,030 | (388,433) |
| අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | 26,000 | (26,000) |
| අනෙකුත් වත්කම් වැඩිවීම්/අඩුවීම් | | - |
| උපචිත ගෙවීම් වැඩිවීම්/අඩුවීම් | 3,399,990 | (1,533,066) |
| අනෙකුත් වගකීම් වැඩිවීම්/අඩුවීම් | 41,878 | 5,980 |
| | | |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමෙන් පසු මෙහෙයුම් කටයුතු ශුද්ධ මුදල් ප්‍රවාහය** | 19,067,775 | 14,733,416 |
| | | |
| පාරිතෝෂික ගෙවීම් | | |
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය** | 19,067,775 | 14,733,416 |
| | | |
| ආයෝජන කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ | | |
| ස්ථාවර වත්කම් අත්කර ගැනීම වැඩිවීම්/අඩුවීම් | (36,336,989) | (31,099,922) |
| සජීවී වත්කම් වැඩිවීම්/අඩුවීම් | (1,364,500) | (213,000) |
| ස්ථාවර වත්කම් අඩුවීම් | | - |
| විලම්භිත වියදම් වැඩිවීම්/අඩුවීම් | | - |
| කෙරිගෙන වැඩ වැඩිවීම්/අඩුවීම් | | (8,888,283) |
| ආයෝජන වැඩිවීම්/අඩුවීම් | (20,999,950) | (300,000) |
| වසර සඳහා පොළි ආදායම් | 175,367 | 33,586 |
| **ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය** | (58,526,071) | (40,467,618) |
| **මූල්‍ය කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහ** | | |
| පාරිතෝෂික ගෙවීම් | | (260,418) |
| ණය ගැනීම් වැඩිවීම් | | - |
| ණය ගැනීම් අඩුවීම් | (116,666) | (600,000) |
| ප්‍රාග්ධන වියදම සඳහා රජයේ ප්‍රදාන | 25,000,000 | 39,123,208 |
| | | |
| **මූල්‍ය කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහය** | 24,883,334 | 38,262,790 |
| | | |
| **මුදල්වලට සමාන දෑ හි ශුද්ධ වැඩිවීම** | (14,574,962) | 12,528,588 |
| කාලසීමාව ආරම්භයේදී මුදල් හා මුදලට සමාන දෑ | 16,548,694 | 4,020,106 |
| කාලසීමාව අවසානයේදී මුදල් හා මුදලට සමාන දෑ | 1,973,731 | 16,548,694 |

**මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්**

**කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**
**කොළඹ විශ්ව විද්‍යාලය**

1. **සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**1.1 වාර්තාකරන ආයතනය**

කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය 2008 අංක 02 දරන ආඥාපනත යටතේ සංස්ථාගත කොට ඇති අතර 2008 ඔක්තෝබර් 16 දින ගැසට් කරන ලදී. ප්‍රධාන පරිපාලනය හම්බන්තොට නව නගරයේ වැලිගත්ත වේ. කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2021/12/31දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශයන් සකස් කෙරේ.

**1.2 සකස් කිරීමේ පදනම**

මූල්‍ය ප්‍රකාශයන් ගිණුම්කරණය පිළිබඳ ඓතිහාසික පදනම මත පිළියෙළ කරයි. ඒ අනුව ගනුදෙනු වත්කම් අත්කර ගනු ලැබූ, දරනු ලැබූ දිනයේදි පැවති වටිනාකමට වාර්තා කරන අතර ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය විසින් දක්වා ඇති **ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට** අනුකූලව අරමුදල් ලබා ගනී.

මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කෙරෙන අතර එය ක්‍රියාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වේ. පසුගිය වසරට අදාළ සංඛ්‍යා සහ වාක්‍ය ඛණ්ඩ වර්තමාන වසරේ ඉදිරිපත් කිරීම සමඟ සැසඳීම සඳහා අවශ්‍ය තැන්හිදී නැවත සඳහන් කොට ඇත.

**1.3 වත්කම් සහ එහි වටිනාකම් පදනම**

**1.3.1 දේපල පිරියත හා උපකරණ**

ඉඩම ලුණුගම්වෙහෙර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. එය 1988 සිට ආයතනය විසින් වසර 30ක බදු පදනමක් මත කුලියට දී ඇත.ගොඩනැගිලි හා ව්‍යුහයන්ගේ වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලද වටිනාකම මත පදනම් වී දක්වා ඇත.

දේපල, පිරියත සහ උපකරණ සහ විද්‍යාගාරය හා ඉගෙනුම් උපකරණවලට රජයේ ප්‍රදාන, පර්යේෂණ ප්‍රදාන සහ අභ්‍යන්තරව උපයන ලද අරමුදල්වලින් මිලදී ගත් අයිතම ඇතුළත්ය.

දේපල, පිරියත සහ උපකරණ එහි අහඹු වියදම් සහිතව මිලදී ගැනීමේ පිරිවැයට වාර්තා කෙරේ. වත්කම් දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂයවලින් අඩුකළ පිරිවැයටය.

**පසුව සිදුවන වියදම්**

පසුව සිදුවන වියදම්වලට වත්කමේ ඉදිරියට යන ප්‍රමාණය හෝ සුදුසු පරිදි වෙනම වත්කමක් ලෙස පිළිගත් අගය ඇතුළත් කෙරේ. එසේ වන්නේ අයිතම හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙනම් සහ අයිතම පිරිවැය සැබැවින්ම මැනිය හැකි නම් පමණි. අනිකුත් සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු වියදම් ඒවා දරනු ලබන මුදල් කාලසීමාව තුළ ආදායම් ප්‍රකාශයට අය කෙරේ.

**දේපල පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීම**

**වත්කමක් ශූන්‍ය ශුද්ධ වටිනාකමක් වාර්තා කරන විට, SLSPAS 07 - දේපල පිරියත සහ උපකරණ ප්‍රකාරව නැවත තක්සේරු කරන ලද වත්කම්වල සම්පූර්ණ ගණනය කිරීම් සහ නැවත තක්සේරු කළ මුදලෙහි සඳහන් වේ.**

**2021 වර්ෂය සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රමාදය ආවරණය කිරීම සඳහා අභ්‍යන්තර තක්සේරු කමිටුවක් පත් කරන ලද අතර ප්‍රති ඇගයීම් කමිටු වාර්තා මත පදනම්ව ප්‍රති ඇගයීම් සංඛ්‍යා ප්‍රකාශ කරනු ලැබේ.**

**තොගය**

2021.12.31 දිනට අමුද්‍රව්‍ය සහ පාරිභෝගික භාණ්ඩ, නොනිමි තොගය, පටක රෝපිත කෙසෙල් පැල තොගය අවම පිරිවැයට සහ ශුද්ධ මුදා හැරීමේ වටිනාකමට මනිනු ලැබේ. ශුද්ධ මුදා හැරීමේ වටිනාකම යනු නිම කිරීමේ සහ විකිණීමේ වියදම් පිළිබඳ ඇස්තමේන්තු ගත පිරිවැයයි. තොග ඇගයීමේ ක්‍රමය වන්නේ පෙර ඇතුළු පෙර පිටවීම් ක්‍රමයයි(FIFO).

**1.3.2 ක්ෂයවීම**

ක්ෂයකිරීම් සියලුම දේපල,පිරියත සහ උපකරණ සහ විද්‍යාගාරය හා ඉගෙනුම් උපකරණ ඒවායේ ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් කාලසීමාව පුරා සරල මාර්ගික ක්ෂයකිරීම මත මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයට අය කරනු ලැබ ඇත.

| <u>විස්තරය</u> | <u>ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් කාලසීමාව</u> |
|---|---|
| ගොඩනැගිලි හා ව්‍යුහ | - වසර 20 |
| නේවාසික ගොඩනැගිල්ල | - වසර 20 |
| සවි කිරීම් සහ ස්ථාපනයන් | - වසර 10 |
| වාහන | - වසර 5 |
| විද්‍යාගාර සහ තාක්ෂණික උපකරණ | - වසර 5 |
| ඉලෙක්ට්‍රොනික උපකරණ | - වසර 5 |
| ගෘහභාණ්ඩ උපකරණ | - වසර 10 |
| පරිගණක / කාර්යාලීය උපකරණ | - වසර 10 |
| මෘදුකාංග | - වසර 10 |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | - වසර10 |
| පිරියත, යන්ත්‍ර සහ උපකරණ | - වසර10 |
| පොත් | - වසර10 |
| ක්‍රීඩා භාණ්ඩ | - වසර10 |

භාවිතා කරන කාල සීමාව මත පදනම්ව මිලදී ගත් වර්ෂයේ සිට සහ විකුණුම් වර්ෂය දක්වා ක්ෂයවීම් සපයනු ලැබේ, මිලදී ගත් දිනයේ සිට සම්පූර්ණ ක්ෂයවීම් ලබා දෙනු ලැබේ.

### 1.3.3 ක්‍රමක්ෂය

රජයේ ප්‍රාග්ධන ප්‍රදාන භාවිතා කරමින් මිලදී ගනු ලැබූ ප්‍රාග්ධන වත්කම් සඳහා ක්ෂයකිරීම් වෙනුවෙන් ක්‍රමක්ෂය වෙන් කර ඇත.

### 1.3.4 විලම්බිත වියදම්

ලංකා විදුලිබල මණ්ඩලයේ පිරියත ට්‍රාන්ස්ෆෝමරය සඳහා දරන ලද වියදම විලම්බිත වියදමක් ලෙස හඳුනාගෙන ඇති අතර එය සමාන වාරික ලෙස මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයෙන් කපා හරිනු ලැබේ.

### 1.3.5 පාරිතෝෂික

(අ) 1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ ගෙවීම් යටතේ අදාළ අනුපාතයන්ට විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම සිදු කරන අතර මෙම පනත යටතේ පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලැබීමට සේවකයින් විසින් අවම වශයෙන් අවුරුදු 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ යුතුය.

සියලුම සේවකයින් සේවාවේ වසර 05ක් නියුක්තව සිටියේයැයි උපකල්පනය කරමින් පළමු වසරේ සේවාව සම්පූර්ණ කිරීමෙන් පසු වෙනස් කිරීම සිදු කෙරේ.

(ආ) පාරිතෝෂිකය ශ්‍රී ලංකාවේ 19 රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරමින් ආයතනය විසින් ගණනය කරනු ලැබේ.

(ඇ) තවද 2021 වසරේ සිට ක්‍රියාකාරී තක්සේරුව වෘත්තීය තක්සේරු ආයතනයක් විසින් සිදු කරනු ලැබේ.2021 වසර සඳහා හෙළිදරව් කිරීම් පහත පරිදි වේ. තවද අපි 2020.12.31 සඳහා ශේෂය නැවත ලබා දෙන අතර කොටස්වල වෙනස්කම් හඳුනාගෙන ඇත.

<u>නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ (PV-DBO) වර්තමාන වටිනාකමෙහි අය කිරීම</u>

| | | |
|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට PV-DBO සඳහා ප්‍රතිපාදන | = | 13,074,250 |
| කාල සීමාව සඳහා පොලී පිරිවැය | = | 1,045,940 |
| කාල සීමාව සඳහා වත්මන් සේවා පිරිවැය | = | 1,578,681 |
| කාල සීමාව තුළ හැර ගිය අය සඳහා ගෙවන ලද / ගෙවිය යුතු පාරිතෝෂිකය | = | - |
| PV - DBO මත සත්‍ය (ලාභ) / අලාභය | = | <u>(1,915,792)</u> |
| 2021 දෙසැම්බර් 31 දිනට PV - DBO සඳහා ප්‍රතිපාදන | = | <u>13,783,079</u> |

<u>ශේෂ පත්‍රයේ සහ ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇති මුදල</u>

<u>ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති වගකීම්</u>

| | | |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 වන විට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | = | 13,783,079 |
| 2021 දෙසැම්බර් 31 වන විට හඳුනා නොගත් ක්‍රියාකාරී ලාභ / (පාඩු) | = | <u>-</u> |
| 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ හඳුනාගෙන ඇති වගකීම් | = | <u>13,783,079</u> |

**ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්**

| | | |
|---|---|---|
| පොලී පිරිවැය | = | 1,045,940 |
| වත්මන් සේවා පිරිවැය | | = 1,578,681 |
| වහාම හඳුනා ගත් ශුද්ධ ක්‍රියාකාරී (ලාභ) / අලාභය | = | (1,915,792) |
| ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම් | | = 708,829 |

**ශේෂ පත්‍රයේ හඳුනාගත් ශුද්ධ වගකීම් වල වලනයන්**

| | | |
|---|---|---|
| 2021 ජනවාරි 01 දිනට ශුද්ධ වගකීම විවෘත කිරීම | = | 13,074,250 |
| ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම් | | = 708,829 |
| කාල සීමාව තුළ හැර ගිය අය සඳහා ගෙවන ලද /ගෙවිය යුතු පාරිතෝෂිකය | - | |
| 2021 දෙසැම්බර් 31 දිනට ශුද්ධ වගකීම අවසන් කිරීම | = | 13,783,079 |

**1.4 ආදායම් සහ වියදම්**

**1.4.1 රජයේ ප්‍රදානය සහ වෙනත් ප්‍රදාන**

වසර වෙනුවෙන් ලද මුළු ප්‍රාග්ධන ප්‍රදානය රුපියල් මිලියන 25 ක් විය. වසරේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කොට ඇති පුනරාවර්තන ප්‍රදාන රුපියල් මිලියන 74.17 ක් වූ අතර ආදායම් ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනාගෙන ඇත.
AHED ව්‍යාපෘති වටිනාකමින් වර්ෂය තුළ ලැබුණු අනෙකුත් ප්‍රදාන රු. 685,468 කි.

**1.4.2. ආදායම් හඳුනාගැනීම**

(අ) රජයේ ප්‍රදාන (පුනරාවර්තන)
රජයේ පුනරාවර්තන වියදම් ලැබෙන කාලසීමාව තුළ හඳුනාගනී

(ආ) පාඨමාලා ගාස්තු
පාඨමාලා ගාස්තු උපදේශන කාලසීමාව තුළ හඳුනාගනී. වෙනත් මුදල් කාලසීමාවක් සඳහා එවැනි වෙන්කිරීමක් සිදු කිරීමට ප්‍රමාණවත් තොරතුරු ලබාගත නොහැකි අවස්ථාවක, මුදල් පදනමක් මත ආදායම් ලෙස ගාස්තු හඳුනාගනී

(ඇ) ආයෝජන ආදායම
ආයෝජනවලින් ලැබෙන ආයෝජන ආදායම උපචිත පදනමක් මත ගණනය කෙරේ.

**1.5 ලැබීම්**

ලැබීම් මුදාහැරීමට ඇස්තමේන්තු කෙරෙන ප්‍රමාණයන්ට ප්‍රකාශ කෙරේ.

### 1.6 පශු සම්පත් සහ අස්වැන්න

**මෙහෙයුම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම්**

UCIARS පශු සම්පත් ක්‍රියාකාරකම්වල නිරත වන අතර ආයතනයම ජීව විද්‍යාත්මක පරිවර්තනය කළමනාකරණය කරයි. UCIARS ගවයින් සමඟ කිරි නිෂ්පාදනය, ඌරු පැටවුන් බෝ කිරීම, බිත්තර නිෂ්පාදනය සහ එළු කිරි නිෂ්පාදනය සමඟ සම්බන්ධ වේ. එබැවින් පශු සම්පත් ගවයින් 10 ක්, ඌරන් සංඛ්‍යාව 14 ක්, එළුවන් 25 ක් සහ කුකුලු පැටවුන් 415 කින් සමන්විත වේ. වසරකට වැඩි කාලයක් භාවිතා කරන ලද Bearer animals ජංගම නොවන වත්කම් ලෙස සඳහන් වේ.

පශු සම්පත් මනිනු ලබන්නේ එහි සාධාරණ වටිනාකමෙන් විකිණීම සඳහා වියදම් අඩු කිරීමෙනි. පශු සම්පත් වල සාධාරණ වටිනාකම තීරණය වන්නේ වෙළඳ මිල සජීවී තොග මත පදනම්වය.

අස්වැන්න 2021.12.31 දිනට සාධාරණ වටිනාකම මත පදනම්ව හඳුනාගෙන ඇත

### 1.7 මුදල් හා මුදලට සමාන දෑ

මුදල් හා මුදලට සමාන දෑවලින් බැංකු ශේෂය සමන්විත වේ.

### 1.8 ජංගම වත්කම්

ශේෂ පත්‍රය තුළ වර්ගීකරණය කළ ජංගම වත්කම් ශේෂ පත්‍ර දිනයෙන් පසු එක් වසරක් ඇතුළත ආපසු ලැබෙන වත්කම්ය.

### 1.9 ජංගම වගකීම්

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් වන්නේ ශේෂ පත්‍රයේ දින සිට එක් වසරක් ඇතුලත ගෙවීම සඳහා ගෙවිය යුතු ය. සියළුම වගකීම් සියල්ල අවසන් ප්‍රකාශ සකස් කිරීම සඳහා ගිණුම්ගත කර ඇත.

### 1.10 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශයන්ගේ අරමුණු සඳහා "වක්‍ර ක්‍රමයන්" භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් සකස් කර ඇත. මුදල් හා මුදල් සමානකම් බැංකු ශේෂයන්ගෙන් සමන්විත වේ.

මූල්ය ප්‍රකාශන සඳහා සටහන් 2021

| **සටහන - 01** | **2021** | **2020** |
|---|---|---|
| **බැංකු ශේෂය** | **රු.** | |
| හම්බන්තොට ලංකා බැංකුවේ පැල විකිණිම් රැස්කිරීමේ ගිණුම - 87319817 | 632,796 | - |
| හම්බන්තොට මහජන බැංකුවේ පැල විකිණිම් රැස්කිරීමේ ගිණුම - 007-1001-4-6432005 | - | 2,159,769 |
| හම්බන්තොට මහජන බැංකුවේ සහතිකපත් පාඨමාලා රැස්කිරීමේ ගිණුම - 007-1001-3-0005888 | 282,320 | 10,452,006 |
| හම්බන්තොට මහජන බැංකුවේ රජයේ ප්‍රදාන(ප්‍රාග්ධන/පුනරාවර්තන) ගිණුම - හම්බන්තොට මහජන බැංකුව 007-1001-2-0005006 | 881,141 | 1,605,480 |
| හම්බන්තොට මහජන බැංකුවේ ගොවි භාරකාර අරමුදල - 007-1001-3-0012515 | 12,495 | 14,795 |
| හම්බන්තොට මහජන බැංකුවේ වැටුප් ජංගම ගිණුම - 007-1003-2-6432005 | - | 1,206,835 |
| හම්බන්තොට මහජන බැංකුවේ පුනරාවර්තන වියදම් ගිණුම 007-1002-3-6432005 | 164,980 | 1,109,808 |
| | **1,973,732** | **16,548,694** |

| **සටහන - 02** | **2021** | **2020** |
|---|---|---|
| **තොග** | **රු.** | |
| අමුද්‍රව්‍ය හා කොහුබත් | 3,283 | 157,846 |
| නොනිමි වැඩ කෙසෙල් පැල | 136,904 | 68,970 |
| නිමි වැඩ කෙසෙල් පැල | 1,262,260 | 254,902 |
| කෝමාරිකා පැල | 166,875 | 1,305,651 |
| අස්වැන්න - විකුණුම් මධ්‍යස්ථානය | 6,550 | 30,940 |
| ලිපි ද්‍රව්‍ය | 1,186,291 | 1,403,790 |
| රසායනික ද්‍රව්‍ය | 924,315 | 543,466 |
| විදුලි සහ දෘඩාංග | 1,110,603 | 973,430 |
| පාරිභෝගික භාණ්ඩ හා වීදුරු උපකරණ | 2,450,631 | 1,203,339 |
| | **7,247,711** | **5,142,979** |

| **සටහන - 03** | **2021** | **2020** |
|---|---|---|
| **ලැබිය යුතු පොළිය** | **රු.** | |
| **ලැබිය යුතු පොළිය -REPO** | 1,753 | - |
| ගොවි භාරකාර අරමුදල් ණය | 68,400 | 82,360 |
| මාස 3 කෙටි කාලීන ආයෝජන පොලී | 192,231 | - |
| ස්ථාවර තැන්පතු පොලී | 19,110 | - |
| | 281,494 | 82,360 |

| සටහන - 04 | 2021 | 2020 |
|---|---|---|
| **ණය ගිණුම** | රු. | |
| ගොවි භාරකාර අරමුදල් ණයය | 634,820 | 737,920 |
| ආපදා ණය | 1,352,451 | 725,161 |
| | **1,987,271** | **1,463,081** |

| සටහන - 05 | 2021 | 2020 |
|---|---|---|
| **පෙරගෙවුම් ගිණුම** | රු. | |
| රක්ෂණ | 40,338 | - |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 119,484 | 643,852 |
| | **159,822** | **643,852** |

**සටහන - 06**

**ජංගම නොවන වත්කම් - පළමු වගුව**

| විස්තරය | විදුලි උපකරණ | නේවාසිකාගාර ව්‍යාපෘතිය | ගොඩනැගිලි හා වියුහ | ගොඩනැගිලි හා වියුහ අලුත්වැඩියා | මෝටර් රථ හා උපකරණ | විද්‍යාගාරය සහ තාක්ෂණික උපකරණ | පිරියත, යන්ත්‍ර සහ උපකරණ | සංගීත භාණ්ඩ | මුලු ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | | | | | | | |
| 2021/01/01 දිනට ශේෂය | 311,816 | 222,422,928 | 266,161,794 | 10,595,700 | 6,176,271 | 11,636,344 | 11,494,587 | 373,925 | 529,173,365 |
| ආරම්භක ශේෂ ගැලපීම් | | | (4,156,366) | (31,886) | | | 25 | | (4,188,227) |
| | 311,816 | 222,422,928 | 262,005,428 | 10,563,814 | 6,176,271 | 11,636,344 | 11,494,612 | 373,925 | 524,985,137 |
| එකතුකිරීම්/ වැඩිදියුණු කිරීම් | - | - | 38,563,126.37 | 46,136,943 | 4,899,999 | 120,670 | 1,011,270 | | 90,732,008 |
| වත්කම් තක්සේරු කිරීම | | | | | | 2,736,727 | (1,229,364) | | 1,507,363 |
| ප්‍රාග්ධන ප්‍රදාන | | | | | | | | | |
| වෙනත් ප්‍රදාන | | | | | | | | | |
| බැහැරකිරීම් | | | | (212,574) | | | | | (212,574) |
| **2021/12/31 දිනට මුළු ගණන** | **311,816** | **222,422,928** | **300,568,554** | **56,488,183** | **11,076,270** | **14,493,742** | **11,276,518** | **373,925** | **617,011,935** |
| **ක්ෂය සඳහා වෙන්කිරීම් ක්ෂය කිරීමේ අනුපාතය** | 20% | 5% | 5% | 5% | 20% | 20% | 10% | 10% | 95% |
| 2021/01/01 දිනට ශේෂය | 165,520.21 | 67,023,450.40 | 30,095,571.01 | 1,352,112.94 | 2,573,128.27 | 8,087,036.93 | 3,579,437.89 | 83,284.12 | 112,959,541.76 |
| ආරම්භක ශේෂ ගැලපීම් | | | (207,818) | (1,594) | (47,925) | | | | (257,337.62) |
| | 165,520 | 67,023,450 | 29,887,753 | 1,350,519 | 2,525,203 | 8,087,037 | 3,579,438 | 83,284 | 112,702,204 |
| බැහැරකිරීම් | | | | | | | | | |
| වසරේ ක්ෂය කිරීම් | 45,590 | 11,121,146 | 15,028,428 | 2,824,409 | 1,469,448 | 1,678,455 | 1,196,188 | 37,393 | 33,401,056.75 |
| **2021/12/31 දිනට ශේෂය** | **211,110** | **78,144,597** | **44,916,180** | **4,174,928** | **3,994,651** | **9,765,492** | **4,775,625** | **120,677** | 146,103,260.89 |
| | | | | | | | | | |
| **ශුද්ධ පොතේ වටිනාකම - 2021/12/31** | **100,706** | **144,278,331** | **255,652,374** | **52,313,255** | **7,081,618** | **4,728,24** | **6,500,892** | **253,248** | **470,908,674** |

**ජංගම නොවන වත්කම් - දෙවන වගුව**

| විස්තරය | ගෘහස්ත උපකරණ | කාර්යාලීය උපකරණ | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | ක්‍රීඩා භාණ්ඩ | පොත් | ඇසුරුම් ද්‍රව්‍යකාංග | ඉඩම් සඳහා මූලික වියදම් | වගු II න් ගෙන ආ එකතුව | වගු I න් ගෙන ආ එකතුව | මුලුගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ජංගම නොවන වත්කම** | | | | | | | | | | |
| 2021/01/01 දිනට ශේෂය | 1,262,029 | 14,727,157 | 37,409,870 | 223,200 | 643,498 | | 22,394,006 | 76,659,760 | **529,173,365** | **605,833,125** |
| ආරම්භක ශේෂ ගැලපීම් | | | 500,000 | - | - | | - | 500,000 | (4,188,227) | (3,688,227) |
| | 1,262,029 | 14,727,157 | 37,909,870 | 223,200 | 643,498 | | 22,394,006 | 77,159,760 | **524,985,137** | **602,144,897** |
| එකතුකිරීම්/ වැඩිදියුණු කිරීම් | 595,578 | **803,520** | 236,115 | **-** | **-** | **695,000** | | 2,330,213 | 90,732,008 | **93,062,221** |
| වත්කම් තක්සේරු කිරීම | (81,192) | 4,626,603.83 | (2,688,722) | | | | | 1,856,691 | 1,507,363 | **3,364054** |
| ප්‍රාග්ධන ප්‍රදාන | | | | | | | | | | |
| වෙනත් ප්‍රදාන | | | | | | | | | | |
| බැහැරකිරීම් | | | (9,100) | (1200) | | | | (10,300) | (212,574) | **(222,874)** |
| **2021/12/31 දිනට මුළු ගණන** | **1,776,415** | **20,157,281** | **35,448,164** | **222,000** | **643,498** | 695,000 | **22,394,006** | **81,336,364** | **617,011,935** | **698,348,299** |
| **ක්ෂය සඳහා වෙන්කිරීම ක්ෂය කිරීමේ අනුපාතය** | 10% | **10%,20%** | 10% | 10% | 10% | **20%** | | 60% | 95% | |
| 2021/01/01 දිනට ශේෂය | 432,792 | 9,818,211 | 11,522,723 | 67,862.00 | 282,579.00 | - | - | 22,124,167 | 112,959,541.76 | **135,083,709** |
| ආරම්භක ශේෂ ගැලපීම් | | | (5,394) | (1,080) | | | | (6,474.16) | (257,337.62) | (263,812) |
| | 432,792 | 9,818,211 | 11,517,328.84 | 66,782.00 | 282,579.00 | | | 22,117,692.84 | 112,702,204.14 | 134,819,896.98 |
| බැහැරකිරීම් | | | | | | | | | | |
| වසරේ ක්ෂය කිරීම් | 171,385 | 2,205,094 | 3,769,207 | 22,200 | 64,350 | 84,500 | | 6,316,736 | 33,401,056.75 | 39,717,792 |
| **2021/12/31 දිනට ශේෂය** | **`604,177** | **12,023,305** | **15,286,536** | **88,982** | **346,929** | **84,500** | | **28,434,429** | **146,103,261** | **174,537,689** |
| | | | | | | | | | | |
| **ශුද්ධ පොතේ වටිනාකම - 2021/12/31** | **1,172,238** | **8,133,976** | **20,161,628** | **133,018** | **296,569** | **610,500** | **22,394,006** | **52,901,935** | **470,908,674** | **523,810,609** |

| සටහන - 07 | 2021 | 2020 |
|---|---|---|
| **විලම්බිත වියදම්** | රු. | |
| ට්‍රාන්ස්ෆෝමරය - ලංකා විදුලි බල මණ්ඩලය | 519,720 | 779,580 |
| විදුලි උපකරණ | 837,064 | 1,103,857 |
| | **1,356,784** | **1,883,437** |

| සටහන - 08 | 2021 |
|---|---|
| **ආයෝජන** | රු. |
| ආරම්භක ශේෂය | 300,000 |
| එකතු කිරීම්<br>භාණ්ඩාගාර බිල්පත් ආයෝජන | 4,999,950 |
| එකතු කිරීම්<br>REPO ආයෝජන | 16,000,000 |
| අවසාන ශේෂය | **21,299,950** |

| සටහන - 09 | 2021 | 2020 |
|---|---|---|
| **උපචිත වියදම්** | රු. | |
| විදුලිය | 281,468 | 319,761 |
| ජලය | 47,822 | 15,422 |
| අන්තර්ජාල සම්බන්ධතා | 592,185 | 197,901 |
| සේවක අර්ථ සාධක අරමුදල | 74,709 | 70,105 |
| සේවක භාරකාර අරමුදල | - | 103,010 |
| දේශීය ගමන් වියදම් | 6,250 | 3,986 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 17,175 | - |
| දුරකථන | 27,979 | - |
| විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල | 799,011 | - |
| අතිකාල | 72,319 | 81,084 |
| ප්‍රවාහන | 62,890 | 5,550 |
| පිරියත. යන්ත්‍ර හා උපකරණ (මූලික) | 73,441 | 3,100 |
| විභාග ගාස්තු | 273,270 | 175,980 |
| උපදේශන ගාස්තු | 123,551 | - |
| වෙනත් ගිවිසුම්ගත සේවා | 102,831 | 112,003 |
| ආරාධිත දේශන ගාස්තු | 111,000 | - |
| වැඩමුලු හා සම්මන්ත්‍රණ | - | 28,000 |
| පවිත්‍රතා කටයුතු සේවා | 844,483 | 486,500 |
| මුද්‍රණ හා ප්‍රචාරණ | - | 172,245 |
| ආරක්ෂක සේවා | 371,963 | 1,443,809 |
| පුහුණුවන්නන්ගේ ගෙවීම් VTA | 19,500 | - |
| උපාධි පාඨමාලා සඳහා වියදම් | 69,530 | - |
| ලිපි ද්‍රව්‍ය | 22,500 | 2,916 |
| පරිභෝජන හා වීදුරු භාණ්ඩ | 209,832 | 25,090 |
| පරිවර්තන ගාස්තු | 6,063 | - |
| විදුලි හා දෘඪාංග උපකරණ | 114,317 | 90,650 |
| සත්ව පාලන කටයුතු | 285,696 | 171,550 |
| ගොවිපල සංවර්ධන වියදම් - කෙසෙල් | 53,825 | - |

| | | |
|---|---|---|
| ගොවිපල හා වාරිමාර්ග වියදම් | 145,825 | - |
| වෙනත් පුනරාවර්තන වියදම් | 34,150 | 534,000 |
| උත්සව සහ සමාරම්භක වියදම් | 8,400 | - |
| විශේෂ සේවා සැපයීම් | 73,000 | 42,000 |
| වාහන | 131,630 | 3,300 |
| ආදායම් සහ රක්ෂණ ගෙවීම් | 847 | - |
| ක්ෂේත්‍ර වියදම් | 2,000 | - |
| ෆෝටෝ කොපී සහ වායුසමීකරණ අලුත් වැඩියා | 7,000 | - |
| විගණන ගාස්තු | 672,000 | - |
| ලිපි තැපැල් | 1,830 | - |
| පාරිභෝගික භාණ්ඩ හා වීදුරු උපකරණ වියදම් | 6,445 | – |
| පැල විකුණුම් වියදම් | 1,488 | - |
| බිම්මල් ව්‍යාපෘතිය | 1,400 | - |
| විද්‍යාගාර අලුත්වැඩියා | 680 | - |
| විශ්‍රාම වැටුප් | 242,598 | - |
| EDCS | 910 | - |
| වෙනත් තෙල් දීමනා | 1,886 | - |
| යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම් | 4,090,596 | - |
| ගොඩනැගිලි හා ව්‍යුහ | 2,571,290 | – |
| මෘදුකාංග | 59,250 | |
| වෙනත් ප්‍රාග්ධන | - | 3,247,557 |
| | **12,716,835** | **7,335,518** |

| සටහන - 10 | 2021 | 2020 |
|---|---|---|
| **ජංගම නොවන වගකීම්** | රු. | |
| ගොවි භාරකාර අරමුදල | 75,003 | 191,669 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 13,783,079 | 7,279,999 |
| ආපසු ගෙවන තැන්පතු | 10,000 | 10,000 |
| නැවත ගෙවිය යුතු - UOC(**කොළඹ විශ්ව විද්‍යාලය**) ප්‍රදාන | 5,000,000 | 5,000,000 |
| | **18,868,082** | **12,481,668** |

**සටහන - 11 - පිරිවැය ගණනය කිරීමේ සටහන් - මූලික පිරිවැය-අමුද්‍රව්‍ය පිරිවැය**

1,447,106 1,141,812

| විස්තරය | 2021 | | 2020 | |
|---|---|---|---|---|
| | රසායනික ද්‍රව්‍ය | කොහුබත් | රසායනික ද්‍රව්‍ය | කොහුබත් |
| ආරම්භක තොගය | 210,671.24 | 157,846.00 | 193,914.55 | 114,393.50 |
| විද්‍යාගාරයට සහ තවාන් අංශයට නිකුත් කිරීම් | 549,907.80 | 657,800.00 | 396,021.10 | 806,000.00 |
| අවසන් තොගය | (125,836.82) | (3,282.50) | (210,671.24) | (157,846.00) |
| නිෂ්පාදන අමුද්‍රව්‍ය සඳහා පිරිවැය | **634,742.22** | **812,363.50** | **379,264.41** | **762,547.50** |

නිෂ්පාදන පුද්ගලික වැටුප් විස්තර

| විස්තරය | 2021 | 2020 |
|---|---|---|
| පුද්ගලික පඩි නඩි හා වැටුප් - නිෂ්පාදන ඒකකය | 10,261,454 | 10.325,002 |
| විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල නිෂ්පාදන ඒකකය | 712,665 | 721,058 |
| විශ්‍රාම වැටුප් නිෂ්පාදන ඒකකය | 666,166 | 666,577 |
| සේවක භාරකාර අරමුදල නිෂ්පාදන ඒකකය | 275,766 | 277,527 |
| | **11,916,052** | **11,990,164** |

වක්‍ර පිරිවැය/වෙනත් පොදු කාර්ය පිරිවැය

| විස්තරය | 2021 | 2020 |
|---|---|---|
| දුරකථන 5% | 14,222 | 14,420 |
| ජලය 40% | 469,487 | 493,575 |
| විදුලිය 30% | 1,067,599 | 1,225,993 |
| අලුත්වැඩියා වියදම් | 87,754 | 84,417 |
| දෘඩ සහ පාරිභෝජන ද්‍රව්‍ය | 936,351 | 777,797 |
| විද්‍යාගාර උපකරණ ක්ෂය | 848,914 | 847,016 |
| වෙනත් වක්‍ර වියදම් | 74,274 | 940,665 |
| | **3,498,601** | **4,383,883** |

| **සටහන -12** | **2021** | **2020** |
|---|---|---|
| **උපයාගත් ආදායම්** | රු. | |
| සහතික පත්‍ර පාඨමාලාව - කෘෂි තාක්ෂණික ආයතනය | 41,077,942 | 26,596,625 |
| වෙනත් ආදායම් | 811,119 | 445,797 |
| වෙනත් පැළ විකුණුම් | 3,337,294 | 2,389,686 |
| ටෙන්ඩර් ගාස්තු | - | 32,000 |
| නේවාසික ගාස්තු | 1,032,543 | 594,273 |
| | **46,258,898** | **30,058,381** |

| **සටහන - 13** | **2021** | **2020** |
|---|---|---|
| **පොලී ආදායම** | රු. | |
| ආපදා ණය පොළිය | 69,137 | 33,227 |
| සේවක ණය පොළි | 108,344 | - |
| ආයෝජන පොළි | 210,981 | |
| | **388,461** | **33,227** |

| සටහන - 14 | 2021 | 2020 |
|---|---|---|
| **පුද්ගලික පඩිනඩි** | රු. | |
| වැටුප් හා වේතන | 55,629,177 | 43,534,889 |
| සේවක අර්ථ සාධක අරමුදල | 778,690 | 514,667 |
| විශ්ව විද්‍යාල අර්ථ සාධක අරමුදල | 3,440,584 | 2,672,535 |
| විශ්‍රාම වැටුප් | 1,998,899 | 1,526,164 |
| සේවක භාරකාර අරමුදල | 1,214,086 | 968,406 |
| අතිරේක වැඩකළ දින ගෙවීම් | 37,314 | 32,792 |
| අතිකාල දීමනා | 567,989 | 785,567 |
| | **63,666,739** | **50,035,020** |

| සටහන - 15 | 2021 | 2020 |
|---|---|---|
| **ගමන් වියදම්** | රු. | |
| විදේශිය | - | - |
| දේශිය | 86,466 | 89,999 |
| | **86,466** | **89,999** |

| සටහන - 16 | 2021 | 2020 |
|---|---|---|
| සැපයුම් | රු. | |
| යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 261,390 | 679,662 |
| ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,130,166 | 648,796 |
| වෛද්‍ය සැපයීම් | | 10,461 |
| නිල ඇඳුම් | 480,296 | - |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 1,202,685 | 659,832 |
| පාරිභෝජන ද්‍රව්‍ය හා වීදුරු භාණ්ඩ | 416,421 | 1,064,663 |
| වෙනත් | 305,575 | - |
| රසායනික ද්‍රව්‍ය | 22,175 | 190,630 |
| | **3,818,709** | **3,254,044** |

| සටහන - 17 | 2021 | 2020 |
|---|---|---|
| **නඩත්තු වියදම්** | රු. | |
| පිරියත යන්ත්‍ර හා උපකරණ | 520,304 | 239,716 |
| මෝටර් වාහන | 565,956 | 318,960 |
| ගොඩනැගිලි හා ව්‍යුහ | 139,510 | 120,112 |
| විද්‍යුත් උපකරණ | - | 19,270 |
| වෙනත් | 127,373 | 49,045 |
| | **1,353,143** | **747,103** |

| සටහන - 18 | 2021 | 2020 |
|---|---|---|
| **ගිවිසුම්ගත සේවා** | රු. | |
| ප්‍රවාහනය | 1,110,845 | 410,613 |
| තැපැල් හා විදුලි සන්නිවේදනය | 3,801,121 | 2,561,865 |
| විදුලිය | 2,491,063 | 2,860,651 |
| ජලය | 704,230 | 740,363 |
| ආරක්ෂක සේවා | 3,768,350 | 5,658,899 |
| පිරිසිදු කිරීමේ සේවා | 5,051,523 | 5,780,975 |
| කුලී, බදු සහ පලාත් පාලන ආයතන | - | - |
| වෙනත් සේවා | 737,541 | 648,413 |
| මුද්‍රණය හා ප්‍රචාරණය යනාදිය | 1,012,722 | 873,650 |
| | **18,677,395** | **19,535,428** |

| සටහන - 19 | 2021 | 2020 |
|---|---|---|
| **වෙනත් පුනරාවර්තන වියදම්** | **රු.** | |
| ආරාධිත දේශන ගාස්තු | 790,500 | 1,635,825 |
| විශේෂ සේවා - අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා කමිටු රැස්වීම | 845,400 | 378,000 |
| වැඩමුළු, සම්මන්ත්‍රණ | 25,000 | 28,000 |
| බැංකු ගාස්තු | 166,700 | 2,450 |
| ව්‍යාපෘති පාඨමාලා වියදම් IARS | 444,269 | 126,855 |
| විනෝදාස්වාද වියදම් | 53,088 | 63,281 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | - | 18,105 |
| වෘත්තීය ගාස්තු | 540,939 | 261,435 |
| ගොවිපල හා ජල කළමණාකරන වියදම් | 1,242,762 | 369,871 |
| විභාග වියදම | 526,586 | 481,864 |
| සත්ව පාලනය | 1,852,687 | 1,394,431 |
| ණය පොළී | - | 12,000 |
| සේවක අර්ථ සාධක අරමුදල් අධිභාර | 847 | - |
| ජාත්‍යන්තර සම්මන්ත්‍රණ (Sympossium) වියදම් | - | 4,925 |
| වෙනත් | 398,230 | 618,651 |
| ලියාහල ණය ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන (RED) වැඩසටහන් | - | - |
| බැහැර කිරීමේදී පාඩුව | 3,826 | - |
| කඟ පර්යේෂණ සඳහා වියදම් | 42,550 | 80,000 |
| බිම්මල් නිශ්පාදන වියදම | - | 6,250 |
| Sympossium වියදම් | 87,954 | 47,823 |
| පුහුණු දීමනාව | 170,000 | 336,500 |
| ගොවිපල සංවර්ධනය | 571,073 | |
| විගණන ගාස්තු | 336,000 | |
| උපදේශන ගාස්තු | 123,551 | |
| වෙනත් | 689,906 | |
| | **8,911,868** | **5,866,266** |

| සටහන - 20 | 2021 | 2020 |
|---|---|---|
| මානව ප්‍රාග්ධන සංවර්ධන | රු. | |
| පර්යේෂණ දිරිගැන්වීම් | - | 82,250 |
| | - | **82,250** |

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE


මගේ අංකය
எனது இல.
My No. එච්එම්බී/බී/අයිඒආර්එස්/05/21/02(1)

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 අගෝස්තු 16 දින

අධ්‍යක්ෂ,
කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය

**කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 අභිතකර මතය

කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික සහ ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

**1.2 අභිතකර මතය සඳහා පදනම**

(අ) 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පාඨමාලා ගාස්තු නියමිත පරිදි හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයට අදාළ රු.7,790,020 ක පාඨමාලා ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වී නොතිබුණි. මෙම නිසා ඊට සමාන අගයකින් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ආ) 2021 දසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් යටතේ වූ දේපල පිරියත හා උපකරණ අයිතම 05 කට අදාළ ක්ෂය වියදම රු.2,403,244 ක් සහ ගොඩනැගිලි හා නිර්මිතයන් සංවර්ධනය කිරීමේ පිරිවැයට අදාළ ක්‍රමක්ෂය රු.998,835 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා වර්ෂයේ අතිරික්තය රු.3,402,046 ක් අඩුවෙන් දැක්වුණි.

(ඇ) 2021 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් වෘත්තීය තක්සේරුවක් මත ගණනය කිරීමේදී හඳුනාගෙන තිබුණු රු.1,915,792 ක ලාභය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 අනුව විස්තීරණ අදායම් ප්‍රකාශනයෙහි වෙනත් විස්තීරණ ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, ඊට පටහැනිව සංචිත යටතේ වෙනත් සංචිතයක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී, ගිණුම් විෂය 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කළ වටිනාකමත් ලෙජරය අනුව වටිනාකමත් අතර රු.74,293,890 ක වෙනසක්ද, ගිණුම් විෂයයන් 05 කට අදාළව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ දක්වා තිබුණු වටනාකම හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව ගැලපිය යුතු වටිනාකම අතර රු.9,415,448 ක වෙනසක්ද පැවති බව නිරීක්ෂණය විය. එසේ වුවද එම වෙනස්කම් පිළිබඳ අවශ්‍ය පැහැදිලි කිරීම් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබාදීමට බලාපොරොත්තු වන ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

ආයතනයේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

**2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා වෙත ලැබී නොමැති අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හා අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර, යම් ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීතිරීති/ විධානයන්ට යොමුව | නිරීක්ෂණය |
|---|---|
| (අ) 1988 අංක 74 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත | සෑම වසරකම මාර්තු 31 දිනට අදාළ තම වත්කම් හා බැරකම් ප්‍රකාශ ජූනි 30 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවද, ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් 11 දෙනෙකු විසින් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 (ආ), (ඇ) සහ 1646 | සමාලෝචිත වර්ෂයේදී ආයතනය සතු වාහන 02 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත කාල පරිච්ඡේදය තුළදී විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

**2.3 වෙනත් කරුණු**

(අ) 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී කෘෂි තාක්ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා බඳවා ගෙන තිබුණු ශිෂ්‍යයින් 1,391 කින් දැනට ඉගෙනුම ලබන ශිෂ්‍යයින් සංඛ්‍යාව 904 ක් වූයෙන් ශිෂ්‍යයින් 487 ක් පාඨමාලාව හැර ගොස් තිබුණු අතර එහි ප්‍රතිශතය සියයට 35 ක් විය. ඒ අනුව කාලීන වෙළඳපොළ අවශ්‍යතාවයන් හඳුනාගෙන ගැළපෙන පරිදි පාඨමාලාවන් යාවත්කාලීන කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට පැවති තනතුරු 12 කට අදාළව සේවක පුරප්පාඩු 23 ක් සම්පූර්ණ කර ගැනීමට අපොහොසත්වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී කෙසෙල් පැලයක් හා කෝමාරිකා පැලයක් නිෂ්පාදනය කිරීමේ පිරිවැය පිළිවෙලින් රු.164 ක් හා රු.72 ක් වුවද, පැලයක් පිළිවෙලින් රු.85 ක් හා රු.25 ක් බැගින් අලෙවි කිරීම නිසා පැලයක නිෂ්පාදන පාඩුව පිළිවෙලින් රු.79 ක් හා රු.47 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ පැල අලෙවියෙන් වූ මුළු පාඩුව රු.5,500,712 ක් විය.

ඩබ්ලිව්.සී.පී. වික්‍රමරත්න
විගණකාධිපති

**විගණකාධිපති වාර්තාව-2021 සඳහා පිලිතුරු**

**කොළඹ විශ්ව විද්‍යාලයීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය**

| වර්ෂය | ඡේද අංකය | විගණන නිරීක්ෂණය | විගණන නිරීක්ෂණයට ලබා දුන් පිළිතුරු |
|---|---|---|---|
| **2021** | **1.2** | **අහිතකර මතය සඳහා පදනම** | |
| | **(අ)** | 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පාඨමාලා ගාස්තු නියමිත පරිදි හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයට අදාළ රු.7,790,020 ක පාඨමාලා ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වී නොතිබුණි.මෙම නිසා ඊට සමාන අගයකින් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | පාඨමාලා ගාස්තු එකතු කිරීම සඳහා ආයතනය සතුව වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන යන අතර සියලුම ශිෂ්‍ය ගාස්තු එම ගිණුමට බැර වේ.<br><br>ශිෂ්‍යයන් විසින් කරනු ලබන සෘජු තැන්පතු බැංකු පත්‍රිකා මගින් හඳුනාගනු ලැබේ. එලෙස හඳුනා ගත නොහැකි තැන්පතු බැංකු සැසඳුම් ප්‍රකාශය මගින් හඳුනා ගනු ලැබේ. එම නිසා ශිෂ්‍යයන් විසින් ගෙවීම් කරනු ලැබුවද එවැනි තැම්පතු ශිෂ්‍යයන්ගේ ලැබිය යුතු අගයන් ලෙස වාර්තා වේ. කොරෝන වසංගත තත්වයත් සමඟ රට තුල ඇතිවූ ව්‍යසනකාරී සමාජීය සහ ආර්ථික වටපිටාව මත බැංකු පත්‍රිකා ආයතනය වෙත ලබාදීමට නොහැකි වීම හේතුකොට විශාල ප්‍රමාණයක් එලෙස ලැබිය යුතු ලෙස සටහන් විය. එම මුදල් වර්ෂය අවසානයේදී රිසිට් පතක් මගින් ආයතනයේ පොත් වලට ඇතුලත් කල අතර එලෙස මුදල් ලැබී තිබියදී ලැබිය යුතු ලෙස සටහන් කිරීමෙන් යථාර්ථවාදී නොවන ආදායම් ප්‍රමාණයක් සටහන් වනු ඇත.<br><br>**අධ්‍යයන වාරය ලියාපදිංචි නොකිරීම**<br><br>දැනට ආයතනය තුල **2022** අධ්‍යයන වාරය ලියාපදිංචි කිරීම සම්බන්දයෙන් කටයුතු කරන අතර **2021** වර්ෂයේ එම තොරතුරු නොලැබීම නිසා නිවැරදි ශිෂ්‍ය සංඛ්‍යාව හා ඔවුන්ගේ තොරතුරු නොමැතිව නිවැරදි උපචිත තීරණය කළ නොහැකි වීම.<br><br>**පාඨමාලාව හැර යන තිබූ ප්‍රතිශතය**<br><br>පාඨමාලාව හැර යන තිබූ අතර එහි ප්‍රතිශතය **50%** ආසන්න වන අතර එවැනි තත්වයක් තුළ යථාර්තවාදී අගයන් නිර්ණය කල නොහැකි වීම. |
| | **(ආ)** | 2021 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් යටතේ වූ දේපළ පිරියත හා උපකරණ අයිතම 05 කට අදාළ ක්ෂය වියදම රු.2,403,244 ක් සහ ගොඩනැගිලි හා නිර්මිතයන් සංවර්ධන කිරීමේ පිරිවැයට අදාළ ක්‍රමක්ෂය රු.998,835 ක් වැඩියෙන් මූල්‍ය | ගොඩනැගිලි, ගොඩනැගිලි සංවර්ධනය කිරීම සඳහා වර්ෂය තුල ගෙවීම් සිදු කලද එම ව්‍යාපෘතීන් 2021.01.01 දින සිට පාවිච්චියට සුදුසු තත්වයේ පැවති බැවින් මුළු වර්ෂයටම ක්ෂය කර ඇති අතර රු. 15,028,428 සහ 2,824,409 වාර්තා කොට ඇත. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රකාශනවල දක්වා තිබුණි.මෙම නිසා වර්ෂයේ අතිරික්තය රු.3,402,046 ක් අඩුවෙන් දැක්වුණි. | දේපළ පිරියත හා උපකරණ සටහන තුළ දැනට පවත්වාගෙන ආ ක්ෂය ප්‍රතිපත්තියට අනුව ප්‍රතිශතය නිවැරදිව දක්වා ඇති අතර කාර්යාල උපකරණ, ලී බඩු හා උපකරණ සහ මෘදුකාංග සම්බන්දයෙන් නිවැරදිව ක්ෂය ගණනය කර ඇත. හෙළිදරව් කිරීම්වලදී ඵලදායි ජීවකාලය වැරදි අවුරුදු ගණනක් සටහන් වීම නිසා මෙම අගයන් පෙන්නුම් කරයි.<br><br>2022 වර්ෂයේ හෙළිදරව් කිරීම් නිවැරදිව දක්වනු ලැබේ. |
| | **(ඇ)** | 2021 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් වෘත්තිය තක්සේරුවක් මත ගණනය කිරීමේදී හඳුනාගෙන තිබුණු රු.1,915,792 ක ලාභය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19 අනුව විස්තිර්ණ ආදායම් ප්‍රකාශනයෙහි වෙනත් විස්තිර්ණ ආදායමක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද, ඊට පටහැනිව සංචිත යටතේ වෙනත් සංචිතයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 අනුව Statement of Financial Performance නිවැරදි රාමුවට ඉදිරිපත් කර ඇත. ඒ අනුව විස්තිරණ අදායම් ප්‍රකාශය අභ්‍යන්තර විගණකගේද උපදෙස් පරිදි ඉවත් කල අතර දෙසැම්බර් 31 දිනට පාරිතෝෂිකය, වෘත්තීය තක්සේරුවක් මත ගණනය කිරීමේදී හඳුනාගත් රු. 1,915,792 ක ලාභය නිවැරදි ආකාරයෙන් ගිණුම් ගත කර Statement of Changes in Equity හි වෙනත් සංචිත (Other Reserves) යටතේ පෙන්වා ඇත. 2022 වර්ෂයේදී සමුච්චිත ලාභයට එකතු කරනු ලැබේ. |
| | **(ඈ)** | සමාලෝචිත වර්ෂයේදී, ගිණුම් විෂය 03 කට අදාළව මුල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කළ වටිනාකමක් ලෙජරය අනුව වටිනාකමත් අතර රු.74,293,890 ක වෙනසක්ද, ගිණුම් විෂයයන් 05 කට අදාළව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ දක්වා තිබුණු වටිනාකම හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 ප්‍රකාරව ගැලපිය යුතු වටිනාකම අතර රු.9,415,455 ක වෙනසක් පැවති බව නිරීක්ෂණය විය.එසේ වුවද එම වෙනස්කම් පිළිබඳ අවශ්‍ය පැහැදිලි කිරීම් විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. | හානිකරණය නිවැරදිව 2022 මුල්ය වර්ෂයට ඉදිරිපත් කරනු ඇත. |
| | **2.** | **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව** | |
| | **2.2.2** | **නීති රීති,/විධිවිධාන්ට යොමුව**<br>**----------** | |
| | **(අ)** | **1988 අංක 74 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත**<br><br>සෑම වසරකම මාර්තු 31 දිනට අදාළ තම වත්කම් හා බැරකම් ප්‍රකාශ ජුනි 30 දිනට පෙර ඉදිරිපත් කළ යුතු වුවද, ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් 11 දෙනෙකු විසින් 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වත්කම් බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. | ආයතනයේ මාණ්ඩලික නිලධාරීන්ගේ 2022 මාර්තු 31 දිනට අදාළ වත්කම් හා බැරකම් ප්‍රකාශ ජුනි 30 දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. කෙසේ වෙතත් එකී මාණ්ඩලික නිලධාරීන් 11 දෙනාගෙන් 02 ක් පමණක් 2014 වර්ෂයේ සිට මෙම ආයතනයේ සේවා නියුක්තව සිටින අතර සෙසු නිලධාරීන් මෑතකාලීනව බඳවා ගත් අය වේ. |

| | | | |
|---|---|---|---|
| | (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 1645 (අ), (ඇ) සහ 1646**<br><br>සමාලෝචිත වර්ෂයේදී ආයතනය සතු වාහන 02ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ නියමිත කාල පරිච්ඡේදය තුළදී විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ නොවෙමි.<br><br>2021 වර්ෂයට අදාල ආයතනය සතු සියලුම වාහන වල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය වෙත ඉදිරිපත් කර ඇත. |
| | **2.3** | **වෙනත් කරුණු** | |
| | (අ) | 2017 වර්ෂයේ සිය සමාලෝචිත වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී කෘෂි තාක්ෂණවේදී උපාධි පාඨමාලාව සඳහා බඳවා ගෙන තිබුණු ශිෂ්‍යයන් 1,391 කින් දැනට ඉගෙනුම ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව 904 ක් වුයෙන් ශිෂ්‍යයන් 487 ක් පාඨමාලාව හැර ගොස් තිබුණු අතර එහි ප්‍රතිශතය සියයට 35 ක් විය.ඒ අනුව කාලීන වෙළඳපොළ අවශ්‍යතාවයන් හඳුනාගෙන ගැළපෙන පරිදි පාඨමාලාවන් යාවත්කාලීන කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | පාඨමාලාව අතහැර යාමට බලපාන කරුණු අතර පාඨමාලා ගාස්තු ගෙවීමට නොහැකි වීම ප්‍රධාන ලෙස බලපාන කරුණක් වන අතර පාඨමාලාව 2017 වසරේදී යාවත්කාලීන කර ඇති අතර නැවත එය යාවත්කාලීන කිරීම සඳහා මේ වන විට කටයුතු ආරම්භ කර ඇත. |
| | (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට පැවති තනතුරු 12 කට අදාළව සේවක පුරප්පාඩු 23ක් සම්පූර්ණ කර ගැනීමට අපොහොසත්වී තිබුණි. | ඔබගේ නිරීක්ෂණයන් සමඟ එකඟ නොවෙමි.<br>සේවක පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අදාල කටයුතු ආයතනය විසින් සිදු කළ ද රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස සියලු බඳවා ගැනීම් අත්හිටුවීම හේතුවෙන් එකී පුරප්පාඩු පිරවීමට ආයතනයට නොහැකි වී ඇත. |
| | (ඇ) | සමාලෝචිත වර්ෂයේදී කෙසෙල් පැලයක් හා කෝමාරිකා පැලයක් නිෂ්පාදනය කිරීමේ පිරිවැය පිළිවෙලින් රු.164 ක් සහ රු.72 ක් වුවද, පැලයක් පිළිවෙලින් රු.85 ක් හා රු.25 ක් බැගින් අලෙවි කිරීම නිසා පැලයක නිෂ්පාදන පාඩුව පිළිවෙලින් රු.79 ක් හා රු.47 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ පැල අලෙවියෙන් වූ මුලු පාඩුව රු.5,500,712 ක් විය. | 2021 වර්ෂය සඳහා සමස්ථ කෙසෙල් පැළ නිෂ්පාදනය 109,149 ක් වූ අතර එය මාසිකව පැළ නිෂ්පාදනය 9096 ක සාමාන්‍යයක් වේ. එසේම වර්ෂය තුළ පැවති කොවිඩ් උවදුර වැනි තත්ත්වයන් හේතුවෙන් පැළ නිෂ්පාදනය හා පැළ අලෙවිය සැලකිය යුතු මට්ටමින් අඩු වී තිබුණි. එබැවින් පැළයක නිෂ්පාදන වියදම වැඩි අගයක් ලෙස සටහන් වී ඇත. මේ අනුව 2022 වර්ෂය සඳහා මාසික පැළ නිෂ්පාදනය 16,000 ක සාමාන්‍යයක් ලෙස පවත්වා ගෙන යාමට සැලසුම් කර ඇති අතර, ඒ තුළින් නිෂ්පාදන වියදම සැලකිය යුතු ලෙස අඩුකර ගැනීමට හැකිවේ. එසේම කෙසෙල් පැළයක විකුණුම් මිළ ද ඉහළ නැංවීම සඳහා අවශ්‍ය මූලික ක්ෂේත්‍ර අධ්‍යයන දත්තයන් පිළිබඳ අවධානය යොමු වී ඇත.<br>තවද කොරෝනා වසංගත තත්වය තුළ සංචරණ සීමා හා සැපයුම් සීමා හේතුවෙන් සේවක පැමිණීම අඩු වූ අතර නිෂ්පාදනය සීමා විය.නමුත් වැටුප් හා වේතන අඛණ්ඩව ගෙවීම හේතුවෙන් පිරිවැය ක්‍රමිකව වැඩිවිය.එම නිසා පැලයක පිරිවැය විකුණුම් මිලට වඩා වැඩි අගයක් පෙන්නුම් කරනු ලබයි. |